# 3. කෘෂිකර්මය, ධීවර සහ වන සම්පත්

## 3.1 නිෂ්පාදන උපනති

රසාන දිග මෝසම් සහ අන්තර් මෝසම් වැසි නිසිකල නොලැබීම හේතුවෙන්, 1995 වර්ෂයේ අවසාන කාර්තුවේදී ඇරඹුණ නියගය 1996 වර්ෂයේ මැද භාගය දක්වා පැවතුණි. එය දේශිය කෘෂිකාර්මික නිමැවුම සහ වැවිලි අංශයේ පොල් වගාව කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපෑම් ඇතිකරන ලදී. 1995 වර්ෂයේ පැවති වාර්තාගත නිෂ්පාදනයෙන් පසුව, තේ නිෂ්පාදනය තව දුරටත් සියයට 5 කින් වැඩි වු අතර කොළඹ තේ වෙන්දේසියේ තේ මිල ගණන් සියයට 44 කින් වාර්තාගත ලෙස ඉහළ නැගුණි. රබර් නිෂ්පාදනය සියයට 6 ක වැඩිවීමක් වාර්තා කරන ලදී. කෙසේ වුවත්, පොල් නිෂ්පාදනය සියයට 8 කින් පහත වැටුණි. වී නිෂ්පාදනය සියයට 27 කින් පහත වැටුණු අතර මිළ ගණන් සියයට 31 කින් වැඩි වුණි. සීනි නිෂ්පාදනයෙහි සියයට 3 ක වැඩිවීමක් දක්නට ලැබුණි. අර්තාපල්, කව්පි සහ මුං ඇට ඉහළ නිමැවුම් මට්ටම් දැක්වූ අතර, අනෙකුත් සමහර බෝගයන්හි නිෂ්පාදනය අඩු වූ හෙයින් අනෙකුත් ක්ෂේත්‍ර භෝග අංශයෙහි මිශ්‍ර ක්‍රියාකාරීත්වයක් පෙන්විය. ජලජීවී මත්ස්‍ය නිෂ්පාදනයෙහි වැඩිවීමක් දක්කට ලැබුණ ද මුහුදු ධීවර අංශයේ මත්ස්‍ය නිෂ්පාදනය අඩුවීම නිසා මුළු මත්ස්‍ය නිෂ්පාදනය සියයට 4 කින් පහත වැටුණි. බොහොමයක් බෝගයන්හි නිෂ්පාදන මට්ටම් වර්ෂයේ අගභාගය වන විට යථා තත්ත්වයට පත් වුවද 1996 වර්ෂයේ සමස්ථ කෘෂිකාර්මික නිෂ්පාදනයන්හි නිමැවුම සියයට 5 කින් පහත වැටුණි.

**3.1 සංඛ්‍යා සටහන**

**ප්‍රධාන කෘෂිකාර්මික නිෂ්පාදන සහ මිල වෙනස්වීම්**

| අයිතමය | ඒකකය | නිෂ්පාදනය | | 1996 වෙනස්වීමේ ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|
| | | 1995 | 1996 | නිෂ්පාදනය | මිල |
| තේ | කි.ග්‍රෑ. දශලක්ෂ | 246 | 258 | 5 | 44 |
| රබර් | කි.ග්‍රෑ. දශලක්ෂ | 106 | 112 | 6 | -6 |
| පොල් | ගෙඩි දශලක්ෂ | 2,755 | 2,546 | -8 | 73 |
| වී | මෙ.ටො. දහස් | 2,810 | 2061 | -27 | 31 |
| සීනි | මෙ.ටො. දහස් | 71 | 73 | 3 | 4 |
| මත්ස්‍ය | මෙ.ටො. දහස් | 238 | 229 | -4 | 6 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

## 3.2 කෘෂිකාර්මික ප්‍රතිපත්ති

වැවිලි අංශය තුළ පෞද්ගලික අංශයේ සහභාගිත්වය තුළින්, රාජ්‍ය අයිතිය ඇති ප්‍රාදේශිය වැවිලි සමාගම්වල කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමට රජය විසින් ස්ථිරසාර කැපවීමකින් යුතුව කටයුතු කළේය. 1992 සිට බලපැවැත්වෙන පරිදි අවුරුදු 53 ක් සඳහා ඉඩම් දීගුකාලීනව බදුදීම මගින් පූර්ණ ප්‍රතිලාභ මෙන්ම කළමනාකරණයෙහි අවදානම පෞද්ගලික අංශයට පැවරීම රජයේ ප්‍රතිපත්තිය විය. 1995 වර්ෂයේදී, ලාභ ලබන ප්‍රාදේශිය වැවිලි කළමනාකරණ සමාගම් හයක මුළු ප්‍රාග්ධනයෙන් සියයට 51 ක ප්‍රමාණයක් එම සමාගම්වල කළමනාකරණ සමාගම්වලට අලෙවි කරන ලදී. කොටස් වලින් සියයට 20 ක් මහජනතාවට ඉදිරිපත් කරන ලද අතර එයින් සියයට 12 ක්, සමාගමට අයිති සියයට 51 කොටස් ප්‍රමාණයේ වෙළෙඳ පොළ මිළ ගණන් ස්ථාපිත කිරීම පිණිස ටෙන්ඩර් පදනම මත ලබාදෙන ලදී. වටවල, මඩුල්සිම, මස්කෙළිය සහ ආගරපතන යන පාඩු ලබන ප්‍රාදේශිය වැවිලි කළමනාකරණ සමාගම් 4 හි සියයට 51 ක කොටස් ප්‍රමාණයක්, 1995 දෙසැම්බර් මාසයේදී "සියල්ලම හෝ කිසිවක් නැත" යන පදනම මත කොළඹ කොටස් වෙළඳපොළ මගින් ඉහළම ගැනුම්කරුවන් වෙත ඉදිරිපත් කරන ලදී. එම අලෙවිය 1996 වසර තුළ සම්පූර්ණ කරන ලදී. තේ මිළ ගණන්වල උත්පාතයක් පැවති නිසා කොටස්වල මිල ගණන් කොටසක අවම ස්ථාවර මිල වූ රුපියල් 10.00 ට වඩා ඉහළ මට්ටමක පැවතුණි. 1996 වර්ෂයේ දෙවන භාගයේදී බලංගොඩ, හපුගස්තැන්න සහ උඩපුස්සැල්ලාව නම් වූ තවත් ප්‍රාදේශිය වැවිලි කළමනාකරණ සමාගම් 3 ක කොටස් වලින් සියයට 51 ක්, තවදුරටත් කොටස්වල මිල ගණන් ඉහළ නංවමින් කොළඹ කොටස් වෙළෙඳපොළේ අලෙවි කරන ලදී. කොටගල වැවිලි සමාගමේ හිමිකාරීත්වය පෞද්ගලීකරණයෙන් පසු තෙවරක්ම වෙනස් විය. වතු වගාව කෙරෙහි නියමාකාර උනන්දුවක් දක්වන සුදුසු ගැනුම්කරුවන්ට අනාගතයේදී ඒවා විකිණීම සහතික කරනු පිණිස රජය විසින් අනාගත ගැනුම්කරුවන් සඳහා පූර්ව සුදුසුකම් නිර්ණායකයන් සකස් කර ඇත. පසුගිය වසර 5 සඳහා වූ සතුටුදායක මූල්‍යමය වාර්තා, වැවිලි සමාගම් කළමනාකරණය පිළිබඳ වූ පෙර පළපුරුද්ද, හෝ ඔවුන් මිලදී ගැනීමට අදහස් කරන වතු වගාවන්හි දීගු කාලීන යහපත සහතික කරන, අවශ්‍ය හැකියාවන් ඇති පිරිස් ලබා ගැනීමේ හැකියාව සහ කළමනාකරණ, කෘෂි හා තාක්ෂණික විශේෂඥයින් ලබා ගැනීමේ හැකියාව මෙම නිර්ණායකයන්ට ඇතුළත් වේ.

1995 වර්ෂයේ අවසාන කාර්තුවේ පැවති නියගකාරී තත්ත්වය සහ සහල් නිෂ්පාදනය කෙරෙහි එහි අහිතකර බලපෑම මෙන්ම 1996 වර්ෂයේ යල කන්නය සඳහා ඇස්තමේන්තු කළ අස්වැන්න ද සැලකිල්ලට ගෙන, කෘෂිකර්ම, ඉඩම් හා වන සම්පත් අමාත්‍යංශය, 1996 වර්ෂයේ සහල් නිෂ්පාදනයේ හිගය මෙට්‍රික් ටොන් 500,000 සිට 600,000 දක්වා පමණ විය හැකි බවට කලින් පුරෝකථනය කරන ලදී. මේ අනුව ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව, මෙම හිගය පිළිබඳ ආනයනකරුවන් දැනුවත් කරවූ අතර, සහල් ආනයනය පිළිබඳ කටයුතු ගැන විමසිලිමත් විය. සහල්වල ජාත්‍යන්තර මිල ගණන් ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් 1996 වර්ෂයේ ප්‍රථම කාර්තුවේදී සහල් ආනයනය පහත් මට්ටමක පැවතුණි. මේ හේතුවෙන් සහල් ආනයනය මත වූ සියයට 35 තීරු ගාස්තු 1996 අප්‍රේල් මාසයේ සිට ඉවත් කරන ලද අතර, ඔක්තෝබර් මාසය දක්වා මාස 6 ක කාලයක් සඳහා තීරු ගාස්තු වලින් නිදහස්ව සහල් ආනයනයට ඉඩ හරින ලදී. මෙම තීරු බදු නිදහස් කිරීම් 1996 දෙසැම්බර් මාසය දක්වා පසුව දීර්ඝ කරන ලදී. 1996 වර්ෂය තුළදී සාමාන්‍යයෙන් ආනයන කරන ප්‍රමාණයට වඩා ඉතා වැඩි වී ප්‍රමාණයක් ද ආනයනය කරන ලදී. මේ නිසා 1994 ජනවාරි මස නිදහස්කරණය කරන ලද වී ආනයන කෘෂිකර්ම, ඉඩම් හා වන සම්පත් අමාත්‍යාංශයේ මූලාශ්‍රයන්ට අනුව දේශිය නිෂ්පාදකයන් ආරක්ෂා කිරීමේ අරමුණෙන් මෙන්ම නව කෘමීන් හා රෝග, බීජ වී වලට ඇතුළු වීම වළක්වාලීම සඳහා, 1996 අගෝස්තු මාසයේ 30 වන දින සිට වී ආනයනය බලපත්‍ර ක්‍රමය යටතට ගෙන එන ලදී. තිරිඟු ඇට සහ ධාන්‍ය ආනයනය මෙන්ම බඩ ඉරිඟු ආනයනද බලපත්‍ර අවශ්‍යතාවය යටතේ දිගටම පවත්වාගෙන යන ලදී.

මිරිස්, ළූණු (සම්පූර්ණයෙන් තහනම් කරන ලද රතුළූණු හැර) සහ අර්තාපල් සඳහා ආනයන ප්‍රතිපත්තිය, දේශිය නිෂ්පාදනය සහ කෘෂිකර්ම, ඉඩම් හා වන සම්පත් අමාත්‍යංශයේ උපදෙස් මත පදනම් වූ බලපත්‍ර ක්‍රමයක් යටතේ පැවතුණි. 1996 යල බෝගයන්හි අස්වැන්න නෙලන කාලය ළගාවත්ම මෙම ප්‍රතිපත්තිය 1996 ජුලි මාසයේ සිට අත්හැර දමන ලදී. මිරිස්, ළූණු (රතු ළූණු ඇතුලුව) සහ අර්තාපල් ආනයනය නිදහස්කරණය කරන ලදී. මෙයට අමතරව, මෙම ආනයන සඳහා වූ සියයට 20 පිරිවැටුම් බදු සීමාව ඉවත් කරන ලදී. එසේ වුවත්, තීරු බද්ද සියයට 35 ක් වශයෙන්ම පැවතුණි. (බීජ අර්තාපල් සඳහා ආනයන තීරු ගාස්තු සියයට 10 ක් විය). මෙම වෙනස්වීම,

මෙම ද්‍රව්‍යයන්හි ආනයනයන් ඉහළ යාමට මගපෑදූ අතර ඒ හේතුවෙන් විශේෂයෙන් අර්තාපල් සහ ළූණු මිල ගණන් විශාල වශයෙන් පහත වැටුණි. මිල ගණන් තවදුරටත් පහත දැම්මේ අරමුණෙන් හා 1996 දෙසැම්බර් මුල් භාගයේදී කාලීනව ඇතිවන වැඩි ඉල්ලුමට මුහුණදීම සඳහා මිරිස්, ළූණු හා අර්තාපල් සඳහා වූ බදු සියයට 35 සිට සියයට 20 දක්වා අඩු කරන ලදී. මෙය 1997 ජනවාරි අග දක්වා ක්‍රියාත්මක විය. මෙම ප්‍රතිපත්ති පාරිභෝගිකයන්ට ක්ෂණිකවම උපකාරී විය. මෙම ප්‍රතිපත්ති කෘෂිකාර්මික ආරක්ෂණය අඩු කිරීමට ගත් ඉදිරි පියවරක් විමත්, ආනයන තරගකාරිත්වය සඳහා කෘෂිකාර්මික අංශය විවෘත කිරීම තුළින් එහි කාර්යක්ෂමතාවය වැඩි කිරීමට හේතුවන නිසාත්, මෙම ප්‍රතිපත්තිය ආපසු වෙනස් කිරීම සුදුසු නොවේ. මේ අතර, සමුපකාර තොග වෙළඳ සංස්ථාව (ස.තො.ස.), 1996 යල අස්වැන්නෙන් මිලදී ගත් වියළි මිරිස් තොග, වෙළෙඳපොළ මිල ගණන් සැලකිය යුතු ලෙස පහත වැටීම හේතුවෙන් වර්ෂය අවසානයේදී අලෙවි කර ගැනීමට නොහැකි විය. ස.තො.ස. එහි වාණිජමය ශක්‍යතාවයට අහිතකර ලෙස බලපාන තරගකාරී නොවන මිල ගණන්වලට භාණ්ඩ තොග රැස්කිරීම දූරදර්ශී ක්‍රියාවක් නොවේ.

වර්ෂය අවසාන වනවිට, මිරිස්, ළූණු සහ අර්තාපල් සම්බන්ධයෙන් ප්‍රතිපත්තිය වූයේ තීරුබදු ගැලපුම් සමග ආනයන නිදහස් කිරීමයි. ගොවියාට තම පිරිවැය ආපසු ලබාගත් පසු සාධාරණ ලාභයක් ඉපයිය හැකි මිලක් මෙන්ම ජාත්‍යන්තර මිල ගණන් සහ අනෙකුත් වෙළෙඳ, සමාජ හා ආර්ථික කරුණු යන දෑ මෙහිදී පදනම් කරගනු ඇත. තීරු බදු පිළිබඳ අනු කමිටුව මෙම භාණ්ඩ පිළිබඳ තත්ත්වය, නිරතුරු විමසුමට ලක් කරන අතර තීරුබදු ගැලපුම් සඳහා නිර්දේශ කරනු ඇත. වෙළෙඳපොළ කෙරෙහි අනවශ්‍ය මැදිහත්වීම් වලින් තොරවූ, ගොවියනට මෙන්ම ආනයනකරුවන්ට සහ බෙදාහරින්නන්ට කෘෂිකාර්මික අංශයේ සහ ඒ හා සම්බන්ධ කටයුතුවල ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා නිවැරදි මෙන්ම ස්ථාවර සංඥා ලබාදෙන ස්ථිර ප්‍රතිපත්තියක් පැවතීම ඉතා වැදගත් වේ.

පෞද්ගලික අංශයේ සහභාගිත්වය ඇතිව බීජ නිපදවීම සහ වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම සඳහා බීජ නිෂ්පාදනායතන ගොඩනැගීමේ අරමුණෙන්, 1996 වර්ෂයේදී බීජ හා රෝපණ ද්‍රව්‍ය ප්‍රතිපත්තියක් අනුමත කරන ලදී. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ඇතුළුව රජයේ නියෝජිතායතන මෙම නිෂ්පාදනායතන සඳහා අවශ්‍ය සහය ලබාදෙන අතර ඒ මගින් ඉහළ තත්ත්වයකින් යුත් බීජ නිෂ්පාදනය සහතික කෙරෙනු ඇත. පෞද්ගලික අංශයේ සහභාගිත්වය ඇතිව කෘෂිකර්ම, ඉඩම් හා වන සම්පත් අමාත්‍යාංශය යටතේ පිහිටුවනු ලැබූ ජාතික බීජ හා රෝපණ ද්‍රව්‍ය කමිටුව, බීජ නිෂ්පාදන කර්මාන්තයේ ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනැයි අපේක්ෂා කෙරේ. මෙහිලා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර ඇති අතර එය ජාතික බීජ හා රෝපණ ද්‍රව්‍ය කමිටුව විසින් පිළිගෙන ඇත.

කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය මගින්, වී, අනෙකුත් ක්ෂේත්‍ර බෝග, බුලත් සහ උක් මෙන්ම පශු සම්පත් සඳහා රක්ෂණ යෝජනා ක්‍රමයන් 1996 වර්ෂයේදී ද නොකඩවා ලබාගත හැකි විය. මීට අමතරව ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය හා ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය ද කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය මගින් ලබාගත හැකි විය. 1996 වර්ෂයේදී, මෙම විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයන් යටතට ගොවීන් 45,400 ක් පමණ සහ ධීවරයන් 2,870 ක් පමණ බඳවා ගෙන ඇත. වගා රක්ෂණයේ දක්නට ලැබුණු වැදගත් වර්ධනයක් වූයේ පෞද්ගලික අංශයේ එක් රක්ෂණ සමාගමක සහභාගිත්වයයි. කෙසේ වෙතත් පෞද්ගලික අංශයේ රක්ෂණ සහතික, වගා ණය සඳහා ඇප සහතිකයන් වශයෙන් පිළිගැනීමට රාජ්‍ය බැංකු දෙකට නොහැකිවීම හේතුවෙන් බොහෝ දුරට මෙම සමාගමේ ක්‍රියාකාරකම් සීමිත විය. 1973 අංක 27 දරණ කෘෂිකර්ම රක්ෂණ මණ්ඩල පනතේ විධිවිධානවලට අනුව, රාජ්‍ය බැංකු දෙකට කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලයේ බෝග රක්ෂණ ආවරණ පමණක් ලබා ගැනීමට සිදු වී ඇත. වගා හානියක් ඇති වූ අවස්ථාවක, වගා රක්ෂණයක් පැවතීම ප්‍රයෝජනවත් වන හෙයින්, කෘෂිකාර්මික රක්ෂණයන් පුළුල් කිරීමේදී පෞද්ගලික අංශයේ සහභාගිත්වය අවශ්‍ය වනු ඇත. මේ හේතුවෙන් කෘෂිකර්ම රක්ෂණ මණ්ඩල පනත සංශෝධනය කිරීම අවශ්‍ය වේ.

ගොවිජන සේවා පනත යටතේ ගොඩ නගන ලද ගොවි සංවිධානවල ප්‍රතිලාභ ලබා ගැනීමට ඉඩකඩ සලසාලමින්,කෘෂිකර්ම, ඉඩම් සහ වන සම්පත් අමාත්‍යාංශයේ නව ප්‍රතිපත්තිය යටතේ ඒවා නැවත සකස් කරන ලදී. 1996 වර්ෂය අවසානය වනවිට ග්‍රාම සේවා බල ප්‍රදේශ 12,634 ක පිහිටුවන ලද මුළු ගොවි සංවිධාන සංඛ්‍යාව 12,937 ක් විය. මෙම ගොවි සංවිධාන පසුව ගොවි සමාගම් බවට වර්ධනය කිරීමට බලාපොරොත්තු වේ. මෙම සංවිධානයන් රජයේ නිලධාරීන් සමග එක්ව "ගොවි ජන කේන්ද්‍රයන්" (නිෂ්පාදන සේවා මධ්‍යස්ථාන) ලෙස නැවත නම් කරන ලද ගොවිජන සේවා මධ්‍යස්ථාන මෙහෙයවීම සහ පාලනය කිරීම කරනු ලැබේ. "ගොවි ජන කේන්ද්‍ර" 541 ක් ඇති අතර සියළුම කෘෂිකාර්මික වැඩ පිළිවෙලවල් හා ජාතික වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය වැනි විශේෂ ව්‍යාපෘති මෙම මධ්‍යස්ථාන මගින් ක්‍රියාත්මක කරනු ලැබේ.

වසර 2005 දී ලෝක ආහාර හිඟයක් ඇතිවනු ඇතැයි ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය මගින් කර ඇති පුරෝකථනයට ප්‍රතිචාර දැක්වීමක් වශයෙන් කෘෂිකර්ම, ඉඩම් සහ වන සම්පත් අමාත්‍යාංශය 1996 දෙසැම්බර් මාසයේදී "වගා ලංකා" නමින් හඳුන්වනු ලැබූ දීප ව්‍යාප්ත වගා සංග්‍රාමයක් දියත් කරන ලදී. ගොවීන්ගේ අවශ්‍යතාවයන්ට හා පාරිභෝගික ඉල්ලුමට සුදුසු වන අයුරින් කෘෂිකර්මයේ නූතන සහ සම්ප්‍රදායික ක්‍රම, ඒකාබද්ධ කිරීමට මෙයින් බලාපොරොත්තු වේ. යැපුම් කෘෂිකර්මය වාණිජකරණය කිරීම, වර්ෂය පුරා වගා කටයුතු කිරීම සඳහා ඒකාබද්ධ වගා තාක්ෂණ ක්‍රම යොදා ගැනීම, ගොවීන්ට ප්‍රමාණවත් කේවල් කිරීමේ බලයක් ලබා ගැනීමට හැකියාව ඇති කිරීම සහ උගත් තරුණයන්ට ආකර්ෂණීය මෙන්ම උදාර වෘත්තියක් බවට කෘෂිකර්මය පත් කිරීමද මීට ඇතුළත් වේ. කෘෂිකාර්මික නිෂ්පාදිත අලෙවිය, ප්‍රවාහනය සහ බෙදා හැරීම සඳහා ගොවි සමාගම් පිහිටවනු ඇත. මෙහිදී ඉහළ ඵලදාවක් ලබාදෙන බීජ ලබාගැනීම සඳහා වන පර්යේෂණ සහ නූතන වගා තාක්ෂණික ක්‍රම කෙරෙහි අවධානයක් යොමු කරනු ඇත.

දේශීය කෘෂිකාර්මික අංශයේ කටයුතුවල දී රජයේ සෘජු සහභාගිත්වයකට උපදෙස් නොදෙන අතර, විශේෂයෙන්ම කෘෂිද්‍රව්‍ය සකස් කිරීම, ක්ෂේත්‍ර බෝග ඇසුරුම් කිරීම සහ ඒ සම්බන්ධ ක්‍රියා, අභිජනනය කරන ලද බීජ වැඩිදියුණු කිරීම සහ වෙළෙඳපළ සංවර්ධනය යන අංශවල සංවර්ධනය මෙන්ම පර්යේෂණ කටයුතු වැඩිදියුණු කිරීමට පියවර ගැනීම, මගින් රජයට කෘෂිකාර්මික අංශයට උපකාර විය හැකිය. මිරිස්, අර්තාපල් හා ළූණු ආනයනය සඳහා වූ ආනයන බලපත්‍ර 1996 දී ඉවත්කිරීම නිසි මගට පිවිසීමේ පියවරක් වුවද, එය ශීඝ්‍රයෙන් ඉහළ නැගුනු මිල ගණන් වලින් පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා වූ කඩිනම් ප්‍රතිචාරයක් වශයෙන්

සිදුවිය. කෘෂිකර්මික නිෂ්පාදිත සඳහා ස්ථිර, ඉතා පැහැදිලි හා නිදහස් වෙළඳ ප්‍රතිපත්තියක් පැවතීම මගින් කෘෂිකාර්මික නිෂ්පාදිත, යෙදවුම් වෙළෙඳපොළ මෙන්ම ගබඩා හා ගබඩා කිරීමේ පහසුකම් සංවර්ධනය කිරීම සඳහා පෞද්ගලික අංශයට ප්‍රබල කාර්යභාරයක් කිරීමට උපකාරී වන වාතාරවණයක් ගොඩ නැගෙනු ඇත.

පොහොර සහනාධාරයද තවත් එවැනි විශේෂ අවධානය යොමු විය යුතු අංශයකි. ලාභදායී මිල ගණන් ලබන තේ වගා අංශය සඳහා පොහොර සහනාධාරයේ පැවතීම ප්‍රශ්නයක් වන අතර පොහොර සහනාධාර යෝජනා ක්‍රමය තුළින් ආධාර ලබාදීම අවශ්‍ය යයි හැගෙන ගොවීන් හඳුනාගෙන ඔවුනට එය ලැබෙන පරිදි ක්‍රමයෙන් පොහොර සහනාධාරය ඉවත් කිරීම අවශ්‍ය වේ. රජය විසින් පොහොර ආනයනකරුවන්ට සහනාධාර පියවීමේ දී ප්‍රමාදයන් දිගින් දිගටම සිදුවිය.

## 3.3 අපනයන බෝග

### තේ

නොකඩවා තුන්වන වසරටත් තේ නිෂ්පාදනයේ වැඩිවීමක් පෙන්නුම් කළ අතර 1996 වර්ෂයේ තේ නිෂ්පාදනය පසුගිය වර්ෂයේ වූ ඉහළම නිෂ්පාදන මට්ටම සියයට 5 කින් අභිබවා යමින් කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 258 වන ඉහළම නිෂ්පාදන මට්ටම වාර්තා කරන ලදී. මෙම නිෂ්පාදනය වැඩිවීමට සම්පූර්ණයෙන්ම හේතු වූයේ, පහත් බිම් ප්‍රදේශවල නිෂ්පාදනයේ වර්ධනයයි. විශේෂයෙන්ම රත්නපුරය, ගාල්ල සහ මාතර වැනි පහතරට තෙත් කලාපීය දිස්ත්‍රික්කවල හොඳින් පැතිරී ගිය වර්ෂාපතනය, කුඩා තේ වතු හිමියන්ගේ ඉහළ ඵලදායිත්වය මෙන්ම ආකර්ෂණීය මිල ගණන් හේතුවෙන් පොහොර භාවිතය වැඩිකිරීමට උනන්දුවීම යන කරුණු තේ වගා අංශයේ ක්‍රියාකාරිත්වය වැඩිදියුණු වීමට දායක විය. පහත් බිම් ප්‍රදේශවල තේ නිෂ්පාදනය නොකඩවා සිව්වන වසරටත් වැඩිවීමක් පෙන්වූ අතර, පසුගිය වර්ෂයේ වූ ඉහළම නිෂ්පාදන මට්ටම සියයට 13 කින් අභිබවා යමින් කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 138 ක් ලෙස වාර්තා විය. එසේම පසුගිය වර්ෂයේ පහත් බිම් තේ නිෂ්පාදනය, මුළු තේ නිෂ්පාදනයෙන් සියයට 50 ක් වීම හා සමග සසඳා බලන කල, මෙම වර්ෂයේදී එය සියයට 53 කට දායක වී ඇත. පහත් බිම් අංශයේ නිෂ්පාදනය වැඩිවීමට හේතු වූයේ අළුත් බිම් වල වැඩි ඵලදාවක් ලබාදෙන රිකිලි තේ (වර්ධක පෝෂිත ක්ලෝන) සිටුවීමයි. උස් බිම් සහ මැදි බිම් තේ නිෂ්පාදනය පිළිවෙලින් සියයට 2 කින් සහ සියයට 5 කින් අඩුවිය. මෙම වගා බිම් කාණ්ඩ දෙකට මුළු පරිණත (දළු නෙළන) තේ බිම් ප්‍රමාණයෙන් සියයට 59 ක් අයත් වේ.

මුළු නිෂ්පාදනයේ ඉහළයාම කෙරෙහි කුඩා තේ වතු හිමියන්ගේ දායකත්වය වර්ෂ ගණනාවක් පුරාම දක්නට ලැබුණි. පසුගිය දශකය තුළදී, මුළු තේ නිෂ්පාදනයට කුඩා තේ වතු හිමියන්ගෙන් ලැබුණු දායකත්වය 1987 වර්ෂයේදී සියයට 39 ක සිට 1996 වර්ෂය වනවිට සියයට 57 දක්වා වර්ධනය විය. කුඩා තේ වතු හිමියන්ගේ නිෂ්පාදනයේ කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ, මෙසේ මුළු නිෂ්පාදනයෙන් සියයට 57 ලබාගෙන ඇත්තේ තේ වගාව යටතේ ඇති පරිණත බිම් ප්‍රමාණයෙන් සියයට 44 ක බිම් ප්‍රමාණයකින් වීමය. මේ මගින්, පෞද්ගලික සමාගම් සතු විශාල වතු සහ රාජ්‍ය අංශයේ වතු සමග සසඳා බලන කල කුඩා වතු හිමියන්ගේ කාර්යක්ෂමතාවද පිළිඹිබු කෙරේ. කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට අනුව, වර්ෂය තුළදී කුඩා තේ වතු හිමියන්ගේ වතුවල සාමාන්‍ය ඵලදාව සියයට 5 කින් වැඩි වී හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 1,930 ක් වූ අතර, රාජ්‍ය සහ පෞද්ගලික සමාගම් සතු වතුවල සාමාන්‍ය ඵලදාව සියයට 4 කින් වැඩි වී හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 1,043 ක් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් සමස්ත සාමාන්‍ය ඵලදාව සියයට 4 කින් වැඩි වී කිලෝ ග්‍රෑම් 1,367 ක් වුවද, හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 2,000 ක් පමණ වන කෙන්යාවේ සාමාන්‍ය ඵලදාවට වඩා තවමත් පහත් මට්ටමක පවතී. කෙසේ වුවද, කුඩා වතුවල ඵලදාව, රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික සමාගම් හි වතුවල ඵලදාවට වඩා සියයට 85 කින් වැඩිය. තව ද කුඩා තේ ඉඩම් හිමියන්ට අයත් බිම් ප්‍රමාණයෙන් සියයට 70 ක් වැඩි ඵලදාවක් ලබාදෙන රිකිලි තේ (වර්ධක පෝෂිත ක්ලෝන මගින් වගාකරන) වගාකල ඉඩම් වන අතර ඉතිරිය බීජ වලින් වගා කරන ලද තේ යටතේ පවතී. කුඩා වතු හිමියන්ට වෙනස්ව යමින්, රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික සමාගම් සතුව පවතින ඉඩම් වලින් සියයට 57 ක් ම බීජ වලින් වගා කරන තේ යටතේ පවතී.

**3.2 සංඛ්‍යා සටහන**

**තේ වගා අංශය පිළිබඳ සංඛ්‍යා**

| අයිතමය | ඒකකය | 1994 | 1995 (අ) | 1996 (ආ) |
|---|---|---|---|---|
| 1. නිෂ්පාදනය | කි.ග්‍රෑ.දශ ලක්ෂ | 242 | 246 | 258 |
| උස් බිම් | කි.ග්‍රෑ. දශ ලක්ෂ | 77 | 74 | 72 |
| මැදි බිම් | කි.ග්‍රෑ. දශ ලක්ෂ | 47 | 51 | 48 |
| පහත් බිම් | කි.ග්‍රෑ. දශ ලක්ෂ | 118 | 122 | 138 |
| 2. බිම් ප්‍රමාණය (ඇ) | | | | |
| මුළු වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 187 | 189 | 188 |
| දළු කැඩීම යටතේ ඇති | හෙක්ටයාර දහස් | ලැ.නො. | 173 | 177 |
| 3. පොහොර භාවිතය | මෙට්‍රික් ටොන් දහස් | 126 | 120 | 154 |
| 4. නැවත වගා කිරීම් | හෙක්ටයාර | 1,225 | 1,215 | 990 |
| 5. අළුතින් වගා කිරීම් | හෙක්ටයාර | 1,450 | 1,397 | 565 |
| 6. මිල | | | | |
| කොළඹ (ශුද්ධ) | කි.ග්‍රෑ. / රුපියල් | 65.12 | 72.21 | 103.88 |
| අපනයන (නැ.වි.ස.) | කි.ග්‍රෑ. / රුපියල් | 91.32 | 102.31 | 139.56 |
| 7. නිෂ්පාදන පිරිවැය | කි.ග්‍රෑ. / රුපියල් | 75.67 | 76.14 | 90.75 |
| 8. අපනයන | කි.ග්‍රෑ. / දශ ලක්ෂ | 230 | 241 | 244 |
| 9. අපනයන ඉපැයුම් | රුපියල් දශ ලක්ෂ | 20,964 | 24638 | 34,068 |
| | විශේෂ දශ ලක්ෂ | 296 | 316 | 424 |
| 10. එකතු කළ අගය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් (ඇ) | | 2.3 | 2.1 | 2.2 |

මූලය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය
ජාතික පොහොර ලේකම් කාර්යාලය
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.
(ඇ) තේ කොමසාරිස් අංශය මගින් 1994/95 වර්ෂයන්හිදී කරන ලද සමීක්ෂණයක දත්ත මත පදනම් වේ. (අත්හරින ලද තේ ඉඩම් ඇතුළත් නොවේ.)
(ඈ) වගා කිරීම් සහ සැකසුම් කටයුතුවල පමණි.


වසර කීපයක් තුළ පැවති ස්ථිර වර්ධනයකින් පසුව, සී.ටී.සී. (කපා, ඉරා සහ අඹරන ලද) තේ නිෂ්පාදනය 1996 වර්ෂයේදී සියයට 15 කින් අඩු වී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 17 ක් විය. සාම්ප්‍රදායික තේ මිල ගණන්වල තියුණු වැඩිවීමක් දක්නට ලැබුණු හෙයින් සාම්ප්‍රදායික තේ වෙළඳපොළ කෙරෙහි යොමුවීම වඩා ලාභදායී වීම මීට හේතුවිය. අමු තේ දළු සැපයුම්කරුවන් ඔවුන්ගේ තේ දළු සී. ටී. සී. කර්මාන්ත ශාලාවලට වඩා සාම්ප්‍රදායික තේ කර්මාන්තශාලාවලට සැපයීමට වැඩි කැමැත්තක් දැක්වූහ. කොළඹ තේ වෙන්දේසියේදී අදාල කර්මාන්තශාලාවල තේ සඳහා ලැබෙන ශුද්ධ අලෙවි

මිල පදනම් කරගෙන අමු තේ දළු සැපයුම්කරුවන්ට මුදල් ගෙවනු ලැබීම මෙයට හේතුවීය. ශ්‍රී ලංකාවේ සී. ටී. සී. තේ නිෂ්පාදනය තාවකාලිකව සන්තෘප්ත මට්ටමකට ලගා වී ඇතැයි ශ්‍රී ලංකා තේ මණ්ඩලය අදහස් කරන හෙයින් සී. ටී. සී. යන්ත්‍ර සඳහා දෙන දිරි ගැන්වීමේ යෝජනා ක්‍රමය මත දෙනු ලබන ණය සහනාධාරය 1996 ඔක්තෝබර් 27 දින සිට ක්‍රියාත්මක වන පරිදි එක් අවුරුදු කාලසීමාවක් සඳහා තාවකාලිකව නවතා දමන ලදී.

ප්‍රධාන වශයෙන් වර්ෂය තුළදී වැටුප් ඉහළයාම නිසා, ජනතා වතු සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සහ වැවිලි සමාගම් 21 හි බර තබන ලද සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය සියයට 18 කින් ඉහළ ගොස් තේ කිලෝ ග්‍රෑමයක් සඳහා රුපියල් 90.75 ක් විය. කම්කරුවන්ගේ ඵලදායිත්වය අඩු මට්ටමක පැවතියද, කළමනාකරණ සමාගම්වල කම්කරුවන් සඳහා ගෙවන වැටුප් 1996 ජුලි මාසයේ සිට ඉදිරියට දිනකට රුපියල් 10.76 කින් වැඩිවී රුපියල් 83.00 ක් විය. සමාගමෙහි ශුද්ධ අලෙවි මිල මත පදනම් වූ දිරි දීමනාවක් (මිල වැටුප් ඌණ පූරණයක්) සේවකයනට ලබාදෙන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රම පිරිවැය තවදුරටත් තීරණාත්මක සාධකයක් වෙමින් ඉහළ අගයක් ගන්නා නිෂ්පාදන පිරිවැය මත තවදුරටත් පීඩණයක් ඇති කරන ලදී. වැවිලි සමාගම්වල තත්ත්වය සලකා බලන කල, 1996 වර්ෂයේදී ද කම්කරු ඵලදායිත්වය ඇගයීමේදී දිනකට තේ දළු නෙලන්නකු සාමාන්‍ය වශයෙන් නෙලන දළු ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 15 ක් ලෙස නොවෙනස්ව පැවතුණි. කෙසේවතුදු, වැවිලි සමාගම් 2 ක සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වතු කීපයක තේ දළු නෙලන්නකු දිනකට සාමාන්‍ය වශයෙන් නෙලන තේ දළු ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 20 කට වඩා වැඩි විය. ඉන්දියාව සහ කෙන්යාව වැනි අනිකුත් තේ නිෂ්පාදනය කරන රටවල තේ දළු නෙලන්නකු දිනකදී නෙලන තේ දළු ප්‍රමාණය සාමාන්‍යයෙන් කිලෝ ග්‍රෑම් 25 කට වඩා වැඩිය.

ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් 1995 වර්ෂයේ අගභාගය තුළදී කොළඹ තේ වෙන්දේසියට ගැණුම්කරුවන් වශයෙන් නැවත ඉදිරිපත්වීම හේතු කොට ගෙන ඇති වූ මිල ඉහළයාම, 1996 වර්ෂය පුරාම තවදුරටත් දක්නට ලැබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් වසර පහක් සෘණ ලාභ ආන්තිකයන් පැවතීමෙන් පසුව පළමුවරට කොළඹ වෙන්දේසියේ සාමාන්‍ය තේ මිල ගණන් නිෂ්පාදන පිරිවැය අභිබවා ඉහළ නැගුණි. ඉන්දියාවේ දේශීය තේ ඉල්ලුම වැඩිවීම හේතුවෙන් අපනයනය සඳහා වන තේ ප්‍රමාණය අඩු වීම නිසාද ශ්‍රී ලංකා තේ සඳහා වූ ඉල්ලුම තවදුරටත් වැඩි විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල්වලට අපනයනය කළ තේ ප්‍රමාණය 1994 වර්ෂයේ මෙට්‍රික් ටොන් 13,800 සිට 1996 වර්ෂයේ මෙට්‍රික් ටොන් 42,200 දක්වා වැඩි විය. පසුගිය වර්ෂයේදී මෙන්ම ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල්, ශ්‍රී ලංකාවේ තේ අපනයනයන්හි ප්‍රධාන වෙළෙඳ දිශාව විය. සාම්ප්‍රදායික තේ සඳහා වූ ඉල්ලුම තියුණු ලෙස වැඩි වූ හෙයින් කොළඹ වෙන්දේසියේ වාර්ෂික ශුද්ධ අලෙවි මිල 1996 වර්ෂය තුළදී සියයට 44 කින් ඉහළ ගොස් රුපියල් වලින් දැක්වෙන අගයන් අනුව ඉතා ඉහළ මිලක් පිළිබිඹු කරමින් කිලෝ ග්‍රෑමයක් රුපියල් 103.88 ක් විය. එහෙත් විශේෂ ගැණුම් හිමිකම් (විගැහි) වටිනාකම අනුව මෙය 1983 සිට 1985 දක්වා තිබුණු තේ උත්පාත කාලසීමාව තුළ පැවති මිල ගණන්වලට වඩා පහත් මට්ටමක විය. මෙය 1984 වර්ෂයේ පැවැති විගැහි වලින් සඳහන් වූ ඉහළම මිලට වඩා සියයට 52 ක අඩුවීමකි. වාර්ෂිකව සාමාන්‍ය අපනයන මිලද සියයට 36 කින් වැඩි වී කිලෝ ග්‍රෑමයක් සඳහා රුපිල් 139.56 ක් විය. වර්ෂය තුළදී අපනයන පරිමාව කිලෝ ග්‍රෑම් දශලක්ෂ 3 කින් ඉහළ ගොස් කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 244 ක් වූ අතර අපනයන ඉපැයුම් ප්‍රමාණය සියයට 38 ක වැඩිවීමක් වාර්තා කරමින් රුපියල් දශ ලක්ෂ 34,000 ක් විය.

රූප සටහන 3.1
මිල සහ නිෂ්පාදන පිරිවැය පිළිබඳ දර්ශක : තේ
(1990=100)




තේ සඳහා ඉහළ මිල ගණන් පැවතීම පොහොර භාවිතය වැඩි කිරීමට උනන්දු කරවීම නිසා තේ වගා අංශය සඳහා භාවිතා කරන ලද පොහොර ප්‍රමාණය සියයට 28 කින් ඉහළ ගොස් මෙට්‍රික් ටොන් 153,900 ක් විය. පසුගිය දෙවසරේදී මෙන්ම, 1996 වසරේදී ද තේ වගා අංශ තුනම සඳහා දෙනු ලබන නව වගා සහනාධාර මුදල හෙක්ටයාරයකට රුපියල් 36,000 ක් ලෙස නොවෙනස්ව පැවතුණි. එසේ වුවද, එම සහනාධාරය හෙක්ටයාරයකින් 1/8 ක ප්‍රමාණයක නව වගා කටයුතු සඳහා වන පිරිවැය පියවා ගැනීමට ප්‍රමාණවත් විය. නව වගාව සහ නැවත වගා කටයුතු සඳහා දැරිය යුතු ප්‍රාග්ධන වියදම ඉතාමත් ඉහළ මට්ටමක පවතී. මෙය නව වගා සහ නැවත වගා යන වැඩ පිළිවෙලවල් දෙක කෙරෙහිම අහිතකර ලෙස බලපාන ලදී. 1995 වර්ෂය තුළදී හෙක්ටයාර 1,400 ක නව වගාව සමග සසඳන කළ මෙම වර්ෂයේ එය හෙක්ටයාර 565 ක් පමණක් විය. වර්ෂය තුළදී නව වගා සහනාධාර වශයෙන් වියදම් කරන ලද මුළු මුදල් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 16 ක් විය. නැවත වගා සහනාධාරය උස් බිම් සහ මැදි බිම් ප්‍රදේශ සඳහා හෙක්ටයාරයකට රුපියල් 67,000 ක සහ පහත් බිම් ප්‍රදේශ සඳහා හෙක්ටයාරයකට රුපියල් 57,000 ක් ලෙස නොවෙනස්ව පැවතුණි. එසේම නැවත වගාව සඳහා යන වියදම ද ඉතා ඉහළ හෙයින්, ලැබෙන ආධාර අනුපාතිකය මුළු වියදමෙන් 1/4 කටත් වඩා අඩු ප්‍රමාණයක් විය. වර්ෂය තුළදී මේ ක්‍රමය යටතේ මුදාහරින ලද සහනාධාර මුදල රුපියල් දශ ලක්ෂ 32 ක් විය.

තේ සකස් කිරීමේ අංශය සඳහා වූ අනෙකුත් සංවර්ධන සහනාධාර ක්‍රමයන් වූ තේ කම්හල් සංවර්ධන දිරි ගැන්වීමේ යෝජනා ක්‍රමය සහ තේ බෑග් සෑදීමේ යන්ත්‍ර මිලදී ගැනීම මත ගෙවන පොලී සහනාධාර යෝජනා ක්‍රමය වර්ෂය තුළදී නොකඩවා ක්‍රියාත්මක වූ අතර, මෙම සහනාධාර ලබාදීම සඳහා අරමුදල් ලබාදෙන ලද්දේ සෙස් බදු මගින් ලැබුණු ආදයමෙනි. 1996 වර්ෂය තුළදී ද තේ සඳහා වූ සෙස් බද්ද කිලෝ ග්‍රෑමයට රුපියල් 2.00 ක් වශයෙන් නොවෙනස්ව පැවතිණ. වර්ෂය තුළදී සෙස් බද්ද මගින් ලැබුණු මුළු ආදයම සියයට 3 කින් ඉහළ ගොස් රුපියල් දශ ලක්ෂ 492 ක් විය.

## රබර්

1996 වසරෙහි රබර් නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 112 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. මෙය 1995 වසරෙහි වාර්තාගත නිෂ්පාදනයට වඩා සියයට 6 කින් ඉහළ යාමක් වන අතර, 1990 වසරෙහි සිට වාර්තා වූ ඉහළම නිෂ්පාදනයද මෙය වේ. සතුටුදායක ලෙස පැතිරී පැවැති වර්ෂාව

හා 1994 අගභාගයේදී සිට පැවැති ආකර්ෂණීය මිල ගණන් විසින් මෙහෙයවන ලද යහපත් කළමනාකරණය සහ පොහොර යෙදීම ඉහළ නැංවීම නිෂ්පාදනයේ වර්ධනයට හේතුවිය. කෙසේ වුවද, වසර ගණනාවක් තුළ රබර් නිෂ්පාදනය අඩුවීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කළ අතර දැනට ලැබෙන වාර්ෂික නිෂ්පාදනය, දශකයකට පෙරදී වාර්තා කරන ලද නිෂ්පාදනයට වඩා සියයට 20 ක පමණ අඩුවීමකි. මෙයට හේතු වුයේ, රබර් වගාව යටතේ වූ ඉඩම් නිවාස සඳහා හා සුළු වශයෙන් කර්මාන්ත අවශ්‍යතා සඳහා යොදා ගැනීමත් නිසා රබර් වගා බිම් ප්‍රමාණය පහත වැටීමය.

පසුගිය වර්ෂය සමග සසඳා බලන කල 1996 වර්ෂය තුළ ෂීට් රබර් සහ ක්‍රේප් රබර් නිෂ්පාදනය පිළිවෙලින් කිලෝ ග්‍රෑම් දශලක්ෂ 53 ක් හා කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 42 ක් දක්වා පිළිවෙලින් සියයට 26 කින් හා සියයට 19 කින් ඉහළ නැගුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, මුළු රබර් නිෂ්පාදනයෙහි ෂීට් රබර්වල දායකත්වය 1995 වසරෙහි සියයට 40 සිට 1996 වසරෙහි සියයට 47 ක් දක්වා වැඩිවිය. අනුරූප කාලච්ඡේදය තුළදී මුළු රබර් නිෂ්පාදනයෙහි ක්‍රේප් රබර් නිෂ්පාදනයේ දායකත්වය සියයට 33 සිට සියයට 37 දක්වා වැඩි විය. ලෝකයේ විශාලතම ස්වාභාවික රබර් නිෂ්පාදකයා වන තායිලන්තය ලෝක ස්වාභාවික රබර් නිෂ්පාදනයට සියයට 30 ක දායකත්වයක් දක්වයි. සංසන්දනාත්මකව බලන කල ලෝකයේ මුළු රබර් නිෂ්පාදනයට ශ්‍රී ලංකාව සියයට 2 කටත් වඩා අඩු ප්‍රමාණයකින් දායක වුව ද ප්‍රධානතම ක්‍රේප් රබර් අපනයනය කරන්නා මෙන්ම ඝන රබර් ටයර් සඳහා ද ප්‍රධාන අපනයන කරන්නකු වේ. එකතු කළ අගයක් ඇති ක්‍රේප් රබර් සහ ඝන රබර් ටයර් සඳහා ඇති මෙම විශේෂිත වෙළෙඳපොළ ප්‍රසාරණය කළ යුතු වේ.

**සංඛ්‍යා සටහන 3.3**

## රබර් වගා අංශය පිළිබඳ සංඛ්‍යා

| අයිතමය | ඒකකය | 1994 | 1995 (අ) | 1996 (ආ) |
|---|---|---|---|---|
| 1. නිෂ්පාදනය | කි.ග්‍රෑ. දශ ලක්ෂ | 105 | 106 | 112 |
| 2. බිම් ප්‍රමාණය (ඇ) | | | | |
| වගාව යටතේ ඇති | හෙක්ටයාර දහස් | 161 | 162 | 162 |
| කිරි කැපීම යටතේ ඇති | හෙක්ටයාර දහස් | 121 | 124 | 122 |
| 3. එලදාව | හෙක්ටයාරයකට කි. ග්‍රෑ. | 870 | 853 | 870 |
| 4. පොහොර භාවිතය | මෙට්‍රික් ටොන් දහස් | 17 | 15 | 17 |
| 5. නැවත වගා කිරීම් | හෙක්ටයාර | 1,623 | 3,239 | 3,200 |
| 6. අළුතින් වගාකිරීම් | හෙක්ටයාර | 538 | 829 | 855 |
| 7. මිල | | | | |
| අපනයන (නැ.වි.ස.) | කි.ග්‍රෑ. / රුපියල් | 51.81 | 83.69 | 79.78 |
| කොළඹ (ආර්.ඇස්.ඇස්.1) | කි.ග්‍රෑ. / රුපියල් | 50.36 | 72.04 | 67.85 |
| 8. නිෂ්පාදන පිරිවැය | කි.ග්‍රෑ. / රුපියල් | 30.85 | 33.37 | 36.70 |
| 9. අපනයන | කි.ග්‍රෑ. / දශ ලක්ෂ | 69 | 68 | 72 |
| 10. දේශීය පරිභෝජනය | කි.ග්‍රෑ. දශ ලක්ෂ | 36 | 37 | 40 |
| 11. අපනයන ඉපැයුම් | රුපියල් දශ ලක්ෂ | 3,582 | 5,713 | 5,753 |
| | විගැහි දශ ලක්ෂ | 51 | 74 | 72 |
| 10. එකතු කළ අගය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් (ඈ) | | 0.9 | 0.8 | 0.9 |

මූලය : රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
ජාතික පොහොර ලේකම් කාර්යාලය
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.
(ඇ) ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ කෘෂිකාර්මික බෝග සහ පශු සම්පත් සමීක්ෂණය - 1993 මත පදනම් වේ.
(ඈ) වගා කිරීම් සහ සැකසුම් කටයුතුවල පමණි.


රබර් වගාව යටතේ වූ බිම් ප්‍රමාණය සුළු වැඩිවීමක් පෙන්නුම් කරමින් හෙක්ටයාර 162,000 ක් විය. කෙසේ වුවද, කිරි කැපීම යටතේ වූ බිම් ප්‍රමාණය හෙක්ටයාර 122,300 දක්වා සියයට 1 කින් පහත වැටී ඇත. මේ නිසා නිෂ්පාදනය වැඩිවීමට මුළුමනින්ම හේතු වී ඇත්තේ එලදාව වැඩිවීමයි. වර්ෂය තුළදී එලදාව හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 870 දක්වා සියයට 2 කින් වැඩිවිය. කෙසේ වුවද, නිර්දේශිත මට්ටමට පොහොර භාවිතා නොකිරීමත්, වර්ෂාව හේතු කොටගෙන කිරි කපන දින ගණන අඩුවීමත් නිසා එලදාව බලාපොරොත්තු වූ ප්‍රමාණයට වඩා පහත් මට්ටමක පැවතුණි. ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනයට අනුව වැසි ආවරණ භාවිතයෙන් රබර් එලදාව කෙටිකාලීනව සියයට 10 සිට සියයට 15 දක්වා පහසුවෙන් වැඩිකර ගත හැකිය. ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය විසින් ඩාර්ටන් ෆීල්ඩ් වතු යායේ කරන ලද අත්හදා බැලීමක් අනුව, වැසි ආවරණ රහිත වගාවන් ඇති වත්තක් සමග සසඳා බලන කල වැසි ආවරණය භාවිතයෙන් 1996 වසර තුළ කිරි කපන දින ගණන සියයට 10 කටත් වඩා වැඩි වූ බව අනාවරණය විය.

වර්ෂය තුළදී, රබර් නැවත වගා කරන ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර 3,200 දක්වා සුළු වශයෙන් පහත වැටුණු අතර, අළුතින් වගාකරන ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර 855 දක්වා සියයට 3 කින් ඉහළ ගියේය. මේ අතර නැවත වගා කිරීම් හා නව වගා කිරීම් සඳහා දෙනු ලබන සහනාධාර පිළිවෙලින් හෙක්ටයාරයකට රුපියල් 49,722 ක්, හෙක්ටයාරයකට රුපියල් 48,185 ක් වශයෙන් පසුගිය වසරෙහි පැවැති මට්ටමේම නොවෙනස්ව පැවැතිණි. ලෝක බැංකුවෙන් අරමුදල් සපයනු ලබන කුඩා රබර් වතු පුනරුත්ථාපනය කිරීමේ වැඩ පිළිවෙල 1996 වර්ෂය තුළදී ද නොකඩවා ක්‍රියාත්මක විය.

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඇස්තමේන්තු කර ඇති පරිදි සාමාන්‍ය රබර් නිෂ්පාදන පිරිවැය (විශාල රබර් වගාවන්හි හා කුඩා රබර් වතු හිමියන්ගේ අංශයේ) කිලෝ ග්‍රෑමයට රුපියල් 36.70 දක්වා සියයට 10 කින් වැඩිවිය. වසර තුළදී සිදු කෙරුණු වැටුප් වැඩි කිරීම් මෙම වැඩිවීමට විශාල වශයෙන් හේතුවිය. රබර් වගා අංශයේ වතු කම්කරුවන්ගේ දෛනික වේතන 1996 ජූලි මාසයේ සිට රුපියල් 83.00 දක්වා රුපියල් 10.76 කින් ඉහළ ගියේය. ආර්. ඇස්. ඇස්. නො. 1 රබර්වල විකුණුම් මිල පදනම් කරගත් දිරිදීමනාවක් ද විශාල වතු හිමියන් විසින් කිරි කපන්නන්ට ගෙවන ලදී. රබර් වගාවන්හි පවතින ප්‍රධාන ගැටළුවක් වුයේ කිරි කපන්නන්ගේ හිඟයයි. මෙයට පිළියමක් වශයෙන් 1995 වර්ෂයේදී රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් අළුතින් කිරි කපන්නන් පුහුණු කිරීමේ වැඩ පිළිවෙලක් ආරම්භ කරනු ලැබිය. 1996 වර්ෂය තුළදී කිරි කපන්නන් 1,500 ක් පුහුණු කිරීමට රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට හැකිවිය. වැවිලි සමාගම් සම්බන්ධයෙන් සලකා බලන කල, 1996 වසරෙහි කපන ලද සමාන්‍ය කිරි ප්‍රමාණය මිණුම් දණ්ඩක් ලෙස ගත්කල ශ්‍රමික එලදායිත්වය 1996 වර්ෂයේදී ශ්‍රමික දිනයකට කිලෝ ග්‍රෑම් 5.7 ක් විය. 1995 වර්ෂය හා සසඳා බලන කල මෙය සියයට 2 ක අඩුවීමකි.

කොළඹ වෙන්දේසියේ ආර්. ඇස්. ඇස්. නො. 1 රබර් සඳහා වූ වාර්ෂික සාමාන්‍ය මිල 1995 වාර්තාගත ඉහළම මිලෙහි සිට කිලෝ ග්‍රෑමයකට රුපියල් 67.85 ක් දක්වා සියයට 6 කින් පහත වැටුන ද රබර් මිල ගණන් ආකර්ෂණීය මට්ටමක පැවතුණි. 1995 වර්ෂයේ සියයට 62 ක වැඩිවීමක් වාර්තාකල සියලුම වර්ගවල රබර් සඳහා වූ සාමාන්‍ය අපනයනය මිල (නැ.වි.ස.) 1996 වර්ෂයේදී සියයට 5 කින් පහත වැටී කිලෝ ග්‍රෑමයට රුපියල් 79.78 ක් විය. රබර් මිල ගණන් පහත වැටුණද, වර්ෂය තුළදී අපනයනය

රූප සටහන 3.2
මිල සහ නිෂ්පාදන පිරිවැය පිළිබඳ දර්ශක : රබර්
(1990=100)




කරන ලද රබර් ප්‍රමාණය වැඩිවීම හේතුවෙන්, අපනයන ආදායම රුපියල් දශ ලක්ෂ 5,800 ක් දක්වා සුළු වශයෙන් වැඩිවිය. කෙසේ වෙතත්, විගැහි වටිනාකම් අනුව, අපනයන ආදායම සියයට 3 ක අඩුවීමක් පෙන්නුම් කරමින් විගැහි දශ ලක්ෂ 72 ක් විය.

දේශීය රබර් පරිභෝජනය මෑත කාලීන ප්‍රවණතාවයට අනුකූලව තවදුරටත් වැඩිවිය. දේශීය පරිභෝජනය සියයට 8 කින් වැඩිවී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 40 ක් විය. 1996 වර්ෂයේ දිගුකාලයක් පුරා පැවැති විදුලිය කැපීම හේතුවෙන් අහිමි වූ වැඩකරන පැය ගණන් සලකා බලන විට, මෙය සැලකිය යුතු වර්ධනයකි. පහළ ශ්‍රේණියේ ෂීට් රබර් සහ කැට් නොගැසුණු රබර් කිරි ප්‍රධාන වශයෙන් පරිභෝජනය කරනු ලබන්නේ දේශීය කර්මාන්තකරුවන් වන අතර, ඒ මගින් මෝටර් වාහන ටයර් (නැවත පිරවීම ඇතුළුව), ඝන රබර් ටයර්, අත් වැසුම් සහ පාවහන් ආදිය නිෂ්පාදනය කරනු ලබයි.

ආධාර යෝජනා ක්‍රමයන් සහ පර්යේෂණ සඳහා අවශ්‍ය අරමුදල් සපයන ප්‍රධාන මූලාශ්‍රය වන, රබර් අපනයනය සඳහා වන සෙස් බද්ද 1996 වර්ෂයේ නොවෙනස්ව පැවතුණි. 1996 වර්ෂය තුළදී රැස් කරන ලද මුළු සෙස් බදු ප්‍රමාණය සියයට 39 කින් වැඩිවී රුපියල් දශ ලක්ෂ 400 ක් විය.

ලී බඩු නිෂ්පාදකයන් ගණනාවක් පදම් කල රබර් ලී, ලී බඩු නිෂ්පාදනය සඳහා යොදාගනී. වනාන්තර අඩුවන තත්ත්වයක් යටතේ මෙම අංශය තවදුරටත් පුළුල් කිරීම අවශ්‍ය වේ. තවද, ඉවත් කනු ලබන රබර් ගස් අලෙවියෙන් ලැබෙන ආදායමෙන් නැවත වගාව සඳහා වන ඉහළ පිරිවැය බොහෝ දුරට ආවරණය කරගත හැකිවේ.

## පොල්

1996 වර්ෂයේ පොල් නිෂ්පාදනය ගෙඩි දශ ලක්ෂ 2546 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර මෙය සියයට 8 ක අඩුවීමකි. මෙම අඩුවීමට හේතු වූයේ 1995 වර්ෂයේ අග භාගයේ සහ 1996 වර්ෂයේ මුල් කාලය තුළ ඇති වූ වියළි කාලගුණික තත්ත්වයේ පසුකාලීන බලපෑමයි. සැපයුම් පහත වැටීම සහ කපාපු පොල් සහ පොල් තෙල් නිෂ්පාදනය සඳහා පොල් මිලදී ගැනීමට ඇති වූ දැඩි තරගකාරිත්වය හේතුවෙන් පොල් සඳහා වූ දේශීය මිල සියයට 70 කටත් වඩා වැඩි ප්‍රමාණයකින් ඉහළ නැගුණි. පිලිපීනයේ පොල් නිෂ්පාදන මට්ටම පිළිබඳව පැවැති අවිනිශ්චිත භාවයත්, ආදේශක එළවළු තෙල්මිල ගණන්වල වැඩිවීමත් නිසා, වර්ෂය තුළදී ප්‍රධාන පොල් මද නිෂ්පාදනයන්හි ලෝක මිල ගණන් ශීඝ්‍රයෙන් වැඩිවිය. පොල් මද නිෂ්පාදන්යන්ගේ අපනයන ප්‍රමාණය පහත වැටුණ ද, ඒ මගින් ලැබූ අපනයන ඉපයුම් විගැහි වටිනාකමින් ගත්කළ සියයට 24 කින් ඉහළ නැගුණි.

පොල් ගෙඩි සැපයුම අඩුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් 1996 වර්ෂයේ ප්‍රධාන පොල් මද නිෂ්පාදිත තුනෙහි නිෂ්පාදනය පහත වැටුණි. 1995 වර්ෂයේ වාර්තාගත වූ ඉහළම නිෂ්පාදනයට වඩා 1996 වර්ෂයේ කපාපු පොල් නිෂ්පාදනයේ ගෙඩි සමානය සියයට 9 ක අඩුවීමක් පෙන්නුම් කරමින් ගෙඩි දශ ලක්ෂ 425 ක් වුවද, 1987 වර්ෂයේ සිට 1994 වර්ෂය දක්වා වූ කාලච්ඡේදය තුළදී වාර්තා වූ වාර්ෂික නිෂ්පාදනයන්ට වඩා එය ඉහළ මට්ටමක පැවැතිණි. 1996 වර්ෂයේ පොල් තෙල් නිෂ්පාදනයේ ගෙඩි සමානය ගෙඩි දශ ලක්ෂ 328 ක් වුවද, 1995 වර්ෂය හා සසඳා බලන කල එය සියයට 36 ක අඩුවීමකි. කොප්පරා අපනයනයේ ගෙඩි සමානය සහ පොල් ගෙඩි අපනයනයද පිළිවෙලින් සියයට 22 කින් සහ සියයට 37 කින් පහත වැටී පිළිවෙලින් ගෙඩි දශලක්ෂ 39 ක් සහ ගෙඩි දශලක්ෂ 17 ක් ලෙස වාර්තා විය. දේශීය පොල් ගෙඩි පරිභෝජනය ගෙඩි දශලක්ෂ 1,720 ක් ලෙස සුළු වැඩිවීමක් පෙන්නුම් කරමින් මුළු නිෂ්පාදනයෙන් සියයට 68 ක් පමණ විය.

**සංඛ්‍යා සටහන 3.4**

**පොල් වගා අංශය පිළිබඳ සංඛ්‍යා**

| අයිතමය | ඒකකය | 1994 | 1995 (අ) | 1996 (ආ) |
|---|---|---|---|---|
| 1. නිෂ්පාදනය (ඇ) | ගෙඩි දශ ලක්ෂ | 2,622 | 2,755 | 2,546 |
| කපාපු පොල් | ගෙඩි දශ ලක්ෂ (ඈ) | 380 | 465 | 425 |
| පොල්තෙල් | ගෙඩි දශ ලක්ෂ (ඈ) | 480 | 516 | 328 |
| කොප්පරා (ඉ) | ගෙඩි දශ ලක්ෂ (ඈ) | 32 | 50 | 39 |
| පොල් ගෙඩි අපනයනය | ගෙඩි දශ ලක්ෂ | 25 | 27 | 17 |
| දේශීය පොල් ගෙඩි පරිභෝජනය (ඊ) | ගෙඩි දශ ලක්ෂ | 1,687 | 1,716 | 1,720 |
| 2. මුළු වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර් දහස් | 413 | 416 | 417 |
| 3. සාමාන්‍ය අපනයන මිල නැ.වි.ස. (උ) | ගෙඩිය/රුපියල් | 5.67 | 6.08 | 9.42 |
| 4. පොහොර භාවිතය | මෙ.ටො. දහස් | 31 | 34 | 39 |
| 5. නිෂ්පාදන පිරිවැය | ගෙඩිය/රුපියල් | 1.84 | 2.02 | 2.18 |
| 6. නැවත වගාව/යටි වගාව (ඌ) | හෙක්ටයාර | 842 | 986 | 578 |
| 7. නව වගාව (ඌ) | හෙක්ටයාර | 657 | 1,250 | 841 |
| 8. අපනයන ඉපැයුම් | රුපියල් දශ ලක්ෂ | 3,761 | 5,271 | 6,091 |
| | විගැහි දශ ලක්ෂ | 53 | 68 | 76 |
| මද ආශ්‍රිත නිෂ්පාදන (උ) | රුපියල් දශ ලක්ෂ | 2,476 | 3,521 | 4,469 |
| | විගැහි දශ ලක්ෂ | 35 | 45 | 56 |
| අනෙකුත් නිෂ්පාදන | රුපියල් දශ ලක්ෂ | 1,285 | 1,750 | 1,622 |
| | විගැහි දශ ලක්ෂ | 18 | 23 | 20 |
| 9. එකතු කළ වටිනාකම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් (එ) | | 2.4 | 2.1 | 2.0 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ගණනය කරන ලද්දකි. (කොප්පරා තොග වෙනස් වීම සඳහා ගැලපීම් කරන ලද බැවින් ශීර්ෂවල එකතුව මුළු නිෂ්පාදනය හා නොසැසඳේ).
(ඈ) ගෙඩි ප්‍රමාණය ගණන් බැලීමේදී යොදාගත් අනුපාතිකයන්:
කපාපු පොල් මෙ.ටො. 1 = ගෙඩි 6,800
පොල් තෙල් මෙ. ටො. 1 = ගෙඩි 8,000 සහ
කොප්පරා මෙ. ටො. 1 = ගෙඩි 4,925
(ඉ) අපනයන පමණි.
(ඊ) ඒකපුද්ගල වාර්ෂික ගෘහ පරිභෝජනය පොල් ගෙඩි 94.8 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. කර්මාන්ත අංශයේ ප්‍රයෝජනයට ගැනෙන පොල් ගෙඩි ප්‍රමාණය මෙයට ඇතුලත් නොවේ.
(උ) ප්‍රධාන පොල් මද නිෂ්පාදන තුන සඳහා පමණි.
(ඌ) පොල් වගා කිරීමේ මණ්ඩලයේ ආධාර ලබා ගන්නා වගා බිම් ප්‍රමාණයන් ඇතුළත් වේ.
(එ) වගා කිරීම් සහ සැකසුම් කටයුතුවල පමණි.

මූලයන් : පොල් වගා කිරීමේ මණ්ඩලය
පොල් සංවර්ධන අධිකාරිය
ජාතික පොහොර ලේකම් කාර්යාලය
ශ්‍රී ලංකා මහ බැංකුව


පොල් වගා කිරීමේ මණ්ඩලයේ දත්තයන්ට අනුව 1996 වර්ෂයේ පොල් වගාව යටතේ තිබූ මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර 417,000 කට ආසන්න විය. මෙය රටෙහි වගා කළ හැකි මුළු බිම් ප්‍රමාණයෙන් සියයට 22 ක් පමණ වන අතර, එය දෙවෙනි වන්නේ වී වගාව යටතේ ඇති බිම් ප්‍රමාණයට පමණි. 1996 වර්ෂයේදී, ඵල දරණ මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර 363,000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. ඵල දරණ බිම් ප්‍රමාණය ගැන සලකා බලන විට 1995 වර්ෂයේ සාමාන්‍ය ඵලදාව වූ හෙක්ටයාරයකට ගෙඩි 7,590 සිට 1996 වර්ෂයේදී හෙක්ටයාරයකට ගෙඩි 7,014 ක් දක්වා සියයට 8 කින් පහත වැටුණි. මෙම පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ නියගයේ බලපෑමයි.

පොල් පර්යේෂණ ආයතනය මගින් කරන්නට යෙදුණු මූලික සමීක්ෂණයකට අනුව, පොල් ත්‍රිකෝණයට අයත් ගම්පහ, කුරුණෑගල සහ පුත්තලම යන දිස්ත්‍රික්කයන්හි පොල් වගාව යටතේ ඇති ඉඩම් ප්‍රමාණය වර්ෂයක් තුළදී හෙක්ටයාර 1,000 ක පමණ ප්‍රමාණයකින් අඩු වී ඇත. පොල් ඉඩම් ප්‍රමාණය මෙසේ අඩු වී යාමට, නිවාස, කර්මාන්තශාලා (උදා. නිදහස් වෙළෙඳ කලාප) සහ අනිකුත් ගොඩනැගිලි, ක්‍රීඩාංගන සහ විදුලි බල යෝජනා ක්‍රම ඉදිකිරීම සඳහා පොල් ඉඩම් කට්ටි කිරීම හේතුවිය. මෙයින් පොල් වගා අංශයට වන අහිතකර බලපෑම අවම කර ගැනීමේ අදහසින්, පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය සහ අනෙකුත් ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම යටතේ සංවර්ධිත නව ප්‍රදේශවල පොල් වගාව ජනප්‍රිය කරවීම සඳහා පියවර ගෙන ඇත. මේ අනුව මහවැලි "සී" කලාපයේ උල්හිටියේ බීජ පොල් පැළ තවානක් ස්ථාපිත කරන ලදී.

පොල් වගා කිරීමේ මණ්ඩලය එකතු කරනු ලබන සෙස් ආධාර උපයෝගී කරගෙන 1995 වර්ෂයේ පැවැති පරිදි 1996 මැයි 01 දින තෙක් පොල් වගාව සංවර්ධනය කිරීම සඳහා ආධාර ක්‍රම 7 ක් යටතේ ආධාර සපයන ලදී. මෙම ආධාර ක්‍රම යටතේ, නැවත පොල් වගාව (සියලු ගස් ඉවත්කර) සහ අළුතින් පොල් වගා කිරීම සඳහා හෙක්ටයාරයකට රුපියල් 25,000 ක් ද, නැවත පොල් වගාව (ක්‍රමිකව ගස් ඉවත් කර) සඳහා රුපියල් 12,500 ක් ද, පොහොර සංරක්ෂණය සඳහා හෙක්ටයාරයකට රුපියල් 7,000 ක්ද, අතුරු භෝග වගා කිරීම සඳහා හෙක්ටයාරයකට රුපියල් 9,880 ක්ද, ගෙවතු වගා සඳහා එක් ගෙවත්තකට නොමිලේ පැළ 10 ක් සහ හෙක්ටයාර 2.5 කට වැඩි ඉඩම් වලට වාරිමාර්ග පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා රුපියල් 100,000 ක් ද වශයෙන් සහනාධාර ලබාදෙන ලදී. සෙස් ආධාර මගින් එකතු කරනු ලබන සීමිත අරමුදල් උපරිම වශයෙන් පොල් වගාවේ සංවර්ධනය සඳහාම උපයෝජනය කිරීමේ අදහසින්, පොල් වගා කිරීමේ මණ්ඩලය 1996 මැයි 01 දා සිට මෙම සහනාධාර, ක්‍රම තුනක් වශයෙන් නැවත ප්‍රතිව්‍යුහගත කරන ලදී. ඒ අනුව, නැවත පොල් වගා කිරීම සඳහා හෙක්ටයාරයකට රුපියල් 38,750 ක්ද, අළුතින් පොල් වගා කිරීම සඳහා හෙක්ටයාරයකට රුපියල් 40,000 ක්ද, සහ ගෙවතු වගා ආධාරය යටතේ වගා කරුවෙකුට නොමිලේ පැළ 10 කට නොවැඩිව නිකුත් කිරීමට කටයුතු සලසන ලදී. නැවත වගා කිරීම සහ අළුතින් පොල් වගා කිරීම සඳහා ලබාදෙන සහනාධාර හෙක්ටයාර 2 කට අඩු බිම් ප්‍රමාණයන් ආවරණය කරන ලදී. පොල් වගා කිරීමේ මණ්ඩලය මගින් ලබාදී ඇති විවිධ සහනාධාර ක්‍රම යටතේ, එනම් නැවත වගා / යටි වගා කිරීම, අළුතින් වගා කිරීම, අතුරු භෝග වගා කිරීම සහ පොහොමනය සංරක්ෂණය සඳහා පිළිවෙළින් හෙක්ටයාර් 578 ක්, හෙක්ටයාර් 841 ක්, හෙක්ටයාර් 725 ක් සහ හෙක්ටයාර් 1,396 ක් සංවර්ධනය කරන ලද අතර, 1995 වර්ෂය සමග සසඳා බලන කළ ඒවා පිළිවෙළින් සියයට 41 ක, සියයට 33 ක, සියයට 40, සහ සියයට 14 ක අඩුවීමක් පෙන්නුම් කරන ලදී. මේ සඳහා ප්‍රධාන වශයෙන් 1996 වර්ෂයේදී පැවැති නියගකාරී තත්ත්වය බලපාන ලදී.

අපනයනය කරන ලද විවිධ වර්ගයේ පොල් නිෂ්පාදන සඳහා විවිධ සෙස් අනුපාතික යොදා ගැනුණි. මෙම අනුපාතිකයන් 1995 වර්ෂයේදී පැවැති මට්ටම්වල නොවෙනස්ව පැවැතිණි. ප්‍රධාන අපනයන නිෂ්පාදිතයන්ට අදාල වූ සෙස් අනුපාතිකයන් පොල් ගෙඩි 1000 ක් අපනයනය සඳහා රුපියල් 750 ක්, පොල් තෙල් මෙට්‍රික් ටොන් එකක් අපනයන සඳහා රුපියල් 400 ක්, කපාපු පොල් මෙට්‍රික් ටොන් එකක් අපනයනය සඳහා රුපියල් 1000 ක්, සහ කොප්පරා මෙට්‍රික් ටොන් එකක් අපනයනය සඳහා රුපියල් 900 ක්, විය. 1996 වර්ෂයේ අපනයන පරිමාවෙහි අඩුවීමක් පෙන්නුම් කළ හෙයින් විවිධ අපනයනයනගෙන් එකතු කරන ලද මුළු සෙස් ප්‍රමාණයද සියයට 21 ක අඩුවීමක් පෙන්වමින් රුපියල් දශ ලක්ෂ 101 ක් විය.

1996 වර්ෂයේ සැපයුම අඩුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් පොල් මිලෙහි ශීඝ්‍ර වැඩිවීමක් ද දක්නට ලැබුණි. 1995 වර්ෂයේ (කොළඹ) සාමාන්‍ය තොග මිළ ගෙඩියක් රුපියල් 3.52 ක් වූ අතර, 1996 වර්ෂයේදී එය සියයට 86 ක වැඩිවීමක් පෙන්වමින් ගෙඩියක් රුපියල් 5.56 ක් විය. ඊට සමානව 1995 වර්ෂයේ කොළඹ සාමාන්‍ය සිල්ලර මිලද ගෙඩියක් රුපියල් 5.45 සිට සියයට 73 කින් වැඩිවී 1996 වර්ෂයේදී ගෙඩියක් රුපියල් 9.41 ක් විය. දේශීය පොල් තෙල් මිලෙහි ස්ථාවරභාවයක් ඇති කිරීම සඳහා 1996 ජූනි 12 දින සිට මාස 03 ක කාලපරිච්ඡේදයක් සඳහා රජය මැදිහත්වීමෙන් කෑමට සුදුසු තෙල් වර්ගවල (පොල් තෙල් හැර) ආනයනික බද්ද සියයට 35 සිට සියයට 5 දක්වා අඩු කරන ලදී. ඊට සමානව කොප්පරා ආනයනය සඳහා වූ තීරු බද්ද සියයට 35 සිට සියයට 5 දක්වා අඩුකරන ලදී. පොල්තෙල් නිෂ්පාදනය කිරීම සඳහා ආනයනය කරනු ලබන කොප්පරා භාවිතා කරන විට කපාපු පොල් නිෂ්පාදනය සඳහා පවතින පොල් සැපයුමේ හිඟය මැඩ පැවැත්වෙනු ඇතැයි මෙමගින් බලාපොරොත්තු විය. තීරු බදු අඩු කිරීමේ කාලසීමාව 1997 ජනවාරි 12 වන දින දක්වා මාස 4කින් නැවතත් දීර්ඝ කරන ලදී. 1995 වර්ෂයේදී කොප්පරා ආනයනය කිරීමක් සිදු නොවුවද, 1996 වර්ෂයේදී කොප්පරා මෙට්‍රික් ටොන් 800 ක් ආනයනය කරන ලදී.



රූප සටහන 3.3
මිල සහ නිෂ්පාදන පිරිවැය පිළිබඳ දර්ශක : පොල්
(1990=100)

1995 වර්ෂයේදී ප්‍රධාන පොල් මද නිෂ්පාදන තුන සඳහා වූ සාමාන්‍ය අපනයනය මිල (නැ.වි.ස.) වූ ගෙඩියක් රුපියල් 6.08 සිට සියයට 55 ක වැඩිවීමක් පෙන්නුම් කරමින් ගෙඩියක් රුපියල් 9.42ක් ලෙස වාර්තා ගත ඉහළ මට්ටමකට ළඟාවිය. කපාපු පොල් සඳහා මෙතෙක් වාර්තා වූ ඉහළම සාමාන්‍ය මිල (නැ.වි.ස.) ලබා ගනිමින් පසුගිය වසරට වඩා සියයට 42 ක් වැඩි වී මෙට්‍රික් ටොන් එකකට ඇමෙරිකානු ඩොලර් 1,117 ක් විය. පොල් තෙල් සහ කොප්පරා සඳහා වූ සාමාන්‍ය අපනයන මිල (නැ.වි.ස.) 1996 වර්ෂයේදී

පිළිවෙලින් මෙට්‍රික් ටොන් එකකට ඇමෙරිකානු ඩොලර් 976 ක් සහ මෙට්‍රික් ටොන් එකකට ඇමෙරිකානු ඩොලර් 734 ක් විය. ශ්‍රී ලංකාවේ නිෂ්පාදනවල උසස් ගුණාත්මක බව හා ලෝක වෙළෙඳපොළෙහි පැවැති හිඟ සැපයුම් තත්ත්වය ඉහළ මිළ ගණන් වලින් පිළිඹිබු විය.. 1996 වර්ෂයේදී මුළු අපනයන ඉපැයුම් ප්‍රමාණය විගැහි වට්නාකම් මත සියයට 12 කින් වැඩිවී විගැහි දශ ලක්ෂ 76 ක් විය. පොල් මද නිෂ්පාදන වල ඉපැයුම් ආදායම විගැහි වට්නාකම් අනුව සියයට 24 කින් වැඩිවී විගැහි දශ ලක්ෂ 56 ක් වුවද, පොල් කටු අඟුරු, පොල් ඉරටු වැනි අනිකුත් පොල් නිෂ්පාදනවලින් ලත් ඉපැයුම් සියයට 13 කින් අඩුවී විගැහි දශ ලක්ෂ 20 ක් විය. මෙම අඩුවීමට හේතු වුයේ අපනයන ප්‍රමාණයේ අඩුවීමයි.

1996 වර්ෂය තුළදී, කපාපු පොල් මෝල් සංවර්ධන වැඩ සටහන යටතේ; කපාපු මොල් 10 ක නිෂ්පාදනවල ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම සඳහාත්, නව වියළීමේ ක්‍රමයක් ඇති කිරීමට අවශ්‍ය උපකාරක ද්‍රව්‍ය සවිකිරීමටත්, සහ විදුලි බලය ලබාදීමටත්, සංවර්ධන ආධාර මුදල් ලබාදෙන ලදී. කපාපු පොල් මෝල් සංවර්ධන අරමුදල, පොල් සඳහා වන සෙස් බද්දෙන් මුලපනය කරනු ලැබූ අතර, ලැබෙන ඉපයුම් නැවතත් පොල් වගා අංශයට ලබාදීමට එය යොදා ගැනුණි. කර්මාන්තශාලා නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ, කපාපු පොල් මෝල් 7 ක වියළීමේ නව යන්ත්‍ර පද්ධති සවිකිරීම සඳහා ආධාර ලබාදෙන ලදී.

බීජ පොල් පැල නියගයෙන් ආරක්ෂා කර ගැනීමේ අදහස ඇතිව පොල් වගා කිරීමේ මණ්ඩලය මගින් පොලිතින් උර වල සිටවන ලද පොල් පැල වගාකරුවන්ට හඳුන්වා දෙන ලදී. 1996 වර්ෂයේදී වගාකරුවන් වෙත එවැනි පොල් පැල 50,000 ක් නිකුත් කර ඇත. තව ද පොල් වගාව දියුණු කිරීමේ පියවරක් වශයෙන් පොල් වගාකිරීමේ මණ්ඩලය පුහුණු වැඩ පිළිවෙලවල් හා නියාමක යෝජනා ක්‍රම ආදිය මගින් සංවිධානාත්මක ව්‍යාප්ති සේවයක් පවත්වාගෙන යන ලදී.

පොල් පර්යේෂණ ආයතනය මගින් තෝරා ගත් පොල් ඉඩම්වල පශු සම්පත් (ගව සහ එළුවන්) තෘණ වගාව හා අනෙකුත් බෝග (කජු සහ රඹුටන්) ඒකාබද්ධව පවත්වාගෙන යාම තුළින් පසෙහි නයිට්‍රජන් ප්‍රමාණය හා ඉඩම්වල ඵලදාව වැඩි කර ගැනීමෙන් සතුටුදායක ප්‍රතිඵල ලබාගන්නා ලදී. වර්ෂය තුළදී පොල් පර්යේෂණ ආයතනය පොහොර කළමනාකරණය, පසෙහි තෙතමන සංරක්ෂණය, ප්‍රභේද වර්ධනය කිරීම හා අභිජනන පර්යේෂණ, ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය, ගොවිපල පුනරුත්ථාපනය කිරීම හා ව්‍යාප්ති සේවාවන් පවත්වාගෙන යාම වැනි කටයුතු වල නියලුණි. පොල් පර්යේෂණ ආයතනය මගින් පාලනය වන අඹකැලේ, මාකඳුර හා මාදුරු ඔය බීජ උයන් මගින් උස x උස හා කුන්දිරා x උස වර්ගවල බීජ පොල් දශ ලක්ෂ 1.7 කට ආසන්න ප්‍රමාණයක් පොල් වගා කිරීමේ මණ්ඩලයට අයත් තවාන් වලට සපයන ලදී. පොල් වගා කිරීමේ මණ්ඩලය 1996 වර්ෂය තුළදී වගාකරුවන්ට බීජ පැල දශ ලක්ෂ 2 කට අධික ප්‍රමාණයක් නිකුත් කරන ලදී. මෙය 1995 වර්ෂයේ නිකුත් කරන ලද ප්‍රමාණයට වඩා සුළු වශයෙන් අඩුවීමකි.

## අනෙකුත් අපනයන බෝග

කරදමුංගු, කුරුඳු, කරාබුනැටි, සාදික්කා හා වසාවාසි සහ ගම්මිරිස් වැනි කුළු බඩු ද, කොකෝවා සහ කෝපි වැනි පානීය බෝග ද පැඟිරි වැනි වාෂ්පශීලී තෙල් වර්ගද ප්‍රධාන වශයෙන් ඇතුළත් වන බෝග වර්ග රාශියකින් අනෙකුත් අපනයන බෝග සමන්විත වේ. මේවායින් බොහොමයක් බෝග බහු වාර්ෂික වන හෙයින් කෙටිකාලීන මිල උච්චාවචනයන් කෙරෙහි, නිෂ්පාදන මට්ටම් ප්‍රතිචාරයක් නොදක්වයි. ශ්‍රී ලංකාව සම්ප්‍රදායික කුළු බඩු අපනයනකරුවෙක් වුවද, ලෝක කුළුබඩු වෙළෙඳමෙන් හිමි කරගෙන ඇත්තේ සියයට 2 ක් පමණි.

1980 මුල් භාගයේදී ලාභදායී බෝගයක්ව පැවැති කරාබු වගාවට පසුගිය දශකය තුළදී අයහපත් තත්ත්වයක් උදාවිය. මෙයට හේතු වූයේ, ඉන්දුනීසියානු වෙළෙඳපොළ නොලැබී යාම සහ (ඉන්දුනීසියාව දැනට කරාබු නැටි නිෂ්පාදනය කිරීම) ඉන්දියාවට කරනු ලැබූ අපනයනයන් සීමා කරනු ලැබූ තීරු බදු නොවන බාධකය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම කාලය තුළදී කරාබු නැටි මිල දැඩි ලෙස පහත වැටුණි. මෙම ඉතා අඩු මිල ගණන් නිසා කරාබු නැටි වගා කරන්නන් තම වගාවන් නොසලකා හැරීම කරාබු නැටි නිෂ්පාදනයට බලපාන ලදී. ඉන්දියාවට කරනු ලබන කරාබු නැටි අපනයන වැඩි කළ හැකි වනුයේ කෙටි කාලීනව ඉන්දියානු රජය විසින් ලබාදී ඇති පංගු උපයෝජනය කිරීම සහ දකුණු ආසියානු වරණීය වෙළෙඳ වැඩපිළිවෙල (SAPTA) යටතේ සාකච්ඡා කර දිගු කාලීනව තීරු බදු නොවන බාධක ඉවත් කිරීම මගිනි. එමෙන්ම කරාබු නැටි සඳහා ඉල්ලුමක් පවතින මැදපෙරදිග සහ නැගෙනහිර යුරෝපීය රටවලට අපනයනය කිරීමේ හැකියාවද රජය විසින් සොයා බැලිය යුතුවේ.

පසුගිය වර්ෂය සමග සසඳන කල, කරාබු නැටි කුරුඳු පොතු හා කුරුඳු තෙල් (කොළ) නිෂ්පාදනය හැරුණු විට අනෙකුත් අපනයන බෝගයන්හි නිෂ්පාදනය යහපත් ක්‍රියාකාරීත්වයක් පෙන්විය. පසුගිය අවුරුදු කීපය තුළ ගම්මිරිස් නිෂ්පාදනය අඩුවීමේ ප්‍රවණතාවයක් පැවතියද, 1996 වර්ෂයේ එය සියයට 30 කින් වැඩි වී මෙට්‍රික් ටොන් 4,312 ක් විය. පැඟිරි සහ කොකෝවා නිෂ්පාදනය සියයට 6 බැගින් වැඩි වී පිළිවෙළින් මෙට්‍රික් ටොන් 190 ක් සහ මෙට්‍රික් ටොන් 1,630 ක් විය. 1996 වර්ෂය තුළදී කෝපි සහ සාදික්කා නිමැවුම 1995 වර්ෂයේ වාර්තා වු ප්‍රමාණයට වඩා සුළු වශයෙන් වැඩිවිය.

**සංඛ්‍යා සටහන 3.5**
**අනෙකුත් අපනයන බෝග නිෂ්පාදනයන්**

මෙට්‍රික් ටොන්

| බෝගය | 1994 | 1995 (අ) | 1996(ආ) |
|---|---|---|---|
| කෝපි | 3,687 | 2,159 | 2,166 |
| කොකෝවා | 1,463 | 1,542 | 1,630 |
| කුරුඳු පොතු | 9,774 | 10,815 | 9,724 |
| කුරුඳු තෙල් (කොළ) | 180 | 205 | 110 |
| ගම්මිරිස් | 4,708 | 3,326 | 4,312 |
| කරාබු නැටි | 1,551 | 1,500 | 1,439 |
| කරදමුංගු | 40 | 40 | 40 |
| සාදික්කා සහ වසාවාසි | 939 | 988 | 1,010 |
| පැඟිරි | 150 | 180 | 190 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය : අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

පසුගිය වර්ෂ කීපය තුළ පහත් ඉල්ලුම හේතුවෙන් අඩුවීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කළ කරාබු නැටි නිෂ්පාදනය 1996 වර්ෂයේදී තවදුරටත් සියයට 4කින් අඩු වී මෙට්‍රික් ටොන් 1,439 ක් විය. මේ අතර, කුරුඳු පොතු නිෂ්පාදනය සියයට 10 කින් අඩු වු අතර, කුරුඳු (කොළ) තෙල් නිෂ්පාදනය, ඉල්ලුමේ පසුබෑම හේතුවෙන් සියයට 46 දක්වා දැඩි ලෙස පහත වැටුණි. අනෙකුත් අපනයන බෝග යටතේ වු මුළු බිම් ප්‍රමාණය 1995 දී සියයට 1 කින් වැඩි වූ අතර 1996 වර්ෂයේදී එය තවදුරටත් සියයට 1 කින් වැඩිවී හෙක්ටයාර 70,268 ක් විය. වර්ෂය තුළදී ගම්මිරිස් හා කොකෝවා වගාව යටතේ වු බිම් ප්‍රමාණය පිළිවෙලින් හෙක්ටයාර 480 කින් හා හෙක්ටයාර 263 කින් වැඩි වූ අතර, මෙම බෝග වර්ග දෙක වගා කරන ලද බිම් ප්‍රමාණයන්හි වැඩිවීම එකට ගත්කල වර්ෂය තුළදී වගාකරන ලද මුළු බිම් ප්‍රමාණය වැඩිවීමෙන් සියයට 90 කටත් වඩා වැඩි විය.

විශේෂ සටහන 3

# කෘෂි නිෂ්පාදිත සඳහා ඉදිරි වෙළෙඳපොළ

ඉදිරි ගිවිසුම්, අනාගත ගිවිසුම්, විකල්පයන් සහ 'ස්වොප්ස් (Swaps) යන විවිධ උපකරණ ඉදිරි වෙළෙඳ පොළෙහි දක්නට ලැබේ. මේවායින් ඉදිරි හා අනාගත ගිවිසුම් කෘෂි අලෙවිය සඳහා වඩා අදාල වේ. 'ඉදිරි ගිවිසුමක් යනු පූර්ව නිශ්චිත මිලකට ස්ථිර අනාගත දිනයකදී යම් නියමකර ගන්නා ලද භාණ්ඩ ප්‍රමාණයක් මිලදී ගැනීමට හෝ විකිණීමට කරනු ලබන සම්මුතියකි. ගිවිසුම කල්පිරෙන විට පවතින මිල ගණන් ඉදිරි ගිවිසුමේ සඳහන් මිලට වඩා වැඩිනම්, මිලදී ගනු ලබන්නා ලාභයක් උපයන අතර ඊට අදල පාඩුව විකුණුම්කරු විසින් දරනු ලැබේ. මිල ගණන් අඩු වුවහොත් එහි ප්‍රතිවිරුද්ධ දෙය සිදුවේ.' ඉදිරි ගිවිසුම ගැනුම්කරු හා විකුණුම්කරු අතර විශේෂයෙන් සැකසූ ගිවිසුමකි. කලින් මිල තීරණය කිරීමේ වැඩපිළිවෙල ගැනුම්කරුගේ මෙන්ම විකුණුම්කරුගේ අවදනම ඉවත් කරයි. ඉදිරි ගිවිසුම් වැනි භාණ්ඩ හා බැඳුණු මූල්‍ය උපකරණයන් තුළින් භාණ්ඩ මිල ගණන් ආශ්‍රිත අවදනම පාලනය කිරීම, නිෂ්පාදිත සඳහා සහතික මිලක් නොවරදවා ලබාදේ. එවැනි ගිවිසුම්, ආවරණය කරන භාණ්ඩ අනාගතයේ විකිණීමෙන් ලැබෙන ආදයම ස්ථාවර කරනු ලබන බැවින්, වෙනස්වන වෙළෙඳපොළවල විකිණීමේ වානිජ්‍යමය අවදනම අඩු කරයි.

අනාගත ගිවිසුමක්, ඉදිරි ගිවිසුමකට සමාන වුවද එය වඩා නම්‍ය සහ වැඩිදියුණු වූවකි. එහිදී කලින් තීරණය කල මිලකට නියමිත අනාගත දිනයකදී යම් නියම කරගන්නා ලද භාණ්ඩ ප්‍රමාණයක් මිලදී ගැනීමට හෝ විකිණීමට එකගවේ. එහෙත් ඉදිරි ගිවිසුමේදී මෙන් නොව මෙහිදී භාණ්ඩය භෞතික වශයෙන් බාරදීමක් අත්‍යවශ්‍යයෙන්ම අදහස් නොකෙරේ. ඉදිරි හා අනාගත ගිවිසුම් අතර තවත් වෙනස්කම් ඇත.

අනාගත ගිවිසුමක පහත සඳහන් ලක්ෂණ වේ.

අ) ප්‍රමාණය, ශ්‍රේණිය, බාරදෙන දිනය, බාරදෙන ස්ථානය ආදිය සම්මත කොන්දේසි වේ. හුවමාරුවේදී මිල පමණක් ගිවිසගනු ලැබේ.

ආ) නිෂ්කාශණාගාරයක් තුළින්, සංවිධිත හුවමාරු මගින් අනාගත ගනුදෙනු මෙහෙයවනු ලැබේ.

ඇ) වෙළඳාමේදී සිදුවන ලාභ සහ පාඩු දෛනිකව පියවනු ලැබේ. අනාගත ගිවිසුම් වලදී දෛනික අවසන් මිල (පියවීම් මිල) භාවිතා කරමින් 'දිනපතා වෙළෙඳපොළ ලකුණු කෙරේ. ලාභය හෝ පාඩුව (පියවීම් මිල) භාවිතා කිරීමෙන් ගණනය කරනු ලබන අතර, එය නිෂ්කාශණායතනයක් මගින් දෛනිකව පියවනු ලැබේ. මෙය උපලබ්ධි නොවූ අලාභ දිගු කාලයක් ඉදිරියට ගෙනයාම වලක්වන අතර, ගෙවීම් පැහැර හැරීමේ අවදනම අඩු කරයි.

ඈ) හුවමාරුවෙහි හෝ තැරැව්කරුවන් සමග අවම මුදල් ප්‍රමාණයක් හෝ ඇපකරයක් තැන්පත් කිරීම අනාගත ගිවිසුම්වලදී අවශ්‍ය වන අතර සාමාන්‍යයෙන් භාණ්ඩ ගිවිසුම්වලදී එය ගිවිසුමේ වටිනාකමින් සියයට 10 ක් පමණ වේ. මෙම වැඩ පිළිවෙළ ඉදිරි ගනුදෙනුවල ණය හෝ පැහැර හැරීමේ අවදනම සැලකිය යුතු ලෙස අඩුකරයි.

ඉ) අනාගත ගිවිසුම්, ඉදිරි ගිවිසුම මෙන් නොව, පැවරිය හැකි අතර, අනෙක් පාර්ශවයේ අනුමැතිය නොමැතිව අවලංගු කළ නොහැක.

අනාගත ගිවිසුම යනු නිෂ්කාශණායතනයක් විසින් සියළුම වෙළෙඳාම සහතික කරන හා පියවනු ලබන, සංවිධිත හුවමාරු නීති යටතේ මිලදී ගැනීම හා විකිණීම කරනු ලබන විශේෂ වර්ගයක ඉදිරි ගිවිසුමකි. එය මූලික වශයෙන් උච්චාවචනයන් වලින් ආරක්ෂා කරන ඉදිරි රැකුම් උපකරණයකි. අනාගත ගිවිසුම් ශතවර්ෂ ගණනාවකට පෙර ජපානයේ සහල් වෙළෙන්දන් හා ගනුදෙනුකරුවන් අතර ඇරඹුණි. එවක යොදාගත් වෙළෙඳ නියමයන් අද පවා භාවිතාවන නියමයන්ට සමානය. කෘෂි අනාගත ගිවිසුම් කටයුතු කෙරෙන ප්‍රධාන භාණ්ඩ හුවමාරු සමහරක් පහත දැක්වේ.

(1) ලන්ඩන් ජාත්‍යන්තර මූල්‍ය අනාගත හුවමාරුව - සුදු සීනි, කෝපි, කොකෝවා, තිරිගු හා බාර්ලි ආශ්‍රිත ගනුදෙනු

(2) චිකාගෝ වෙළෙඳ මණ්ඩලය - තිරිගු, බඩඉරිගු හා සෝයා පිළිබඳ ගනුදෙනු

(3) ක්වාලාලම්පූර් භාණ්ඩ හුවමාරුව - පාම් තෙල් පිළිබඳ ගනුදෙනු

(4) නිව්යෝර්ක් කපු හුවමාරුව - කපු ආශ්‍රිත ගනුදෙනු

(5) සිංගප්පූරුවේ භාණ්ඩ හුවමාරුව - රබර් සහ කෝපි ආශ්‍රිත ගනුදෙනු

(6) කෝබේ රබර් හුවමාරුව - රබර් ආශ්‍රිත ගනුදෙනු

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නිෂ්පාදිතවල මිල ගණන්, ඒවායෙහි ඉල්ලුම් තත්ත්වයන් සහ සැපයුම් මත දැඩි උච්චාවචනවලට භාජනය වේ. එළවළු සහ අනෙකුත් ක්ෂේත්‍ර භෝගයන් සාමාන්‍යයෙන් වර්ෂා ජලයෙන් වගා කරනු ලබන අතර නිෂ්පාදකයාට පාලනය කිරීමට හැකියාව නැති කාලගුණයේ වෙනස්වීම් මත රදා පවතී. යහපත් කාලගුණික තත්ත්වයක් පවතින කාලවලදී ඉතා ඉහළ නිෂ්පාදන තත්ත්වයක් දක්නට ලැබෙන අතර, අයහපත් කාලගුණික තත්ත්වයක් පවතින විට හිඟ තත්ත්වයක් ඇතිවේ. නිෂ්පාදකයින්ට ලැබෙන මිල ගණන් උච්චාවචනය වන හෙයින්, වගා කටයුතු සඳහා ආයෝජනය කිරීමෙන් ලැබෙන ඉපයීම් පිළිබඳව ඔවුන්ට ඇත්තේ අවිනිශ්චිත බවකි. එහෙයින් ඔවුන් කෘෂිකර්මයෙහි ආයෝජනය කිරීමට මැලිවේ. මෙය අවම යෙදවුම් මට්ටම් සහිතව බෝග වගා කිරීමට හේතු වී ඇති හෙයින් අඩු එලදාවක් ඇතිවේ. වගාවෙහි මෙම දුර්වල තත්ත්වය මග හැරීමට ගත හැකි එක් පියවරක් නම් වගාව ඇරඹීමට පෙර ගොවියාට තම නිෂ්පාදිත සඳහා ලාභදායී මිලක් සහතික කිරීමයි. නිෂ්පාදකයාට තම සම්පත් කෙතරම් හොඳින් වෙන් කළ යුතු ද යන්න තීරණය කළ හැක්කේ එවැනි තත්ත්වයකදී පමණි. ඉදිරි ගිවිසුම් එවැනි තීරණ ගැනීම දිරිමත් කරන එක් ක්‍රමයකි.

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නිෂ්පාදන ද්‍රව්‍ය පුළුල් වශයෙන් අපනයනය මුල්කරගත් වැවිලි භාණ්ඩ සහ වැවිලි නොවන භාණ්ඩ වශයෙන් කොටස් දෙකකට බෙදා වෙන් කළ හැකිය. වැවිලි නොවන භාණ්ඩ යටතට, වී, අනෙකුත් ක්ෂේත්‍ර බෝග, ගම්මිරිස්, කෝපි, කරාබු නැටි වැනි අනෙකුත් අපනයන බෝග, එළවළු සහ උද්‍යාන වගාවන් ඇතුළත් වේ. මේ නිෂ්පාදනවලින් වැඩි කොටසක් එහැන් වෙළෙඳ පොළෙහි විකුණනු ලබයි.

වැවිලි වගාවන්හි විශාල කොටසක්, එනම් තේ, රබර් සහ පොල් වෙන්දේසි ක්‍රම මගින් අලෙවි කරනු ලබයි. 1992 වර්ෂය දක්වා පෞද්ගලික විකුණුම් වූ සියයට 2 සිට සියයට 3 දක්වා ප්‍රමාණයක් හැර ඉතිරි සියළුම තේ නිෂ්පාදන කොළඹ හෝ ලන්ඩන් වෙන්දේසි මගින් පමණක් විකුණනු ලැබිණ. 1992 වර්ෂය තුළදී, තේ නිෂ්පාදනයෙන් සියයට 10 ක් දක්වා ප්‍රමාණයක් වෙන්දේසි ක්‍රමයෙන් බාහිරව සෘජුවම විකුණා ගැනීමට අවසර දෙන ලදී. කෙසේවතුදු, මේ තත්ත්වය යටතේ වුවද මිලදී ගැනීම සඳහා ඉදිරි ගිවිසුම් නොතිබුණි. මෙවැනි ඉදිරි ගිවිසුම් නොලැබීමට හේතුව වශයෙන් වාර්තා වී ඇත්තේ ඉදිරි විකුණුම් කාර්යයේ නියැලී සිටින රාජ්‍ය වැවිලි අංශයේ කළමනාකරුවන් (ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව) පසුව මිල වැඩිවීමක් සිදුවූ විට නියුණු ලෙස විවේචනයට භාජනය වීමයි. රාජ්‍ය වැවිලි ආයතන පුද්ගලකරණය කිරීම ඉදිරි රැකුම් භාර ගැනීමේ වැදගත් කොටසක් වනු ඇතැයි අපේක්ෂා කරන ලදී. පෞද්ගලිකරණය කරන ලද සමාගම්වල නිෂ්පාදනවලින් සියයට 50 දක්වා වෙන්දේසි ක්‍රමයෙන් බාහිරව විකිණීමට ඉඩදෙනු ලැබිය. කෙසේ වතුදු, දැනට ද තේ වෙළෙඳාමේදී ඉදිරි ගිවිසුම් දක්නට නොලැබේ.

රබර් නිෂ්පාදනවලින් සුළු ප්‍රමාණයක් ඉදිරි ගිවිසුම් මගින් විකුණනු ලැබේ. සමහර විශාල වතු විදේශීය ගැණුම්කරුවන් සමග සෘජුවම ඉදිරි පදනමක ගනුදෙනු කරන නමුදු, ඉදිරි ගිවිසුම වැඩි වශයෙන්ම ඇති කර ගන්නේ නැව්ගත කරන්නන් විසින් විදේශීය ගැනුම්කරුවන් සමගිනි. අපනයනය කෙරෙන සියළුම කපාපු පොල් නිෂ්පාදනයන් ඉදිරි ගිවිසුම් මගින් සිදු කෙරෙන අතර ගිවිසුම් කාලය 6 මසක් පමණ වේ. පොල්තෙල් අපනයනයන්ගෙන් සියයට 25 ක් පමණ ඉදිරි ගිවිසුම් මගින් සිදු කෙරෙන අතර ගිවිසුම් කාලය මාස 2 සිට 3 දක්වා වේ. පොල් කටු අඟුරු සහ පොල් කෙඳිවලින් සුළු ප්‍රතිශතයක් ඉදිරි ගිවිසුම් මගින් අලෙවි කෙරේ.

අනෙකුත් වර්ගවල ඉදිරි වෙළඳපොළවල් වන්නේ ප්‍රාථමික මට්ටමක පවතින ගැණුම් කරුවා සහ විකුණුම්කරුවා අතර නියම කර ගන්නා අසංවිධිත පොරොන්දුවයි. කෝපි, ගම්මිරිස් සහ කරාබු නැටි වැනි අනෙකුත් අපනයන බෝග ඉදිරි ගිවිසුම් පදනමක දේශීය වශයෙන් අලෙවි කෙරේ. මෙහිදී අස්වනු නෙලීමට සති 2 සිට 3 ක පමණ කාලයකට පෙර අසංවිධිත සම්මුතියකට එළඹේ. කලින් එකඟ වූ මිලකට සියළුම නිෂ්පාදන එක්වර මිලදී ගනු ලබන අතර, මිලදී ගන්නා විසින්ම අස්වනු නෙලීම ද සිදුකෙරේ. අඹ, මැංගුස්ටින්, රඹුටන් සහ දිවුල් වැනි උද්‍යාන බෝග සඳහා මෙවැනි අසංවිධිත ඉදිරි ගිවිසුම් ඇති කර ගනු ලැබේ. මෙවැනි අසංවිධිත ඉදිරි ගිවිසුම්වලදී විකුණුම්කරු සහ ගැණුම්කරු අතර ලිඛිත නොවන එකගත්වයක් තිබේ. විකුණුම්කරු සහ ගැණුම්කරු අතර පවතින කිට්ටු සම්බන්ධතාවයන් නිසා එම ගිවිසුම් කඩකිරීමේ සිද්ධීන් දක්නට ලැබීමද ඉතාමත් දුර්ලභ දෙයක් බවට පත්ව ඇත.

මෙවැනි අසංවිධිත ඉදිරි ගිවිසුම් මත මුදල් ණයට දෙන්නන් හෝ වෙළෙඳුන් විසින් වගා කන්නය ආරම්භ කිරීමට පෙර යෙදවුම් මිලදී ගැනීමට ණය ලබාදෙන අතර තම නිෂ්පාදිතයන් මුදල් ණයට දෙන්නාට හෝ වෙළෙන්දට විකිණීමට ගොවියා බැඳේ. මෙවැනි ගිවිසුම්වලදී මිලදී ගන්නා විසින් සාමාන්‍යයෙන් වෙළෙඳපොළෙහි මිල ගණන්වලට වඩා අඩුවෙන් මිල තීරණය කරන බැවින් අලෙවි කරන්නාට බොහෝ විට අවාසිදායක වේ.

ගර්කින් සහ දුම්කොළ වැනි මූලධමය වටිනාකමක් ඇති වගාවන් සඳහා ද දේශීය ඉදිරි අලෙවිකරණ ක්‍රමයක් පවතී. ගර්කින් සහ දුම්කොළ මිලදී ගන්නා සමාගම් විසින් තම බාහිර වගාකරුවනට ණය මත යෙදවුම් ලබාදෙන අතර ඔවුන්ගේ නිෂ්පාදිත ගිවිසගත් මිලකට මිලදී ගනු ලැබේ. වගාව ආරම්භ කිරීමට පෙර ගැනුම් මිල ප්‍රකාශ කරනු ලැබේ. වගාකරුවන් සහ මිලදී ගන්නා සමාගම අතර පවතින අන්‍යෝන්‍ය අවබෝධය හේතුවෙන් ගිවිසුම් කඩකිරීම් අවම වේ යැයි වාර්තා වී ඇත.

විධිමත් නීති පද්ධතියක් නොතිබීම හේතුවෙන් ඉදිරි ගිවිසුම් ඇතිකිරීමේ අවහිරතා ඇත. ගිවිසුම උල්ලංඝනය කරන්නට ගිවිසුම කඩකිරීමේ හේතුවෙන් දඩුවම් පැමිණවිය නොහැක. තමාගේ අන්‍යෝන්‍ය විශ්වාසයන් හා අවබෝධයන් ඇති ගැනුම්කරුවන් මත පමණක් විකුණුම්කරුවන්ට රැඳී සිටීමට සිදුවන නිසා ඉදිරි ගිවිසුම් ගණන සීමාවී ඇත.

අපනයන කෘෂි බෝග ආධාර ක්‍රමය යටතේ 1996 වර්ෂය තුළදී ලබාදුන් සංවර්ධන ආධාර ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 22 ක් දක්වා සියයට 24 කින් වැඩිවිය. පසුගිය වර්ෂයේ මෙන්ම මෙවර ද මුදා හරින ලද මුළු ආධාර ප්‍රමාණයෙන් විශාල ප්‍රමාණයක් එනම් සියයට 58 ක් ගම්මිරිස් සහ කුරුඳු වගාවන්ට ලබාදෙන ලදී. වර්ෂය තුළදී සංවර්ධන ආධාර ක්‍රමයන් හා එහි ආධාර අනුපාතයන් 1996 සිට ඉදිරියට ක්‍රියාත්මක වන පරිදි වැඩි කරන ලදී.

1996 වර්ෂය තුළදී, කෝපි, ගම්මිරිස්, කරාබු නැටි සහ වාෂ්පශීලී තෙල් හැර අනෙකුත් සෑම අපනයන බෝගයකම ජාත්‍යන්තර මිල ගණන්වල වර්ධනයක් දක්නට ලැබුණි. කෝපි මිල ගණන් සියයට 27 කින් පහත වැටුණි. මෙයට හේතු වූයේ බ්‍රසීලයේ විශාල කෝපි නිෂ්පාදනයක් බලාපොරොත්තු වීම මෙන්ම ලෝක කෝපි සැපයුම සියයට 14 කින් ඉහළ යමින් පසුගිය වර්ෂ 5 ක කාලය තුළ පැවති ඉහළම නිෂ්පාදන මට්ටම වාර්තා කිරීමයි. ජාත්‍යන්තර වෙළෙඳ පොල මිළ ගණන් අනුව යමින් දේශීය ගොවිපොළ මිල ගණන් ද පසුගිය වර්ෂයෙහි කිලෝ ග්‍රෑමයකට රුපියල් 98 සිට කිලෝ ග්‍රෑමයකට රුපියල් 62 දක්වා සියයට 37 කින් පහත වැටුණි. කළු ගම්මිරිස් සඳහා 1996 දී ලෝක වෙළඳපොළෙහි මිල සියයට 8 කින් පහත වැටුණ අතර, දේශීය වෙළෙඳපොළෙහි ගොවිපොල මිල ගණන්ද 1995 පැවති කිලෝග්‍රෑමයකට රුපියල් 111 සිට රුපියල් 99 ක් දක්වා සියයට 11 කින් අඩුවිය. කොකෝවා සහ වසාවාසි සඳහා වූ ජාත්‍යන්තර මිල ගණන්, පිළිවෙළින් සියයට 11 කින් සහ සියයට 14 කින් වර්ධනය වී පිළිවෙලින් කිලෝග්‍රෑමයකට රුපියල් 84 ක් හා

කිලෝග්‍රෑමයකට රුපියල් 260 ක් විය. මෙයට වෙනස්ව යමින් කොකෝවා සහ වසාවාසි වල දේශීය ගොවිපොළ මිල ගණන්ද වර්ෂය තුළදී පිළිවෙලින් සියයට 3 කින් සහ සියයට 2 කින් පහත වැටී, පිළිවෙලින් කිලෝග්‍රෑමයක් රුපියල් 48 ක් සහ කිලෝ ග්‍රෑමයක් රුපියල් 190 ක් විය. 1996 වර්ෂයේදී කරදමුංගු සඳහා ලෝක වෙළඳපොළ මිල ගණන් සියයට 2 කින් අඩු වුවද, ඊට වෙනස්ව ඒ සඳහා වූ දේශීය ගොවිපොළ මිල ගණන් සියයට 14 කින් වැඩිවී කිලෝ ග්‍රෑමයකට රුපියල් 383 ක් විය. 1996 වර්ෂය තුළදී අනෙකුත් අපනයන බෝග මඟින් ලද මුළු අපනයන ඉපයීම සියයට 6 කින් වර්ධනය වී රුපියල් දශලක්ෂ 7,295 ක් විය.


බහු වාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය 1996 දී හෙක්ටයාර 875 කට වඩා වැඩි බිම් ප්‍රමාණයක් ආවරණය වන පරිදි, රුපියල් දශ ලක්ෂ 106 ක මුදල් වටිනාකමින් යුත් නව ණය 730 ක් අනුමත කරන ලදී. මීට අමතරව, වර්ෂය තුළදී මෙම ව්‍යාපෘතිය යටතේ, සංවර්ධන ආධාර වශයෙන් රුපියල් දශලක්ෂ 8 ක මුදල් ප්‍රමාණයක් ද මුදාහරින ලදී.

## 3.4 දේශීය කෘෂිකර්මය

### වී

1995 / 96 රයාන දිග මෝසම් කාලය තුළදී ප්‍රධාන වී වගා කරන ප්‍රදේශවල පැවති දැඩි නියග තත්ත්වය 1996 වර්ෂයේ වී නිෂ්පාදනය කෙරෙහි අහිතකර බලපෑම් ඇති කරන ලදී. ඉහළම වී නිෂ්පාදනයක් වාර්තාකළ 1995 වගා වර්ෂය සමග සසඳන කල, 1996 දී වී, නිෂ්පාදනය සියයට 27 ක ප්‍රබල අඩුවීමක් පෙන්වමින් මෙට්‍රික් ටොන් දශලක්ෂ 2.1 ක් විය. මෙය 1979 වර්ෂයේ සිට මෙතෙක් වාර්තා වී ඇති අඩුම නිෂ්පාදන මට්ටමද විය. යල සහ මහ යන කන්න දෙකෙහිම වාර්තා වූ නිෂ්පාදනයේ අඩුවීම සමස්ත වී නිෂ්පාදනය අඩුවීම කෙරෙහි දායක විය.

1995 / 96 මහ කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් දශලක්ෂ 1.33 ක් (බුසල් දශලක්ෂ 64) ලෙස ඇස්තමේන්තු කර ඇති අතර එය 1977 / 78 මහ කන්නයේ සිට මෙතෙක් වාර්තා වී ඇති අඩුම මහ කන්නයේ නිෂ්පාදනය වේ. මෙය පසුගිය මහ කන්නයේ මුළු වී නිෂ්පාදනයට වඩා සියයට 24 කින් අඩුය. පසුගිය මහ කන්නය සමග සසඳා බලන කල, 1995 / 96 මහ කන්නය තුළදී අස්වැන්න නෙලා ගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණය සියයට 23 කින් පහත වැටීම, මෙම අයහපත් ක්‍රියාකාරිත්වයට ප්‍රධාන වශයෙන්ම හේතු විය. මහනුවර සහ නුවරඑළිය දිස්ත්‍රික්ක හැරුණ විට අනිකුත් සියලු දිස්ත්‍රික්කවල වී නිෂ්පාදනය පසුගිය වර්ෂයේ මහ කන්නයේ නිෂ්පාදනයට වඩා අඩු විය. නොකඩවා වර්ෂ අටක් මහ කන්නයේ ඉහළම වී නිෂ්පාදනය වාර්තා කළ කුරුණෑගල දිස්ත්‍රික්කය, මෙවර මහ කන්නයේ වී නිෂ්පාදනය සියයට 54 කින් මෙට්‍රික් ටොන් 224,000 සිට මෙට්‍රික් ටොන් 102,000 දක්වා පහත වැටීම හේතුවෙන්, සිව්වන ස්ථානයට පත්විය. කුරුණෑගල දිස්ත්‍රික්කය විසින් පසුගිය වර්ෂයේ මහ කන්නයේ මුළු නිෂ්පාදනයට සියයට 13 කින් දායක වීම හා සසඳා බලන කල මෙවර එය සියයට 8 ක් විණි. අනුරාධපුර දිස්ත්‍රික්කයේ 1994 / 95 මහ කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 190,000 ක් වුවද, 1995 / 96 මහ කන්නයේ එය සියයට 61 කින් පහත වැටී මෙට්‍රික් ටොන් 74,000 ක් විය. දිගුකාලීනව පැවැති නියගය සහ අවිනිශ්චිත ආරක්ෂක තත්ත්වයන් හේතුකොට ගෙන යාපනය, කිලිනොච්චිය, මුලතිව්, මන්නාරම සහ වවුනියාව යන උතුරේ දිස්ත්‍රික්ක සියල්ලම එකට ගත් කළ, 1995 / 96 මහ කන්නයේ වී නිෂ්පාදනය සියයට 80 කින් එනම්, මෙට්‍රික් ටොන් 134,000 සිට මෙට්‍රික් ටොන් 27,000 දක්වා අඩු විණි.




අඛණ්ඩව වර්ෂ තුනක් යල කන්නයේ වී නිෂ්පාදනය වැඩි වෙමින් පැවතුණද, 1996 යල කන්නයේ වී නිෂ්පාදනය සියයට 30 කින් පහත වැටී මෙට්‍රික් ටොන් 730,000 ක් හෙවත් බුසල් දශලක්ෂ 35ක් විණි. අස්වැන්න නෙලා ගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණය සියයට 31 කින් පහත වැටීම, නිෂ්පාදනය අඩුවීමට මුළුමනින්ම හේතුවිය. පසුගිය වර්ෂයේ යල කන්නය සමග සසඳන කල, 1996 වර්ෂයේ යල කන්නයෙහි ගාල්ල සහ අම්පාර හැර සෙසු සියලු දිස්ත්‍රික්කයන්හිම අඩු වූ නිෂ්පාදන මට්ටම් වාර්තා කෙරිණි. නොකඩවා තුන්වන වර්ෂයටත් අම්පාර දිස්ත්‍රික්කයේ යල කන්නයේ ඉහළම වී නිෂ්පාදනය වාර්තා කරමින් මෙට්‍රික් ටොන් 216,000 ක් නිපදවිය. මෙය මුළු යල නිෂ්පාදනයෙන් සියයට 30 කට දායක විය. එමෙන්ම, අම්පාර සහ පොළොන්නරුව දිස්ත්‍රික්ක එක්ව ගත්විට යල කන්නයේ සමස්ත වී නිෂ්පාදනයෙන් සියයට 44 කට දායක විය.

1995 වර්ෂයේ සියයට 5 ක වර්ධනයක් පෙන්නුම් කළ වී වගාවේ වාර්ෂික සාමාන්‍ය ඵලදාව පසුගිය වර්ෂයේ වූ හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 3,535 සිට 1996 වර්ෂයේ හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 3,513 ක් දක්වා සුළු අඩුවීමක් වාර්තා කරන ලදී. 1995 / 96 මහ කන්නයේ සාමාන්‍ය ඵලදාව සියයට 2 කින් අඩු වී හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 3,534 ක් වූ අතර යල කන්නයේ සාමාන්‍ය ඵලදාව සියයට 1 කින් වැඩිවී හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 3,477 ක් විය. මෙය 1983 යල කන්නයේ සිට මෙතෙක් වාර්තා වී ඇති යල කන්නයේ ඉහළම ඵලදාව විය. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ අස්වැන්න නෙලා ගන්නා ලද දළ බිම් ප්‍රමාණයෙන් සියයට 96 කට ආසන්න ප්‍රමාණයක් ප්‍රධාන වාරිමාර්ග යටතේ පවතින අතර, 1995 / 96 මහකන්නයේ ඉහළම ඵලදාව එම ප්‍රදේශවලින් වාර්තා කරන ලදී. එය හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 4,834 ක් විය. නොකඩවා වර්ෂ දහයක් පුරා යල කන්නයේ ඉහළම ඵලදාව වාර්තා කරනු ලැබූ උඩවලවේ ප්‍රදේශයේ ඵලදාව 1996 යල කන්නය තුළදී දෙවන ස්ථානයට පහත වැටිණි. හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 4,415 ක ඵලදාවක් පෙන්නුම් කරමින් අම්පාර දිස්ත්‍රික්කය යල කන්නයේ ඉහළම ඵලදාව වාර්තා කරන ලදී. කෙසේ වුවද, උඩවලවේ ප්‍රදේශයේ සාමාන්‍ය ඵලදාව හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 4,400 ක් විය.

පසුගිය මහ කන්නය සමග සසඳා බලන කල 1995 / 96 මහ කන්නයේ ප්‍රධාන වාරිමාර්ග, සුළු වාරිමාර්ග සහ වර්ෂාපෝෂිත යන සියලුම වාරිමාර්ග අංශවල සාමාන්‍ය ඵලදාව පහත වැටුණි. ප්‍රධාන වාරිමාර්ග ප්‍රදේශයන්හි සාමාන්‍ය ඵලදාව සුළු වශයෙන් අඩු වී හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 3,890 ක් විය. මේ අතර සුළු වාරිමාර්ග සහ

වර්ෂා පෝෂිත ප්‍රදේශයන්හි සාමාන්‍ය ඵලදාව පිළිවෙලින් සියයට 7 කින් සහ සියයට 6 කින් අඩුවී හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 3,061 ක් හා හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 2,646 ක් විය. 1996 යල කන්නයේ විශාල වාරිමාර්ග යටතේ වගාකළ ප්‍රදේශවල සාමාන්‍ය ඵලදාව සියයට 7 කින් වැඩිවී හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 3,820 ක් වූ අතර සුළු වාරිමාර්ග සහ වර්ෂා පෝෂිත ප්‍රදේශවල සාමාන්‍ය ඵලදාව පිළිවෙලින් සියයට 2 කින් සහ සියයට 10 කින් අඩු වී හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 3,007 ක් සහ හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 2,282 ක් විය.

රසාන දිග මෝසම් වැසි ප්‍රමාණවත් පරිදි නොලැබීම මෙන්ම නිරිත දිග මෝසම් වැසි ප්‍රමාදවීම හේතුවෙන් වාරිමාර්ග ජලයෙහි හිගයක් දක්නට ලැබුණි. මෙය, යල කන්නය තුළදී ආන්තික ඉඩම් වගා කිරීම අත් හැර වාරිමාර්ග යටතේ වූ සාරවත් කුඹුරු වගා කිරීමට හේතුවිය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, 1996 යල කන්නයේදී ප්‍රධාන වාරිමාර්ග ක්‍රම යටතේ වූ වගා බිම්වල ඵලදාවේ වර්ධනයක් දැකිය හැකි විය.

වගා වර්ෂය තුළදී වී වගා කරන ලද දළ බිම් ප්‍රමාණය නියගය හේතුවෙන් සැලකිය යුතු ලෙස සියයට 18 කින් පහත වැටී හෙක්ටයාර 748,700 ක් විය. මහ කන්නයෙහි දළ වශයෙන් වපුරන ලද බිම් ප්‍රමාණය සියයට 12 කින් පහත වැටී හෙක්ටයාර 499,000 ක් විය. මහ කන්නය තුළ විශාල වාරිමාර්ග, සුළු වාරිමාර්ග සහ වර්ෂා පෝෂිත ප්‍රදේශවල වගා කරන ලද දළ බිම් ප්‍රමාණය පිළිවෙලින් සියයට 11 කින්, සියයට 20 කින් සහ සියයට 7 කින් අඩු වී පිළිවෙලින් හෙක්ටයාර 238,500 ක්, හෙක්ටයාර 106,700 ක් සහ හෙක්ටයාර 153,700 ක් විය. මේ අතර යල කන්නය තුළ වගා කරන ලද දළ බිම් ප්‍රමාණය සියයට 28 කින් දැඩි ලෙස පහත වැටී, හෙක්ටයාර 249,800 ක් විය. රසාන දිග මෝසම් වැසි දුර්වලවීම මහ කන්නයේ වගා කටයුතු අඩාලවීම කෙරෙහි පමණක් නොව යල කන්නයේ වගා කටයුතු කෙරෙහි ද බලපෑම් ඇති කරන ලදී. එනම් ජලාශවල ජල මට්ටම අඩුවීම, යල කන්නය තුළදී ජල සම්පාදනය කළ හැකි බිම් ප්‍රමාණය අඩු කිරීමට හේතුවිය. වගා කරන ලද දළ බිම් ප්‍රමාණයෙහි අඩුවීම මහ කන්නයට වඩා යල කන්නයේ කැපී පෙනුණි. විශාල පරිමාණයේ වාරිමාර්ග ක්‍රම යටතේ සහ සුළු වාරිමාර්ග ක්‍රම යටතේ වගා කරන ලද බිම් ප්‍රමාණය පිළිවෙලින් සියයට 27 කින් සහ සියයට 38 කින් අඩු වූ අතර වර්ෂා පෝෂිත ප්‍රදේශයන්හි වගා කරන ලද බිම් ප්‍රමාණයද සියයට 22 කින් පහත වැටිණි.

පසුගිය වර්ෂය සමග සසඳන කල 1996 වගා වර්ෂය තුළ අස්වැන්න නෙලා ගන්නා ලද මුළු දළ බිම් ප්‍රමාණය සියයට 26 කින් දැඩි ලෙස පහත වැටී හෙක්ටයාර 660,100 ක් විය. මෙය, මහ කන්නය තුළ අස්වැන්න නෙලා ගන්නා ලද බිම් ප්‍රමාණය සියයට 23 කින් පහත වැටී හෙක්ටයාර 425,000 ක් වීම හා යල කන්නය තුළ අස්වැන්න නෙලා ගන්නා ලද බිම් ප්‍රමාණය සියයට 31 කින් පහත වැටී හෙක්ටයාර 234,900 ක් වීමේ සමුච්චිත බලපෑම වේ.

1994/95 මහ කන්නයේ සිදුවූ වගා හානියේ ප්‍රමාණය සියයට 3 ක් වුවද, 1995 / 96 මහ කන්නය තුළ දිගටම පැවති දැඩි නියග තත්ත්වය නිසා එය සියයට 15 ක් දක්වා ඉහළ නැගුණි. පසුගිය වර්ෂයේ යල කන්නයේ වූ සියයට 2 ක වගා හානි ප්‍රමාණය සමග සසඳන කල 1996 යල කන්නයේ වගා හානි ප්‍රමාණය සියයට 6 ක් දක්වා වැඩිවිය. වගා වර්ෂය තුළ ගොවීන් 25,592 ක් තම වගා පාළු සඳහා රක්ෂණය ලබාගෙන තිබුණි. වගා රක්ෂණය ලබාගෙන තිබූ මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර 26,200 කි.

පසුගිය වගා වර්ෂය සමග සසඳන කල ජාතික පොහොර ලේකම් කාර්යාලයේ ඇස්තමේන්තුවලට අනුව, 1996 වගා වර්ෂය තුළ වී වගා අංශයට නිකුත් කර ඇති පොහොර ප්‍රමාණය සියයට 18 කින් අඩු වී මෙට්‍රික් ටොන් 233,000 ක් විය. මෙසේ පොහොර නිකුත් කිරීම වර්ෂය තුළ විශාල වශයෙන් අඩුවීමට හේතු වූයේ වගාකරන ලද බිම් ප්‍රමාණය විශාල වශයෙන් පහත වැටීම මෙන්ම, වගා හානි වූ ප්‍රමාණය ඉහළ යාම නිසාය. 1995 වගා වර්ෂයේදී පොහොර සහනාධාරය නැවත හඳුන්වාදීමේ ප්‍රතිඵලයක් ලෙස පොහොර භාවිතය විශාල වශයෙන් වැඩි වුවද 1995 / 96 මහ කන්නය තුළ වී වගා අංශය සඳහා යොදන ලද පොහොර ප්‍රමාණය සැලකිය යුතු ලෙස සියයට 16 කින් පහත වැටී මෙට්‍රික් ටොන් 143,000 ක් විය. වගා වර්ෂය තුළ පැවති දැඩි නියග තත්ත්වය නිසා 1996 යල කන්නය සඳහා නිකුත් කරන ලද පොහොර ප්‍රමාණයද සියයට 21 කින් දැඩි ලෙස අඩු වී මෙට්‍රික් ටොන් 90,000 ක් විය.

නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ පසුගිය වර්ෂයේ වී වගා අංශය සඳහා නිකුත් කළ ණය ප්‍රමාණය වූ රුපියල් දශලක්ෂ 792 සමග සසඳන කළ වර්ෂය තුළදී වපුරන ලද බිම් ප්‍රමාණය තියුණු ලෙස පහත වැටීම හේතුවෙන් මෙවර ලබාදුන් ණය ප්‍රමාණය අඩකින් පහත වැටී

**සංඛ්‍යා සටහන 3.6**

**වී වගා අංශය පිළිබඳව සංඛ්‍යා**

| අයිතමය | ඒකකය | 1995 (අ) | | | 1996 (ආ) | | |
|---|---|---|---|---|---|---|---|
| | | මහ | යල | එකතුව | මහ | යල | එකතුව |
| දළ වශයෙන් වපුරන ලද බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 567 | 348 | 915 | 499 | 250 | 749 |
| අස්වැන්න කපාගන්නා ලද බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 549 | 340 | 890 | 425 | 235 | 660 |
| අස්වැන්න කපාගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 489 | 306 | 795 | 377 | 210 | 587 |
| නිෂ්පාදනය | මෙ. ටො. දහස් | 1,761 | 1,049 | 2,810 | 1,331 | 730 | 2,061 |
| | බුසල් දහස් | 84,407 | 50,271 | 134,678 | 63,807 | 34,994 | 98,801 |
| ඵලදාව (ඇ) | හෙක්ටයාරයකට කි.ග්‍රෑ. | 3,603 | 3,427 | 3,535 | 3,534 | 3,477 | 3,513 |
| දෙන ලද ණය ප්‍රමාණය | රුපියල් දශ ලක්ෂ | 571 | 221 | 792 | 308 | 88 | 396 |
| සහතික මිල ක්‍රමය යටතේ මිලදී ගැනීම් | මෙ. ටො. දහස් | 197 | 85 | 282 | 1 | - | 1 |
| සහල් ආනයනය | මෙ. ටො. දහස් | - | - | 9 | - | - | 341 |
| (වී සමානය) | (මෙ. ටො. දහස්) | (-) | (-) | (14) | (-) | (-) | (488) |

(අ) සංශෝධිතය
(ආ) තාවකාලිකය
(ඇ) අස්වනු කැපීමේ සමීක්ෂණයන්ගෙන් ගත් දත්තයන් පදනම් කොටගත් ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා තොරතුරු උපයෝගිකරගෙන මහ සහ යල කන්න සඳහා වූ හෙක්ටයාරයක සාමාන්‍ය ඵලදාව ගණනය කරන ලදී. මුළු වී ප්‍රමාණය අස්වැන්න නෙලා ගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණයෙන් බෙදීමෙන් හෙක්ටයාරයක වාර්ෂික සාමාන්‍ය ඵලදාව ගණනය කරන ලදී.

මූලයන්: ජන ලේඛන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
කෘෂිකර්ම, ඉඩම් හා වන සම්පත් අමාත්‍යාංශය
වී අලෙවි මණ්ඩලය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

රුපියල් දශලක්ෂ 396 ක් විය. මෙය 1990 වගා වර්ෂයෙන් පසු වී වගා අංශය සඳහා ලබාදී ඇති අඩුම ණය ප්‍රමාණය වේ. පසුගිය වර්ෂයේ මහ කන්නය සමග සසඳන කල මෙවර මහ කන්නය සඳහා දෙන ලද ණය ප්‍රමාණය සියයට 46 කින් පහත වැටී රුපියල් දශලක්ෂ 308 ක් විය. එමෙන්ම 1996 යල කන්නය සඳහා දෙන ලද ණය ප්‍රමාණය ද පසුගිය යල කන්නයට වඩා සියයට 60 කින් පහත වැටී රුපියල් දශලක්ෂ 88 ක් විය.

වගා කරන ලද බිම් ප්‍රමාණය මෙන්ම අස්වැන්න නෙලා ගන්නා ලද බිම් ප්‍රමාණය පහත වැටීම හේතුවෙන් වී නිෂ්පාදනයෙහි විශාල පහත වැටීමක් සිදුවූ බැවින් විවෘත වෙළෙඳපලේ වී මිල ගණන් සහතික මිල වන බුසලකට රුපියල් 155 (කිලෝ ග්‍රෑමයකට රුපියල් 7.42) ට වඩා ඉහළ මට්ටමක පැවතුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, වී අලෙවි මණ්ඩලය 1995 වර්ෂයේදී මිලදී ගන්නා ලද වී ප්‍රමාණය වූ මෙට්‍රික් ටොන් 282,000 හා සසඳන කල විමසුමට ලක් කරන වර්ෂය තුළදී මිලදී ගෙන ඇත්තේ වී මෙට්‍රික් ටොන් 1,000 පමණය.

දේශීය සහල් නිෂ්පාදනයේ පැවැති අඩුව පියවා ගැනීම සඳහා 1996 වර්ෂයේදී සහල් මෙට්‍රික් ටොන් 341,000 ක් ආනයනය කරන ලදී. 1977 වර්ෂයෙන් පසු ආනයනය කල ඉහළම සහල් ප්‍රමාණය මෙය වේ. 1977 දී ආනයනය කළ සහල් ප්‍රමාණය දළ වශයෙන් මෙට්‍රික් ටොන් 542,000 ක් විය. සහල් ආනයනය දිරි ගැන්වීම සඳහා 1996 අප්‍රියෙල් මස සිට මාස හයක් සඳහා ආනයනික සහල් සඳහා වන තීරු බදු ඉවත් කරන ලදී. පසුව මෙය තවදුරටත් 1996 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කරන ලදී.

## සීනි

1996 වර්ෂයෙහි සීනි නිෂ්පාදනය සියයට 3 කින් වැඩි වී මෙට්‍රික් ටොන් 73,000 ක් වෙමින් 1994 වර්ෂයෙහි වාර්තාගත ඉහළම නිෂ්පාදනය වූ මෙට්‍රික් ටොන් 72,275 ඉක්මවන ලදී. පැල්වත්ත සහ හිඟුරාණ කර්මාන්තශාලාවල නිෂ්පාදන මට්ටම් පිළිවෙලින් සියයට 9 කින් සහ සියයට 12 කින් වැඩි වූ අතර. සෙවනගල කර්මාන්ත ශාලාවෙහි නිෂ්පාදනය සියයට 14 ක පහත වැටීමක් වාර්තා කරන ලදී. කර්මාන්තශාලා තුන විසින් මිරිකන ලද උක්දඬු ප්‍රමාණය සියයට 5 කින් වැඩි වී මෙට්‍රික් ටොන් 903,000 ක් විය. වර්ෂය තුළ සමහර කාලවල හිඟුරාණ කර්මාන්ත ශාලාවෙහි ඇති වූ සේවක ආරවුල් එහි නිෂ්පාදන කටයුතුවලට බලපාන ලදී.

1996 වර්ෂයේදී මෙම කර්මාන්තශාලා තුන සඳහා වන සමස්ත සීනි ලබාගැනීමේ අනුපාතය, නොකඩවා සිවු වෙනි වර්ෂයටත් අඩු වෙමින් 1995 වර්ෂයේදී සියයට 8.22 ක සිට 1996 වර්ෂයේදී සියයට 8.05 දක්වා පහත වැටුණි. මෙසේ දිගින් දිගට සමස්ත සීනි ලබා ගැනීමේ අනුපාතය පහත වැටීමට හේතු කවරේද යන්න කෙරෙහි උක් පර්යේෂණ ආයතනයේ අවධානයට යොමුවීම වැදගත්වේ.

1996 වර්ෂය තුළදී සෙවනගල සහ පැල්වත්ත කර්මාන්ත යටතේ ඇති කේන්ද්‍රීය වගාවන්හි සාමාන්‍ය උක්දඬු ඵලදාව අඩුවිය. වර්ෂය තුළ පැවැති දැඩි නියගය හේතුවෙන් සෙවනගල කර්මාන්තශාලාවේ සාමාන්‍ය උක්දඬු ඵලදාව සියයට 26 කින් පහත වැටී හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 65 ක් වූ අතර, පැල්වත්ත කර්මාන්ත ශාලවේ සාමාන්‍ය ඵලදාවද සියයට 30 කින් පහත වැටී හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 46 ක් විය. නොකඩවා හයවන වර්ෂයටත් සෙවනගල කර්මාන්තශාලාව ඉහළම සාමාන්‍ය ඵලදාව වාර්තා කළේය. සෙවනගල සහ පැල්වත්ත කර්මාන්තශාලාවල ගණනය කළ සමස්ත සාමාන්‍ය ඵලදාව සියයට 24 කින් අඩුවී හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 52 ක් විය.


පැල්වත්ත කර්මාන්තශාලාව මගින්, පෞද්ගලික වැවිලි කරුවන්ගෙන් මිලදී ගත් උක්දඬු ප්‍රමාණය මෙට්‍රික් ටොන් 305,000 දක්වා සියයට 30 කින් වැඩි වූ අතර, සෙවනගල කර්මාන්තශාලාව මගින් මිලදී ගත් උක්දඬු ප්‍රමාණය ටොන් 1,800 දක්වා සියයට 6 කින් අඩු විය. 1995 වර්ෂයේදී පැල්වත්ත කර්මාන්තශාලාවේ මිරිකන ලද උක්දඬු ප්‍රමාණයෙන් සියයට 48 ක් වූ පෞද්ගලික අංශයෙන් මිලදී ගත් උක්දඬු ප්‍රමාණය, 1996 වර්ෂය තුළදී සියයට 55 ක් විය. සෙවනගල කර්මාන්තශාලාව පෞද්ගලික අංශයෙන් මිලදී ගත් උක්දඬු ප්‍රමාණය, එම කර්මාන්ත ශාලාවේ මිරිකන ලද මුළු උක්දඬු ප්‍රමාණයෙන් සියයට 1 කට දායක විය.

**සංඛ්‍යා සටහන 3.7**
**සීනි නිෂ්පාදන අංශය පිළිබඳ සංඛ්‍යා**

| අයිතමය | ඒකකය | හිඟුරාණ සීනි කම්හල | | සෙවනගල සීනි කම්හල | | පැල්වත්ත සීනි කම්හල | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1995(අ) | 1996(ආ) | 1995(අ) | 1996(ආ) | 1995(අ) | 1996(ආ) | 1995 (අ) | 1996 (ආ) |
| උක් වගාකරන ලද මුළු බිම් ප්‍රමාණය (නිර්වගාව ඇතුළුව) (ඇ) | හෙක්ටයාර | 2,378 | ලැ. නො. | 3,185 | 3,282 | 5,536 | 5,228 | 11,099 | 8,510 (ඈ) |
| උක්දඬු කපාගත් බිම් ප්‍රමාණය (ඇ) | හෙක්ටයාර | 1,827 | 1,329 | 2,503 | 2,699 | 3,846 | 5,454 | 8,176 | 9,482 |
| කපාගත් උක්දඬු ප්‍රමාණය (ඇ) | මෙට්‍රික් ටොන් | 79,543 | ලැ. නො. | 219,902 | 175,805 | 255,332 | 250,697 | 554,777 | 426,502 (ඈ) |
| පෞද්ගලික අංශයෙන් මිලට ගත් උක්දඬු ප්‍රමාණය | මෙට්‍රික් ටොන් | 65,565 | ලැ. නො. | 1,862 | 1,754 | 234,922 | 305,183 | 302,349 | 306,937 |
| අඹරන ලද උක්දඬු ප්‍රමාණය | මෙට්‍රික් ටොන් | 145,108 | 169,530 | 221,801 | 177,588 | 491,254 | 555,880 | 858,163 | 902,998 |
| සාමාන්‍ය ඵලදාව (ඇ) | හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් | 46 | ලැ. නො. | 88 | 65 | 66 | 46 | 68 | 52 |
| නිෂ්පාදනය කළ සීනි ප්‍රමාණය (අපතේ යන සීනිවලින් කළ නිෂ්පාදනය හැර) | මෙට්‍රික් ටොන් | 9,680 | 10,830 | 18,654 | 16,024 | 42,234 | 46,156 | 70,568 | 73,010 |
| සීනි ලබා ගැනීමේ ප්‍රතිශතය (ඉ) | % | 6.67 | 6.39 | 8.41 | 9.02 | 8.60 | 8.30 | 8.22 | 8.05 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) කේන්ද්‍රීය වගාවන් සහ බිම්කට්ටි කරුවන් සතු වගාවන්ද ඇතුළත් වේ
(ඈ) හිඟුරාන සීනි කම්හලේ දත්ත ඇතුළත් නොවේ
(ඉ) සීනි ලබාගැනීමේ ප්‍රතිශතය = $\frac{\text{නිෂ්පාදනය කළ සීනි ප්‍රමාණය}}{\text{අඹරන ලද උක්දඬු ප්‍රමාණය}} \times 100$

මූලයන් : සීමාසහිත පැල්වත්ත සීනි කර්මාන්තායතනය
සීමාසහිත සෙවනගල සීනි කර්මාන්තායතනය
සීමාසහිත හිඟුරාණ සීනි කර්මාන්තයතන




ශ්‍රී ලංකාවේ සීනි කර්මාන්තයෙහි ක්‍රියාකාරිත්වය අපේක්ෂාවන්ට වඩා බොහෝ පහත් තත්ත්වයක පවතී. 1980 ගණන්වල මැද භාගයේදී පැල්වත්ත සහ සෙවනගල සීනි කර්මාන්තවලට අනුමැතිය දෙනු ලැබූ අවස්ථාවේදී 1995 වන විට, ශ්‍රී ලංකාවට සීනි මෙට්‍රික් ටොන් 150,000 ක් පමණ නිපදවීමට හැකිවීම මගින් මුළු දේශීය සීනි ඉල්ලුමින් සියයට 45 ක පමණ ස්වයංපෝෂිත අනුපාතයක් කරා ළඟා විය හැකිවේ යැයි ද අපේක්ෂා කරන ලදී. කෙසේ වෙතත්, සැබවින්ම ලබා ගැනීමට හැකිවූයේ ඉලක්කයෙන් සියයට 50 ටත් වඩා අඩු ප්‍රමාණයකි. 1996 වර්ෂයේදී දේශීය නිෂ්පාදනය මුළු සීනි සැපයුමෙන් සියයට 16 කට දායක විය. 1986 වර්ෂයේදී කිලෝ ග්‍රෑම් 22.6 ක් වූ එක් පුද්ගලයකු සඳහා සැපයුණු සීනි ප්‍රමාණය 1996 දී කිලෝ ග්‍රෑම් 24.8 ක් විය. 1995 වර්ෂය තුළදී ආනයනය කරන ලද සීනි ප්‍රමාණය වූ මෙට්‍රික් ටොන් 417,000 සමග සසඳා බලන කල, 1996 වර්ෂයේදී ආනයනය කරන ලද සීනි ප්‍රමාණය මෙට්‍රික් ටොන් 381,000 විය.

## අනෙකුත් ක්ෂේත්‍ර බෝග

අනෙකුත් ක්ෂේත්‍ර බෝග යටතේ ගැනෙන සමහර ප්‍රධාන බෝග සැලකිය යුතු ඉහළ නිෂ්පාදන මට්ටම්ද, තවත් සමහර බෝග අඩු නිෂ්පාදන මට්ටම්ද පෙන්නුම් කරමින්, අනෙකුත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදනය අංශයේ මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්විය. අර්තාපල්, කව්පි සහ මුං ඇට නිෂ්පාදනය පසුගිය වසරට වඩා වැඩි වුණි. වගා කරන ලද බිම් ප්‍රමාණය සියයට 18 කින් අඩුවුවද, අර්තාපල් නිෂ්පාදනය සියයට 23 කින් ඉහළ ගියේය. මෙය හුදෙක්ම වැඩි වූ ඵලදාවේ ප්‍රතිඵලයකි. මහ කන්නයේ අර්තාපල් නිෂ්පාදනය සියයට 55 කින් වැඩිවිය. වගාකරන ලද බිම් ප්‍රමාණය අඩුවීම නිසා යල කන්නයේ අර්තාපල් නිෂ්පාදනය, ඉකුත් යල කන්නයේ අර්තාපල් නිෂ්පාදනයට වඩා සියයට 11 කින් පහත වැටුණි. පසුගිය වර්ෂයේ නිෂ්පාදනයට වඩා කව්පි නිෂ්පාදනය සියයට 6 කින්ද, මුං ඇට නිෂ්පාදනය සියයට 4 කින් ද වැඩිවිය. මහ සහ යල යන දෙකන්නෙහිම කව්පි නිෂ්පාදනයේ වැඩිවීම සමස්ත නිෂ්පාදන වර්ධනයට හේතුවිය. මහ කන්නයේ මුං ඇට නිෂ්පාදනය සියයට 7 කින් ඉහළ ගිය අතර, වගා කරන ලද බිම් ප්‍රමාණය සියයට 7 කින් පහත වැටීම නිසා යල කන්නයේ නිෂ්පාදනය සියයට 4 කින් පහත වැටුණි.

1996 වර්ෂය තුළදී මිරිස් සහ ලොකු ළූණු නිෂ්පාදනය පිළිවෙලින් සියයට 14 කින් සහ සියයට 35 කින් අඩුවිය. මිරිස් නිෂ්පාදනයෙහි මෙම පහත වැටීමට මහ කන්නයේ නිෂ්පාදනය සියයට 15 කින් හා යල නිෂ්පාදනය සියයට 11 කින් පහත වැටීම හේතුවිය. යල කන්නයේ මිරිස් වගාවට නියගයෙන් පමණක් නොව කොළ කොඩවීමේ රෝගයෙන්ද බලපෑම් ඇතිවිය.

මිරිස්, ළූණු හා අර්තාපල් යන ඉහළ වටිනාකමක් ඇති බෝග හැරුණු කොට අනෙකුත් ක්ෂේත්‍ර බෝග ගෙවතු වල හා කුඩා ඉඩම් කැබලිවල වැසි ජලයෙන් වගා කෙරේ. සාමාන්‍යයෙන් ඉහළ වටිනාකම් ඇති බෝග වගාකරනු ලබන්නේ සුක්ෂම වගා ක්‍රම උපයෝගී කර ගනිමින් වාරිමාර්ග ක්‍රම යටතේ වේ. ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ තාවකාලික ඇස්තමේන්තුවලට අනුව, 1995 වසර හා සසඳන කල නියගය හේතුවෙන් 1996 වසරේ අනෙකුත් ක්ෂේත්‍ර බෝග යටතේ වූ මුළු බිම් ප්‍රමාණය සියයට 12 කින් පහත වැටී හෙක්ටයාර 140,836 ක් විය. මෙම අඩුවීම 1995 / 96 මහ කන්නයෙහි (සියයට 11 කින්) මෙන්ම 1996 යල කන්නයෙහිද (සියයට 13 කින්) පිළිඹිබු විය. කෙසේ වුවද, කව්පි හා මුං ඇට වගාකරන ලද බිම් ප්‍රමාණය 1995 වර්ෂයේ පැවැති මට්ටමට වඩා වැඩි විය. (15 වැනි සංඛ්‍යා සටහන)

පසුගිය වර්ෂය හා සසඳන කළ 1996 වගා වර්ෂය තුළදී මිරිස් වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය සියයට 15 කින් අඩුවිය. මහ සහ යල යන කන්න දෙකෙහිම මිරිස් වගාකරන ලද මුළු බිම් ප්‍රමාණය අඩුවීම මෙම සමස්ත පහත වැටීමට හේතුවිය. නියගයෙහි ප්‍රතිඵලයක් වශයෙන් වාරිමාර්ග ජලය නොලැබීම නිසා කරන ලද බිම් ප්‍රමාණය පහත හෙලීමට හේතුවිය. පසුගිය වසරෙහි අනුරූප කාලච්ඡේදයන් හා සසඳන කල මහ කන්නයේදී මිරිස් වගාකළ බිම් ප්‍රමාණය සියයට 15 කින් පහත වැටුණ අතර, යල කන්නයේදී වගා කල බිම් ප්‍රමාණය සියයට 14 කින් පහත වැටුණි. 1996 වසර තුළ අනෙකුත් ක්ෂේත්‍ර බෝගයන්හි වගා හානි වෙනුවෙන් රක්ෂණය කරන ලද මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර 142 ක් වූ අතර, මෙය මුළු බිම් ප්‍රමාණයෙන් සියයට 0.1 ක ප්‍රමාණයක් පමණ වන බව ගණන් බලා ඇත.

දේශීය ගොවියන් ආරක්ෂා කිරීමේ අරමුණ ඇතිව මිරිස්, ළූණු සහ අර්තාපල් ආනයනය සීමාකර තිබුණි. 1996 ජුලි මාසය වන තෙක් කෘෂිකර්ම, ඉඩම් හා වන සම්පත් අමාත්‍යාංශයේ උපදෙස් මත සහ දේශීය නිෂ්පාදනය පදනම් කරගෙන මෙම ද්‍රව්‍ය ආනයනය සඳහා අවසර දෙන ලදී. 1996 මැද භාගයේදී රජය මෙම ද්‍රව්‍ය නිදහස්ව ආනයනය කිරීමට ඉඩ සැලසීය. තවද මෙම ආනයන භාණ්ඩ සඳහා පිරිවැටුම් බද්ද ද ඉවත් කෙරිණි. 1996 නොවැම්බර් මාසයේදී, මෙකී ද්‍රව්‍ය මත වූ ආනයන තීරු බද්ද සියයට 35 සිට සියයට 20 දක්වා අඩු කෙරිණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් විශේෂයෙන් අර්තාපල්, රතුළූණු හා ලොකු ළූණු ආනයනය සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර එම ද්‍රව්‍යයන්හි දේශීය මිල ගණන් පහත වැටිණි. මෙම පියවරයන්හි ක්ෂණික ප්‍රතිලාභීන් වූයේ පාරිභෝගිකයන්ය. වර්ෂය තුළ දේශීය අර්තාපල් නිෂ්පාදනය සියයට 23 කින් ඉහළ ගියද, පරිභෝජනය සඳහා අර්තාපල් ආනයනය මෙට්‍රික් ටොන් 25,740 ක් දක්වා දෙගුණයකටත් වඩා වැඩිවිය. 1996 වර්ෂය තුළ බීජ අර්තාපල් ආනයනය මෙට්‍රික් ටොන් 5,200 දක්වා සියයට 63 කින් අඩුවිය.

වී අලෙවි මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරණු ලබන, පදනම් මිල ක්‍රමය 1996 වසර තුළ ක්‍රියාත්මක නොවිය. සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව (ස.තො.ස.), මගින් පසුගිය වර්ෂය තුළදී දේශීය වශයෙන් මිලදී ගත් මිරිස් ප්‍රමාණය වූ මෙට්‍රික් ටොන් 426 සමග සසඳා බලන කල 1996 වර්ෂය තුළදී මිලදී ගෙන ඇති මිරිස් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 1,849 ක් විය. වර්ෂය තුළදී ස.තො.ස. ලොකු ළූණු මෙට්‍රික් ටොන් 1,088 ක් හා මුං ඇට මෙට්‍රික් ටොන් 1,061 ක්ද, මිලදී ගෙන ඇත.

පාථුල පර්යේෂණ සහ අත්හදා බැලීම් වලින් පසුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් 1996 පෙබරවාරි මාසයේදී නව මිරිස් ප්‍රභේදයක් (අරුනළු) හඳුන්වා දී ඇත. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පවසන ආකාරයට මෙම ප්‍රභේදය ඉහළ ඵලදාවකින් යුක්තවීම හා ඇන්ත්‍රැක්නෝස් රෝගයට ඔරොත්තු දීමේ හැකියාව ඇති බැවින්, ගොවියන් වැඩි කැමැත්තක් දක්වන අතර, තද රතු පැහැයෙන් හා වඩාත් සැර ස්වභාවයකින් යුක්ත බැවින්, පාරිභෝගිකයෝද ප්‍රිය කරති.

## 3.5 ධීවර සහ පශු නිෂ්පාදනය

### ධීවර

ශ්‍රී ලංකාවේ සමස්ත මත්ස්‍ය නිෂ්පාදනයට මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය (වෙරළ බඩ සහ ගැඹුරු මුහුද) සහ ජලජීවී මත්ස්‍ය නිෂ්පාදනය (මිරිදිය මත්ස්‍ය සහ වෙරළ බඩ කලපු ජලයේ ඇති කරන ඉස්සන් සහ තටාකවල ඇති කරන ඉස්සන්) දායක වෙයි. 1996 වර්ෂයේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ තාවකාලික ඇස්තමේන්තු වලට අනුව, මුළු මත්ස්‍ය නිෂ්පාදනය සියයට 4 කින් අඩුවී මෙට්‍රික් ටොන් 228,550 ක් විය. වර්ෂයේ දෙවන භාගය තුළ ඇති වූ විදුලි බලය කපා හැරීමේ ප්‍රතිඵලයක් වශයෙන් අයිස් නිෂ්පාදනය අඩුවීමෙන් බහු දින බෝට්ටුවලට සාමාන්‍ය මුහුදු කටයුතු කරගෙන යාමට නොහැකිවීම සහ අහිතකර ආරක්ෂක තත්ත්වය හේතුවෙන් උතුරු සහ නැගෙනහිර පළාත්වල මත්ස්‍ය නිෂ්පාදනය අඩුවීම මුළු මත්ස්‍ය නිෂ්පාදනය පහත වැටීමට හේතු විය. මුහුදු ධීවර අනු අංශය, මුළු මත්ස්‍ය නිෂ්පාදනයට සියයට 90 කින් පමණ දායක වූ අතර 1995 වර්ෂයේදී එය සියයට 92 ක් විය. මෙම අංශයේ නිෂ්පාදනය 1995 වර්ෂයේ මෙට්‍රික් ටොන් 217,550 සමග සසඳ බලන කල, 1996 වර්ෂයේදී සියයට 5 ක අඩුවීමක් පෙන්නුම් කරමින්, මෙට්‍රික් ටොන් 206,300 ක් විය. මහාද්වීපික තටකය ආසන්නයේ කෙරෙන වෙරළබඩ මත්ස්‍ය නිෂ්පාදනය, මුහුදු මත්ස්‍ය නිෂ්පාදනයෙන් සියයට 72 කට දායක විය.

ජලජීවී මත්ස්‍ය නිෂ්පාදනය සියයට 11 ක වර්ධනයක් වාර්තා කරමින් මෙට්‍රික් ටොන් 22,250 ක් විය. 1996 වර්ෂයේ මුල්කාලය තුළදී ඉස්සන් වගාවට වැළඳුණු සුදු පුල්ලි රෝගය සමහර ගොවිපළවල නිෂ්පාදනයට බලපෑම් ඇති කළද, එය ඉතා ඉක්මණින් මැඩ පවත්වා ගැනීමට හැකි වූ නිසා මෙසේ මෙම අංශයේ මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැගුණි. මෙම ජලජීවී මත්ස්‍ය නිෂ්පාදනය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ජලාශවල ඇඟිල්ලන් (කුඩා මත්ස්‍ය පැටව්) තැන්පත් කිරීම (මිරිදිය ධීවර අංශය සඳහා), උසස් කළමනාකාරිත්වය සහ දැනුවත් කිරීමේ වැඩ පිළිවෙලවල්ය. දැනට, ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය මගින් මසුන් බෝ කරන මධ්‍යස්ථාන තුනක් දඹුල්ල, උඩවලවේ සහ ඉඟිනියාගල ස්ථානගත කොට ඇත. එනමුත් 1989 වර්ෂයේදී මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය සඳහා දෙන ලද රාජ්‍ය අනුග්‍රහයන් නවතා දැමීම නිසා 1990 දී මෙම අංශයේ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 40,000 සිට 1994 දී මෙට්‍රික් ටොන් 12,000 දක්වා පහත වැටුණි. එහෙත් මෙම අංශයට රාජ්‍ය ආධාර නැවත ලැබීමක් දැකිය හැක. ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය මගින් ජල ජීවී අනු අංශය සංවර්ධනය කිරීමේ ප්‍රධාන අරමුණු වන්නේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීමෙන් ගම්බද ජනතාවට ලාභදායීව මාංශ ජනක ධාතු (ප්‍රෝටීන්) ලබාගැනීමේ මූලාශ්‍රයක් ඇති කිරීම, ආදායම් හා රැකියා අවස්ථා ජනනය කිරීම සහ විදේශ විනිමය උපයා ගැනීමය. ඉස්සන් වගාකිරීම වයඹ පළාතේ ලාභ උපදවන ව්‍යාපාරයක් බවට පත්වී ඇති අතර, මෙමගින් හෙක්ටයාර 2,430 කට ආසන්න බිම් ප්‍රදේශයක් ආවරණය වන පරිදි ගොවිපළවල් 875 ක් පමණ ඇත. මෙයින් හෙක්ටයාර 1,050 ක බිම් ප්‍රමාණයක් ආවරණය වන පරිදි හෙක්ටයාර 4 ට වැඩි ගොවිපළවල් 64 ක්ද, හෙක්ටයාර 810 ක් ආවරණය වන පරිදි හෙක්ටයාර 4 ට අඩු ගොවිළවල් 311 ක්ද පවත්වාගෙන යනු ලැබේ. මෙයට අමතරව, හෙක්ටයාර 570 කට ආසන්න බිම් ප්‍රමාණයක් ආවරණය වන පරිදි නීත්‍යානුකූල නොවන කුඩා ගොවිපළවල් 500 ක් පමණ පවත්වා ගෙන යනු ලැබේ.

**සංඛ්‍යා සටහන 3.8**
**මත්ස්‍ය නිෂ්පාදනය**

මෙට්‍රික් ටොන්

| අනු අංශ | 1994 | 1995 (අ) | 1996 (ආ) |
|---|---|---|---|
| මුහුදු මත්ස්‍ය (ඇ) | 212,000 | 217,550 | 206,300 |
| ජල ජීවී (ඈ) | 12,000 | 20,000 | 22,250 |
| එකතුව | 224,000 | 237,550 | 228,550 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) මුහුදු බඩ හා ගැඹුරු මුහුදු ධීවර අංශයන්.
(ඈ) 1994 වන තෙක් මිරිදිය මත්ස්‍ය අංශය පමණක් ඇතුළත් වේ. 1995 සිට මිරිදිය අංශය, වෙරළබඩ කලපු ජලයෙහි ඉස්සන් සහ වගා කරන ලද ඉස්සන් නිෂ්පාදනයද ඇතුළත් වේ.

මූලය: ධීවර සහ ජලජ සංවර්ධන අමාත්‍යාංශය

ලංකා ධීවර සංස්ථාව ප්‍රධාන වශයෙන් පාරිභෝගිකයන් සඳහා මසුන් බෙදා හැරීමේ සහ මත්ස්‍ය කර්මාන්තය සඳහා අවශ්‍ය වන අයිස් නිෂ්පාදනය කිරීමේ කටයුතු වල නිරත වේ. පසුගිය වසරේදී මෙන්ම ලංකා ධීවර සංස්ථාව සුළු මත්ස්‍ය ප්‍රමාණයක් අලෙවි කර ඇති අතර, එය මුළු මත්ස්‍ය නිෂ්පාදනයෙන් සියයට 1 ක් පමණ වේ. 1995 වර්ෂය සමග සසඳා බලන කල, 1996 වර්ෂයේදී ලංකා ධීවර සංස්ථාව මිලදී ගත් මත්ස්‍ය ප්‍රමාණය සියයට 13 ක අඩුවීමක් පෙන්නුම් කරමින් මෙට්‍රික් ටොන් 2,086 ක් විය. ලංකා ධීවර සංස්ථාව මෙම මසුන් මිලදී ගෙන ඇත්තේ පෞද්ගලික ධීවරයන් සහ ආයෝජන මණ්ඩලයෙහි ලියාපදිංචි වී ඇති ධීවර සමාගම් වැනි පෞද්ගලික අංශයෙනි.

නිදහස් වෙළෙඳ ප්‍රතිපත්තිය අනුගමනය කිරීමෙන් පසු ප්‍රථම වරට ලංකා ධීවර සංස්ථාව විසින් 1996 වර්ෂයේදී මෙට්‍රික් ටොන් 175 ක මාළු ප්‍රමාණයක් ආනයනය කර ඇත. අවුරුදු 10 කට ආසන්න කාලයක් තුළ වසා දමා තිබූ අනුරාධපුරයේ අයිස් කර්මාන්තශාලාවේ වැඩ කටයුතු නැවත ආරම්භ කිරීම නිසා ලංකා ධීවර සංස්ථාවේ අයිස් නිෂ්පාදනය සියයට 29 කින් වැඩි වී මෙට්‍රික් ටොන් 6,826 ක් විය.

මුහුදු සම්පත් පිළිබඳ ඇති තොරතුරු මදකම, පහත් මට්ටම්වල පවතින තාක්ෂණය හා දක්ෂතා, ප්‍රමාණවත් නොවන යටිතල පහසුකම් (උදා: වරායවල්, නැංගුරම්, අයිස් කර්මාන්තශාලා ආදිය), යෙදවුම්වල ඉහළ පිරිවැය, නවීන බෝට්ටු ආම්පන්න හා උපකරණවල හිඟකම සහ පිටරට නැව්වලින් අනවරසයෙන් මසුන් ඇල්ලීම වැනි විවිධ ප්‍රශ්න රාශියකට ධීවර අංශයට මුහුණදීමට සිදුවිය. මත්ස්‍ය කර්මාන්තය ඉතාමත් ප්‍රාග්ධන සුක්ෂම කර්මාන්තයක් වුවද, ඒ සඳහා වූ ප්‍රාග්ධන ගලා ඒම ප්‍රමාණවත් මට්ටමක නොපවතී. මසුන් අල්ලන බෝට්ටුවලින් සියයට 47 ක් පමණ යාන්ත්‍රික ඒවා වේ. ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශය මෙම ගැටලු විසඳීම සඳහා විවිධ නිෂ්පාදන සහනාධාර යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන අතර, 1996 වර්ෂයේදී මේවායෙහි විශාල ඉහළයාමක් දක්නට ලැබුණි. 1995 වර්ෂයේදී ධීවර අංශය සඳහා මුදාහරින ලද මුළු සහනාධාර ප්‍රමාණය වූ රුපියල් දශලක්ෂ 60 සමග සසඳා බලන කල 1996 වර්ෂයේදී එය සියයට 39 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 83 ක් විය. මුහුදු ධීවර අංශය සඳහා රුපියල් දශ ලක්ෂ 80 ක් ලබා දුන් අතර, ජල ජීවී ධීවර අංශය සඳහා රුපියල් දශලක්ෂ 3 ක් ලබාදුණි. නිෂ්පාදන සහනාධාර ක්‍රම යටතේ,

යාන්ත්‍රික එක්දින බෝට්ටු 202 ක්, බහු දින බෝට්ටු 53 ක්, සම්ප්‍රදායික යාත්‍රා 503 ක්, මෝටර් 54 ක්, ධීවර ආම්පන්න ඒකක 340 ක්, එස්. එස්. බී. ගුවන් විදුලි යන්ත්‍ර සහ චන්ද්‍රිකා ධාවන මාන වැනි අනෙකුත් උපකරණ 28 ක් මුහුදු ධීවර අංශය සඳහා නිකුත් කොට ඇත. 1995 වර්ෂයේදී යාන්ත්‍රික එක් දින බෝට්ටු 196 ක්, බහු දින බෝට්ටු 40 ක් සහ සම්ප්‍රදායික යාත්‍රා 333 ක් නිකුත් කොට ඇත. එසේ වුවද, 1995 වර්ෂයේදී නිකුත් කරන ලද ධීවර ආම්පන්න ඒකක ප්‍රමාණය සමග සසඳා බලන කල 1996 වර්ෂයේදී එය ඒකක 66 කින් අඩුවිය. 1996 වර්ෂයේදී ඉස්සන් වගාවට වැළඳුණ සුදු පුල්ලි රෝගය හේතුවෙන් පාඩු ලැබූ ඉස්සන් ගොවිපලවලට දෙන ලද බැංකු ණය ආපසු ගෙවීමට මාස 15 ක සහන කාලසීමාවක් ලබාදෙන ලදී. ධීවර සමුපකාර සමිති ණය දෙන ආයතන වශයෙන් මෙන්ම ධීවර ප්‍රජාව සඳහා රාජ්‍ය ආධාර සපයන මාධ්‍යයක් වශයෙන් ක්‍රියාත්මක වේ. 1996 වර්ෂය තුළදී මෙම සමිතිවලින් සියයට 30 ක් පමණ ක්‍රියාත්මක තත්ත්වයේ පැවැති අතර, ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ දිස්ත්‍රික් කාර්යාල මගින් රාජ්‍ය සහනාධාර බෙදා දෙන ලදී. කෙසේ වෙතත්, වර්ෂය තුළ, කාර්යක්‍ෂම ක්‍රියාකාරීත්වයක් ඇති කිරීමට ලියා පදිංචි කල ධීවර සමුපකාර සමිති 629 ක කටයුතු ප්‍රතිසංවිධානය කිරීමට ක්‍රියා කරන ලදී.

අලාභදායී තත්ත්වය හේතුවෙන් සීමාසහිත සී-නෝර් පදනම 1993 වර්ෂයේදී තම නැව් තොටුපල වසා දමන ලද අතර 1995 වර්ෂයේදී කුඩා ධීවර යාත්‍රා සහ එක්දින බෝට්ටු නිපදවමින් එහි කටයුතු නැවත ආරම්භ කරන ලදී. 1996 වර්ෂයේදී එය ඉහළ තත්ත්වයෙන් යුතු අමුද්‍රව්‍ය උපයෝගී කරගනිමින් (ජලය උරාගැනීම වලක්වන) නොකඩවා දින 15ක් මුහුදේ සිටිය හැකි වැඩි දියුණු කළ ගුණාංග වලින් සමන්විත බහුදින යාත්‍රා නිපදවීම මගින් සැහෙන වෙනසක් ඇති කරන ලදී. 1996 වර්ෂයේදී එක් බහු දින බෝට්ටුවක වැඩ නිම කල අතර, තවත් බෝට්ටු 4 ක වැඩ කටයුතු සිදුවෙමින් පැවතිණි. පෞද්ගලික අංශය සමග තරග කරමින්, ඉහළ තරගකාරී මිලකට මෙම බෝට්ටු විකිණීමට සී-නෝර් පදනමට හැකියාවක් ලැබුණි. සී-නෝර් පදනම යටතේ වූ මාළු දැල් නිපදවීමේ යන්ත්‍රාගාරයට, දැල් නිපදවන යන්ත්‍ර 2 ක් ආනයනය කිරීම මගින් එහි නිෂ්පාදනය වැඩිකර ගැනීමට හැකියාවක් ලැබුණි. 1996 වර්ෂයේදී මාළු ඇල්ලීමේ දැල් කිලෝ ග්‍රෑම් 184,000 ක ප්‍රමාණයක් නිෂ්පාදනය කරන ලදී.

1995 වර්ෂය සමග සසඳා බලන කල, සාලයා හැර (ඉතා කුඩා මාළු වර්ගයක්) අනිකුත් සියලුම මාළු වර්ගවල සාමාන්‍ය සිල්ලර මිල සියයට 6 කින් පමණ වැඩි විය. 1996 ඉහළම සාමාන්‍ය මිලක් වාර්තා වූ තෝරා (විශාල මාළු වර්ගයක්) කිලෝවක් රුපියල් 279 ක් වූ අතර, වාර්තා වූ අඩුම සාමාන්‍ය මිල වූයේ සාලයා කිලෝවක් සඳහා වූ රුපියල් 53 කි. 1996 වර්ෂයේදී ඉස්සන් කිලෝවක සිල්ලර මිල රුපියල් 141 ක් විය. අළුත් සහ ශීතකළ මත්ස්‍ය අපනයන ප්‍රමාණය සියයට 26 කින් වැඩි වී මෙට්‍රික් ටොන් 2,494 ක් වූ අතර අපනයන ඉපැයුම් දෙගුණයකට වඩා වැඩිවීමක් පෙන්නුම් කරමින් රුපියල් දශ ලක්ෂ 922 ක් විය. 1996 වර්ෂයේදී අපනයනය කරන ලද ඉස්සන් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 3,155 ක් වූ අතර, එයින් රුපියල් දශලක්ෂ 3,312 ක් උපයා ගන්නා ලදී. ආනයනය කරන ලද ටින් මාළු සහ ලුණු දැමූ මාළු ප්‍රමාණය පිළිවෙලින් සියයට 25 කින් සහ සියයට 2 කින් අඩු වී, මෙට්‍රික් ටොන් 15,208 ක් සහ මෙට්‍රික් ටොන් 43,865 ක් විය. එසේ වුව ද ආනයනය කරන ලද උම්බලකඩ ප්‍රමාණය සියයට 13 කින් වැඩි වී මෙට්‍රික් ටොන් 3,810 ක් විය.

## පශු නිෂ්පාදන

පශු නිෂ්පාදන අංශය මූලික වශයෙන් කිරි පට්ටි පාලනය සහ කුකුලන් ඇති කිරීමේ කර්මාන්තවලින් යුක්ත වූ කුඩා පරිමාණ අයිතිකරුවන්ගෙන් සමන්විත වේ. මෙම අංශයේ මුළු නිෂ්පාදනයට පශු සම්පත් සංවර්ධන මණ්ඩලයෙන් වන දයකත්වය ඉතාමත් සුළු වේ. කිරි නිෂ්පාදන අංශය ගත් කළ, කිරි සැපයුමෙන් සියයට 95 කටත් වඩා වැඩි ප්‍රමාණයක් සුළු පරිමාණ ගොවීන් විසින් සපයනු ලබයි. ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දත්තවලට අනුව, 1996 වර්ෂයේ එළ කිරි නිෂ්පාදනය සියයට 2 කින් පහත වැටී දළ වශයෙන් ලීටර් දශලක්‍ෂ 249 ක් වූ අතර මී දෙනුන්ගේ කිරි නිෂ්පාදනය සියයට 3 කින් වැඩිවී ලීටර් දශලක්‍ෂ 82 ක් විය. 1996 වර්ෂයේදී ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ගොවිපොළවල් මගින් නිපදවනු ලැබූ එළකිරි ප්‍රමාණය ලීටර් දශලක්ෂ 4.4 ක් පමණ වූ අතර එය 1995 වර්ෂයේ නිෂ්පාදනය සමග සසඳ බලන කළ සුළු වශයෙන් අඩුවීමකි. එසේම එම ගොවිපොළවල මී දෙනුන්ගේ කිරි නිෂ්පාදනය ද 1995 වර්ෂයේ නිෂ්පාදනය සමග සසඳ බලන කල සියයට 11 කින් පහත වැටී ලීටර් දශ ලක්‍ෂ 0.7 ක් පමණ විය.

1996 වර්ෂයේ විශාල කිරි නිෂ්පාදන සමාගම් වන සීමාසහිත ලංකා කිරි නිෂ්පාදන සමාගම (මිල්කෝ), නෙස්ලේ ලංකා සමාගම සහ ජාත්‍යන්තර කිරි නිෂ්පාදන සමාගම මෙන්ම අනෙකුත් කිරි නිෂ්පාදන ආයතන මගින් එකතු කරනු ලැබූ කිරි ප්‍රමාණය ලීටර් දශ ලක්‍ෂ 120 ක් පමණ වූ අතර එය 1995 වර්ෂයේ එකතු කිරීම් වලට වඩා සියයට 11 ක පමණ වැඩිවීමකි. මුළු කිරි එකතු කිරීම් වලින්, මිල්කෝ සමාගම ලබාගත් කොටස දළ වශයෙන් සියයට 45 ක් පමණ වූ අතර නෙස්ලේ ලංකා සමාගම හා ජාත්‍යන්තර කිරි නිෂ්පාදන සමාගම එකතු කරන ලැබූ කිරි ප්‍රමාණය සියයට 37 ක් පමණ වේ. කිරි මිලදී ගැනීමේ මිල ඉහළයාම, කිරි එකතු කිරීම් ඉහළයාමට හේතු වන්නට ඇත. 1996 ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක වන පරිදි කිරි මිලදී ගැනීමේ මිල ලීටරයකට රුපියල් 10.54 සිට ලීටරයකට රුපියල් 12.54 දක්වා ඉහළ නැගුණි. (සියයට 4.3 මේද සහිත හා සියයට 8.4 ක මේද නොවන ඝන කිරි සඳහා) 1996 පෙබරවාරි 1 දින සිට කිරි මිල තවදුරටත් ලීටරයක් ශත 9 කින් ඉහළ නැංවීමෙන් කිරි ලීටරයකට රුපියල් 12.63 ක් ගෙවන ලදී. මේ සියල්ල එක්ව ගත් කළ මිල ඉහළයාම සියයට 20 ක් පමණ විය. මෙය, කිරි නිෂ්පාදකයින්ට ලාභදායී මිලක් ලබාදීමෙහිලා ගනු ලැබූ යහපත් පියවරක් විය.කෙසේ වෙතත්, පාරිභෝගිකයන් ආරක්‍ෂා කිරීම සඳහා මිල්කෝ සමාගම මගින් කිරි මිල වැඩිවීම මුළුමනින්ම පාරිභෝගිකයා වෙත ලබා නොදෙන ලදී. එසේ වුව ද පාශ්චරීකරණය කරන ලද කිරි මිල, මිලි ලීටර් 500 බෝතලයක් රුපියල් 9.50 සිට රුපියල් 12.50 දක්වා ඉහළ නැංවුණි. ජීවාණු හරණය කරන ලද කිරි මිලි ලීටර් 500 ක බෝතලයක මිල ද රුපියල් 10.50 සිට රුපියල් 13.50 දක්වා ඉහළ නැගුණි. සම්පූර්ණ යොදය සහිත ග්‍රෑම් 400 කිරිපිටි පැකට් එකක මිලද රුපියල් 52.50 සිට රුපියල් 73.00 දක්වා ඉහළ නැගුණි. එහෙත් මිල්කෝ සමාගම විසින් පසුව එම මිල ගණන් අඩු කරමින් රුපියල් 65.00 ක් වශයෙන් පවත්වාගෙන යන ලදී. අනෙකුත් විශේෂිත නම් වලින් යුක්ත වූ සම්පූර්ණ යොදය සහිත කිරි පිටි ග්‍රෑම් 400 පැකට්ටුවක මිල රුපියල් 75.00 ට වඩා වැඩිව පැවතුනි. පාරිභෝගිකයන්ට සහනයක් සැලසීමේ අරමුණෙන් මෙන්ම දේශීය කිරි නිෂ්පාදකයන් ආරක්‍ෂා කිරීමේ අරමුණෙන්, 1995 දී මෙන්ම සම්පූර්ණ යොදය සහිත කිරිපිටි ආනයනය සඳහා වූ තීරු බද්ද, ඒ සඳහා අදාල සාමාන්‍ය තීරු බදු අනුපාතය වූ සියයට 20 වෙනුවට, සියයට 10 ක් ලෙස පවත්වාගෙන ගියේය.

1996 වර්ෂයේ ප්‍රථමභාගය තුළ විදුලිය කපා හැරීම හේතුවෙන් වෙළෙඳ පොළේ බෙදාහැරීමේදී ඇතිවූ අවහිරතා නිසා මිල්කෝ සමාගමේ පාශ්චරීකරණය කරන ලද කිරි, යෝගට් සහ අයිස් ක්‍රීම් නිෂ්පාදනය පහත වැටුණි. කෙසේ වුවද, එකතු කරනු ලැබූ කිරි, ශීතකරණ වල අවශ්‍යතාවයක් නොමැති ජීවාණුහරණය කරන ලද කිරි හා සම්පූර්ණ යොදය සහිත කිරි පිටි නිෂ්පාදනය සඳහා යොමු කරනු ලැබීය. එවැනි නිෂ්පාදන වල නිමැවුම ඉහළ නැගුණු අතර, සම්පූර්ණ යොදය සහිත කිරිපිටි නිෂ්පාදනය සියයට 27 ක වැඩිවීමක් වාර්තා කරන ලදී.

දේශීය කිරි එකතු කිරීම් මගින් දැනට සපුරා ගැනීමට හැකිවනුයේ රටෙහි කිරි හා කිරි නිෂ්පාදනය සඳහා වන ජාතික අවශ්‍යතාවයෙන් සියයට 30 ක් පමණි. ජනතාවට අවශ්‍ය අතිරේක පෝෂණයක් සපයනු ලබන හා විදේශ විනිමය ඉතිරියක්ද සිදුකරන කිරිවලින් ස්වයංපෝෂිතවීමට මෙරටට හැකියාව ඇත. මෙම ඉලක්කයන් ළඟා කර ගැනීමට වෙළෙඳ පොළ මත තීරණය වූ ප්‍රතිපත්තියක් සහතික කිරීමට අවශ්‍ය පියවර ගත යුතුවේ. එය නිෂ්පාදකයාට මෙන්ම පාරිභෝගිකයාට ද හිතකර වනු ඇත. මීට අමතරව, කාර්යක්ෂම ව්‍යාප්ති සේවාවක් හා පශුවෛද්‍ය සේවාවක් වැඩිදියුණු කිරීම, දේශීය ගවයන්ගේ තත්ත්වය ඉහළ නැංවීම, දැරිය හැකි මිල ගණන්වලට සත්ත්ව ආහාර ලබාගැනීමට ඉඩ සැලසීම, සත්ත්ව ආහාර වශයෙන් ස්වභාවික කෑම වර්ග සහ බෝගයන්ගෙන් ඉවත ලන ද්‍රව්‍ය (උදා. වී පිදුරු) උපයෝගී කර ගැනීම සහ වගාවන් හා පශු සම්පත් පාලන කටයුතු ඒකාබද්ධ කිරීම යන කරුණු පිළිබඳව සලකා බැලිය යුතුව ඇත. දේශීය ගවයන් හා මී හරකුන් විශාල ප්‍රමාණයක් සිටින වියළි කලාපයේ සහ මැද රට ප්‍රදේශයේ ඇති අත්හරින ලද තේ ඉඩම්වල කිරිපට්ටි සංවර්ධනය සඳහා ඇති විභවතාවයන් ප්‍රයෝජනයට ගැනීමේ හැකියාව ගැන සොයා බැලීම අවශ්‍යවේ. ශ්‍රී ලංකා රජය ඉන්දියාවේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ආධාරය ඇතිව කිරි නිෂ්පාදන යන්ත්‍රාගාරයක් පිහිටුවීම සඳහා බද්ධ ව්‍යාපාරයක් ඇතිකර ගන්නා ලදී. (සීමාසහිත කිරියා කිරි නිෂ්පාදන සමාගම) මෙහි ධාරිතාවය දිනකට කිරි ලීටර් 300,000 වන අතර එහි පිරිවැය රුපියල් දශලක්ෂ 680 ක් විය. ගව ආහාර යන්ත්‍රාගාරයේ පිරිවැය රුපියල් දශලක්ෂ 384 ක් විය.

පෞද්ගලික අංශය කුකුලන් ඇති කිරීමේ කර්මාන්තයේ ප්‍රධාන කාර්යය භාරයක් ඉටු කරයි. (බිත්තර සහ කුකුල් මස් නිෂ්පාදනය මෙන්ම බිත්තර රක්කවන මධ්‍යස්ථාන මගින් දිනක් වයසැති කුකුල් පැටවුන් සැපයීම) විශාල නිෂ්පාදකයන් සුළු ප්‍රමාණයක් විසින් සුළු නිෂ්පාදකයින් සමූහය අභිබවා වෙළෙඳපොළ පාලනය කිරීම මෙම කර්මාන්තයේ දැකිය හැකි ලක්ෂණයක් වේ. මෑත කාලයේදී, කුකුල් කෑම නිෂ්පාදකයන් කුකුලන් ආශ්‍රිත නිෂ්පාදනයන් කරන්නවුන් බවට පත්වීම හේතුවෙන් ඔවුහු අනෙක් නිෂ්පාදකයන්ට වඩා වාසිදායක තත්ත්වයක සිටිති. අසම තරගකාරී පරිසරයක් පවතින බැවින්, කුකුල් නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්තයේ ස්වයං රැකියා ව්‍යාපෘතිවල පැවැත්ම දුෂ්කර වී ඇත. දැනට බොහොමයක් කුඩා පරිමාණ ගොවීන්, විශාල නිෂ්පාදකයන් සඳහා බ්‍රොයිලර් කුකුලන් නිපදවීමට උප කොන්ත්‍රාත්තු ලබාගෙන ඇත. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ඇස්තමේන්තු කර ඇති පරිදි 1996 වර්ෂයේ මුළු බිත්තර නිෂ්පාදනය සුළු වශයෙන් පහත වැටී දශලක්ෂ 856 ක් විය. 1996 වර්ෂයේදී ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ගොවිපොළවල් මගින් නිපදවන ලද බිත්තර ප්‍රමාණය දශලක්ෂ 3 ක පමණ ප්‍රමාණයක් වූ අතර එය 1995 වර්ෂයේ නිෂ්පාදනයට වඩා සියයට 40 කට ආසන්න වැඩිවීමකි.

වර්ෂය තුළදී කුකුලන් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය මුහුණ දුන් ප්‍රධාන ගැටළුව වූයේ කුකුල් කෑම මිල ගණන් ඉහළයාමයි. වර්ෂයේ මුල් කාලය තුළදී කුකුලන් ආශ්‍රිත නිෂ්පාදනවල සිල්ලර මිල ගණන් පහත් මට්ටමක පැවතිද්දී කුකුලන් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ නිෂ්පාදන පිරිවැය වැඩිවීම කුඩා නිෂ්පාදකයන් ගණනාවකට නිෂ්පාදනයෙන් ඉවත්වීමට හේතුවිය. මෙම තත්ත්වය මගහරවා ගැනීමට හා මෙහි බලපෑමට ලක්වූ නිෂ්පාදකයන්ට සහනයක් ලබාදීමට, රජය විසින් 1996 අප්‍රේල් මස සිට බල පැවැත්වෙන පරිදි මාස 6 ක කාලයක් සඳහා තීරු බදු වලින් නිදහස්ව නිෂ්පාදනය කරන ලද කුකුල් කෑම ආනයනය කිරීමට අවසර දෙන ලදී. තවත් බහුජාතික සමාගමක් මගින් නිෂ්පාදන ආරම්භ කිරීමත් සමග දේශීය මධ්‍ය පරිමාණ සත්ත්ව ආහාර මෝල් හිමියන් සුළු ප්‍රමාණයට අමතරව සත්ත්ව ආහාර නිෂ්පාදන අංශයෙහි විශාල බහුජාතික නිෂ්පාදකයින් තුන් දෙනෙකු දක්නට ලැබුණි. 1996 වර්ෂය තුළදී සත්ත්ව ආහාර නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 306,000 ක් පමණ වූ බවට ඇස්තමේන්තු කර ඇත. මෙයින් සියයට 60 කටත් වඩා වැඩි ප්‍රමාණයක් වෙළෙඳපොළට ඉදිරිපත් කර ඇත්තේ එක් නිෂ්පාදකයෙක් විසිනි. සත්ත්ව ආහාර සඳහා තරගකාරී මිල කිරීම් ක්‍රමයකට ඉඩ සැලසීම සඳහා කර්මාන්තයට පුළුල් පදනමක් අත්‍යවශ්‍ය වේ.

## 3.6 යෙදවුම් සහ ණය

### පොහොර

1996 ලිත් වර්ෂය තුළදී භාවිතා කරන ලද පොහොර ප්‍රමාණය සියයට 3 කින් වැඩි වී මෙට්‍රික් ටොන් 524,000 ක් විය. වැවිලි බෝග තුන සඳහා පොහොර භාවිතය වැඩිවීම මෙන්ම උතුරේ දිස්ත්‍රික්කවල අස්ථාවර ආරක්ෂක තත්ත්වය නිසා නවතා තිබූ පොහොර අලෙවිය වසර 2 කට පසු නැවතත් ආරම්භ කිරීම, සමස්ත වර්ධනයට දායක විය.

තේ වගා අංශය සඳහා භාවිතා කරන ලද පොහොර ප්‍රමාණය සියයට 28 කින් වැඩිවී මෙට්‍රික් ටොන් 153,900 ක් ලෙස වාර්තා විය. මෙය 1966 න් පසු තේ වගා අංශයට යොදන ලද ඉහළම පොහොර ප්‍රමාණය වේ. පෝෂණ ද්‍රව්‍ය යෙදීම අතින් ගත් කළ ද මෙය තේ වගා අංශයෙහි මෙතෙක් වාර්තා වී ඇති ඉහළම මට්ටම වේ. 1995 අවසාන භාගයේ පටන් තේ සඳහා වැඩිමිලක් ලබා ගැනීමට හැකි වීම තේ වගා අංශයට යොදන ලද පොහොර ප්‍රමාණය විශාල ලෙස වැඩි කිරීමට දයක විය. පසුගිය වසරේ රබර් වගා අංශයට නිකුත් කරන ලද පොහොර ප්‍රමාණයෙහි සියයට 13 ක අඩුවීමක් දක්නට ලැබුණ ද, මෙම වසරේ රබර් සඳහා පැවැති යහපත් සහ ස්ථාවර මිල ගණන් ප්‍රධාන වශයෙන් හේතු කොට ගෙන භාවිතා කළ පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් 16,600 ක් දක්වා සියයට 11 ක වැඩිවීමක් පෙන්නුම් කළේය. පසුගිය වර්ෂයට වඩා සියයට 16 ක වර්ධනයක් පෙන්නුම් කරමින් පොල් වගා අංශයට නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් 39,100 ක් ලෙස වාර්තා විය. මෙය 1988 වර්ෂයේ සිට භාවිතා කරන ලද වැඩිම පොහොර ප්‍රමාණය වන අතර පොල් සඳහා ආකර්ෂණීය මිල ගණන් ලැබීම මේ සඳහා හේතු වන්නට ඇත.

**සංඛ්‍යා සටහන 3.9**

**බෝග අනුව පොහොර භාවිතය**

මෙට්‍රික් ටොන් දහස්


| බෝගය | 1994 | 1995(අ) | 1996(ආ) |
|---|---|---|---|
| වී | 269.7 | 256.8 | 237.5 |
| තේ | 126.4 | 120.3 | 153.9 |
| රබර් | 17.2 | 14.9 | 16.6 |
| පොල් | 31.2 | 33.6 | 39.1 |
| අනෙකුත් ක්ෂේත්‍ර බෝග | 40.6 | 39.7 | 54.9 |
| අනෙකුත් අපනයන බෝග | 5.6 | 5.2 | 6.1 |
| අනෙකුත් | 41.9 | 38.9 | 16.0 |
| එකතුව | 532.6 | 509.4 | 524.0 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය : ජාතික පොහොර ලේකම් කාර්යාලය

ලිත් වර්ෂ පදනම මත, වී වගා අංශය සඳහා භාවිතා කරන ලද පොහොර ප්‍රමාණයේ අඩුවීම දෙවන වසරටත් දක්නට ලැබුණි. 1996 වර්ෂයේ මෙම අඩුවීම සියයට 7 ක් විය. 1995 වර්ෂයේදී වී වගා අංශය සඳහා යොදන ලද පොහොර ප්‍රමාණය, මුළු පොහොර ප්‍රමාණයෙන් සියයට 50 කට වඩා වැඩි වුවද, 1996 වර්ෂය තුළදී, එය සියයට 45 දක්වා පහත වැටුණි. වගා වර්ෂ පදනම මත බැලුවද, පසුගිය වගා වර්ෂය සමග සසඳා බැලීමේදී වී වගා අංශයට නිකුත් කරනු ලැබූ පොහොර ප්‍රමාණයෙහි සියයට 18 ක විශාල අඩුවීමක් පෙන්නුම් කෙරුණි. මෙම අඩුවීම පසුගිය වර්ෂයේ අදාල කන්න සමග සසඳා බැලීමේදී 1995 / 96 මහ කන්නය තුළදී භාවිතා කරන ලද පොහොර ප්‍රමාණයෙහි සියයට 16 ක පමණ අඩුවීමේත්, 1996 යල කන්නය තුළදී භාවිතා කරන ලද පොහොර ප්‍රමාණය සියයට 21 ක අඩුවීමෙත් ප්‍රතිඵලයකි. වර්ෂය තුළ දක්නට ලැබුණු නියං කාලගුණික තත්ත්වයේ බලපෑම හේතුවෙන් වගා කන්න දෙක තුළදීම වී වපුරන ලද බිම් ප්‍රමාණයෙහි විශාල අඩුවීම මහ සහ යල යන දෙකන්නයෙහිම වී වගා අංශය තුළ භාවිතා කරන ලැබූ පොහොර ප්‍රමාණය අඩුවීමට හේතු වන්නට ඇත. පසුගිය වර්ෂය සමග සසඳා බැලීමේදී අන් තැනක සඳහන් නොකරන ලද වගා අංශයට (මෙයට දුම්කොළ සහ උයන් වගා අංශය ඇතුළත් වේ) නිකුත් කරන ලද පොහොර ප්‍රමාණයෙහි සියයට 59 ක අඩුවීමක් පෙන්විය.

රූප සටහන 3.6
ප්‍රධාන බෝග වර්ගවල පොහොර යෙදවුම්
(1990=100)




1996 වර්ෂය තුළදී ද පොහොර සහනාධාර යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කෙරුණු අතර රජය මේ සඳහා රුපියල් දශ ලක්ෂ 1,500 ක මුදල් ප්‍රමාණයක් වෙන් කරන ලදී. වර්ෂය තුළදී සහනාධාර ගෙවීම් කරනු ලබන පදනම සත්‍ය විකුණුම් වෙනුවට ආනයන කරනු ලැබූ තොගය මත වශයෙන් වෙනස් කරන ලදී. යූරියා පොහොරවල ජාත්‍යන්තර මිල ගණන් අඩුවීමට දැක්වූ ප්‍රතිචාරයක් වශයෙන් 1996 මැයි 27 දින සිට බලපැවැත්වෙන පරිදි යූරියා සඳහා වූ සහනාධාරය මෙට්‍රික් ටොන් එකකට ඇමෙරිකානු ඩොලර් 131 සිට මෙට්‍රික් ටොන් එකකට ඇමෙරිකානු ඩොලර් 106 දක්වා අඩු කරන ලදී. 1996 ජනවාරි 15 දින සිට ඉදිරියට බලපාන පරිදි සල්ෆේට් ඔෆ් ඇමෝනියා සඳහා දෙනු ලබන සහනාධාරය මෙට්‍රික් ටොන් එකකට ඇමෙරිකානු ඩොලර් 97 ක සිට මෙට්‍රික් ටොන් එකකට ඇමෙරිකානු ඩොලර් 29 දක්වා අඩු කරන ලදී. මියුරියේට් ඔෆ් පොටෑෂ් සහ ට්‍රිපල් සුපර් පොස්පේට් සඳහා වූ සහනාධාරය 1995 වර්ෂයේ පැවැති මට්ටමෙහිම නොවෙනස්ව පැවති අතර, පිළිවෙලින් මෙට්‍රික් ටොන් එකකට ඇමෙරිකානු ඩොලර් 19 ක් සහ මෙට්‍රික් ටොන් එකකට ඇමෙරිකානු ඩොලර් 59 ක් විය. ප්‍රධාන පොහොර අමුද්‍රව්‍ය වර්ග හතර සඳහා වූ විකුණුම් මිල 1996 වර්ෂය තුළදී සුළු වැඩිවීමක් පෙන්නුම් කළ අතර, යූරියා කිලෝ ග්‍රෑම් 50 ක බෑගයක මිල රුපියල් 500 ක සිට රුපියල් 550 දක්වා වැඩිවිය. 1996 වර්ෂය තුළදී, සල්ෆේට් ඔෆ් ඇමෝනියා කිලෝ ග්‍රෑම් 50 ක බෑගයක විකුණුම් මිල රුපියල් 375 සිට රුපියල් 460 ක පරාසයක් තුළද, ට්‍රිපල් සුපර් පොස්පේට් රුපියල් 600 සිට රුපියල් 640 ක පරාසයක් තුළ ද පැවතුන අතර මියුරියේට් ඔෆ් පොටෑස් මිල රුපියල් 500 සිට රුපියල් 562 දක්වා ඉහළ නැගුණි.

## බීජ

කෘෂි බෝග නිෂ්පාදනයේ වැදගත් යෙදවුමක් වන තත්ත්වයෙන් උසස් බීජ සමග එක්වුණු කාර්යක්ෂම කළමනාකරණය මගින් එලදාව සියයට 15 සිට 20 දක්වා ප්‍රමාණයකින් වැඩි කළ හැකි යැයි ඇස්තමේන්තු කර ඇත. ශ්‍රී ලංකාවේ බීජ නිෂ්පාදන කර්මාන්තය මූලික වශයෙන්ම සිදු කරනු ලබන්නේ රාජ්‍ය අංශය වන අතර, විදේශීය එළවළු බීජ ආනයනය සහ බෙදහැරීම පෞද්ගලික අංශය මගින් සිදුකරයි. සමහර පෞද්ගලික සමාගම් මගින් සමහරක් මූල්‍යමය වටිනාකමක් ඇති භෝග වල :කීය - බීජ නිෂ්පාදනයෙහි යෙදෙන අතර මෑතකදී සමුපකාර කීපයක් ද බිත්තර වී නිෂ්පාදනය ආරම්භ කරන ලදී. දැනට බීජ අලෙවිය මූලිකවම සිදු කෙරෙන්නේ පෞද්ගලික වෙළඳුන් මගිනි.

බීජ කර්මාන්තය කෙරෙහි රාජ්‍ය අංශයේ සහභාගිත්වය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් කරන අතර එමගින් වී, අනිකුත් ක්ෂේත්‍ර බෝග, එළවළු සහ පළතුරු ප්‍රභේද සංවර්ධන ක්‍රියාවලිය සිදුකරනු ලබයි. බෝග වර්ග 20 ට වැඩි ප්‍රමාණයක අදාල ප්‍රභේද 70 ක පමණ බීජ නිෂ්පාදනය සහ බෙදහැරීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරේ. බෝග වැඩි දියුණු කිරීම කෙරෙහි පෞද්ගලික අංශයේ දායකවීම ඉතා අඩු වුවත්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නිපදවන මූලික බීජ ප්‍රයෝජනයට ගනිමින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණික අධීක්ෂණය යටතේ, සහතික කළ බීජ නිෂ්පාදනය සිදු කෙරේ. ජාතික අවශ්‍යතාවය සමග සසඳන කල කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් සපයන බීජ සහ රෝපණ ද්‍රව්‍ය ප්‍රමාණය ඉතාමත් සුළු වේ. අර්තාපල් සහ මිරිස් හැරුණු විට, ගොවීන් විසින් තත්ත්වයෙන් උසස් බීජ භාවිතා කරනුයේ ඉතා සුළු වශයෙනි. දේශීය වශයෙන් නිපදවිය හැකි බෝංචි වැනි

බීජ ද ආනයනය කිරීම දැනට සිදුවේ. එම නිසා බීජ සහ රෝපණ ද්‍රව්‍ය පිළිබඳ නව ප්‍රතිපත්තියක් අනුමත කරන ලදී. මෙහි අරමුණ වන්නේ, ඵලදාව, නිෂ්පාදනය හා ගොවීන්ගේ ආදායම වැඩි කර ගැනීමට හැකිවන ලෙසින් බීජ සහ රෝපණ ද්‍රව්‍ය ගොවීන්ට හා ගෙවතු වගා හිමියන්ට සපයා දීමයි. මෙම ප්‍රතිපත්තිය මගින් පෞද්ගලික අංශයේ ක්‍රියාකාරී සහභාගිත්වයක් බලාපොරොත්තු වන අතර මෙය ශක්‍යතාවයකින් යුත් බීජ කර්මාන්තයක් ගොඩනැංවීමට ද මගපාදනු ඇත.

1996 වර්ෂය තුළදී ජාතික බීජ හා රෝපණ ද්‍රව්‍ය කමිටුවක් පිහිට වූ අතර මෙහි සභාපතිත්වය කෘෂිකර්ම ඉඩම් සහ වනසම්පත් අමාත්‍යාංශයේ ලේකම් හොබවන අතර පෞද්ගලික අංශයේ සහ අදාල අමාත්‍යාංශවල, දෙපාර්තමේන්තුවල සහ ආයතනවල නිලධාරීන්ගේ සහභාගිත්වයද බීජ හා රෝපණ ද්‍රව්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහිලා අපේක්ෂා කෙරේ. බීජ හා රෝපණ ද්‍රව්‍ය ප්‍රතිපත්ති ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම ජාතික බීජ හා රෝපණ ද්‍රව්‍ය කමිටුව මගින් පිළිගෙන ඇත.

ප්‍රභේද දියුණු කිරීම සහ මුද හැරීම, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් මූලික බීජ සහ රෝපණ ද්‍රව්‍ය ලබාදීම (පසු කාලීනව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිෂ්පාදන සහ බෙදහැරීම ක්‍රමයෙන් ඉවත් කිරීම සිදු කෙරේ). පෞද්ගලික අංශය විසින් වානිජ බීජ නිෂ්පාදනය, සැකසීම, අලෙවි කිරීම හා උපයෝජනය සහ ශාක නිරෝධායනයට සහ තත්ත්ව පාලනයට යටත්ව මෙන්ම දේශීය බීජ කර්මාන්තයට හානි සිදු නොවන ආකාරයට තත්ත්වයෙන් උසස් බීජ හා රෝපණ ද්‍රව්‍ය ආනයනය කිරීම යනාදිය බීජ හා රෝපණ ද්‍රව්‍ය ප්‍රතිපත්තියට අයත්වේ. මීට අමතරව, උසස් තත්ත්වයෙන් යුත් බීජ අලෙවිය සහතික කරනු වස්, සියලු බීජ සහ රෝපණ ද්‍රව්‍ය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීමේ සේවයේ අවම තත්ත්වයන්ට අනුකූල විය යුතුය. ජාතික බීජ හා රෝපණ ද්‍රව්‍ය කොමිටිය බීජ කර්මාන්තයේ සංවර්ධනය සඳහා උපකාරී වෙමින් කර්මාන්තය හා සම්බන්ධ රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ වැඩ කටයුතු සම්බන්ධීකරණ කටයුතු ද කරනු ඇත.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහ රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානයට අනුව 1996 වසරේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද බිත්තර වී ප්‍රමාණය සියයට 7 කින් පහළ වැටී මෙට්‍රික් ටොන් 3,680 ක් විය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ ගොවිපලවල් මගින් බිත්තර වී මෙට්‍රික් ටොන් 3,230 පමණ නිෂ්පාදනය කළ අතර, අනුමත කරන බීජ ගොවීන් විසින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙනුවෙන් බිත්තර වී මෙට්‍රික් ටොන් 1380 පමණ නිපදවන ලදී. ජාතික බිත්තර වී අවශ්‍යතාවයෙන් වැඩි ප්‍රමාණයක් (සියයට 96 ක් පමණ) ගොවීන් විසින්ම සපයා ගනු ලබයි. මිරිස් බීජ අවශ්‍යතාවන් සම්පූර්ණයෙන්ම පෞද්ගලික අංශය විසින් සපයනු ලබයි. පෞද්ගලික අංශයේ එළවළු බීජ නිෂ්පාදනය ක්‍රම ක්‍රමයෙන් වැඩිවීමත් සමග කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ නිෂ්පාදනය අඩුකර ඇත. 1996 වසර තුළදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ අර්තාපල් නිකුතුව සියයට 20 කින් පහත වැටී මෙට්‍රික් ටොන් 488 ක් විය.

1996 පෙබරවාරි මාසයේදී "අරුණළු" නම් වූ නව මිරිස් ප්‍රභේදයක් නිකුත් කරන ලදී. මෙය ගොවීන් සහ පාරිභෝගිකයින් අතර ජනප්‍රිය විය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් කරන ලද පර්යේෂණවල ප්‍රතිඵලයක් වශයෙන් මතු බලාපොරොත්තු තැබිය හැකි අතිකුත් ක්ෂේත්‍ර භෝග (කව්පි, සහ තෝර පරිප්පු) , එළවළු (තක්කාලි සහ දඹල) සහ පැපොල් ප්‍රභේදයන් වගා කිරීම සඳහා හඳුනාගෙන ඇත.

## කෘෂි රසායනික ද්‍රව්‍ය

පලිබෝධනාශක රෙජිස්ට්‍රාර්ගේ තාවකාලික ඇස්තමේන්තුවලට අනුව 1996 දී කෘමිනාශක, වල්නාශක සහ දිලීරනාශක ඇතුළත්වන මුළු කෘෂි රසායනික විකුණුම් ප්‍රමාණය, 1995 තාවකාලික දත්තයන්ට වඩා සියයට 10 කින් පහත වැටුණි. කෘමිනාශක විකුණුම් සියයට 16 ක අඩුවීමක් පෙන්වමින් මෙට්‍රික් ටොන් 2,390 ක් වූ අතර, වල්නාශක විකුණුම්ද සියයට 7 ක අඩුවීමක් පෙන්නුම් කරමින් මෙට්‍රික් ටොන් 2,828 ක් විය. මුළු කෘෂි රසායනික අලෙවියෙන් සියයට 14 ක් වූ දිලීරනාශක විකුණුම් ද සුළු වශයෙන් අඩුවී මෙට්‍රික් ටොන් 845 ක් විය.

වර්ෂය තුළ තිබූ නියඟ තත්ත්වයන් නිසා වගා කළ බිම් ප්‍රමාණය පහත වැටීම මෙන්ම ඒකාබද්ධ පලිබෝධනාශක කළමනාකරණ ක්‍රම වෙත දක්වනලද අවධාරණය ද කෘෂි රසායනික විකුණුම් පහත වැටීමට හේතු වන්නට ඇත. වසර තුළදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ඒකාබද්ධ පලිබෝධනාශක කළමනාකරණ ක්‍රම පුහුණු කිරීම් වස් දිස්ත්‍රික්ක 21 ක සහ මහවැලි කලාප 3 ක ගොවි ක්ෂේත්‍ර පුහුණු පාසල් පවත්වන ලදී. මීට අමතරව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ඒකාබද්ධ පලිබෝධනාශක කළමනාකරණ සංකල්පය පිළිබඳව යාය මට්ටමේ පැහැදිලි කිරීමේ ආදර්ශන 800 ට වඩා වැඩි ප්‍රමාණයක් උතුරු නැගෙනහිර පළාත්වල හැර සෑම "ගොවිජන කේන්ද්‍රයකම" පවත්වනු ලැබූ අතර එමගින් ගොවීන් 13,000 ට වඩා වැඩි ප්‍රමාණයකට ඒකාබද්ධ පලිබෝධනාශක පිළිබඳ අධ්‍යාපනයක් ලබාදෙන ලදී.

වර්ෂය තුළදී කෘෂි රසායනික ද්‍රව්‍ය ආනයනකරුවන් ප්‍රමාණය 17 දෙනකු දක්වා වැඩිවිය. පසුගිය වර්ෂයෙහි ආනයනකරුවන් 14 දෙනෙක් සිටියහ. පලිබෝධනාශක රෙජිස්ට්‍රාර් විසින් 1995 වසර තුළදී පලිබෝධනාශක වෙළෙන්දන් ලියාපදිංචි කිරීම ආරම්භ කරන ලදී. 1996 වසර තුළදී වෙළෙන්දන් 671 දෙනකු ලේඛන ගත කරන ලද අතර 1996 වසර අවසන් වන විට ලේඛන ගත කර තිබූ මුළු වෙළෙන්දන් සංඛ්‍යාව 1,345 ක් විය.

## ණය

නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමය (NCRCS) යටතේ වගා ණය දෙන ලද්දේ වසරකට සියයට 16 ක පොලී අනුපාතයක් යටතේය. 1994 වර්ෂයේදී මෙම ණය ක්‍රමය යටතේ, වානිජ බැංකුවලට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයන ලද ප්‍රතිමූල්‍ය පහසුකම් අත්හිටුවන ලදී. ඒ වෙනුවට වර්ෂයකට සියයට 7.5 ක පොලී සහනාධාරයක් රජය විසින් සපයනු ලබන අතර, වානිජ බැංකු තම අරමුදල් වලින් වගා ණය ලබා දෙනු ලැබේ. පසුගිය වසරේදී ලබාදුන් දශ ලක්ෂ 1,190 ක ණය මුදල් ප්‍රමාණය හා සසඳන කල එයින් අඩකට වඩා ශීඝ්‍ර ලෙස අඩුවෙමින් 1995 / 96 වගා වර්ෂය තුළ නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ ලබාදුන් ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 586 විය. වර්ෂය තුළ පැවති නියඟකාරී තත්ත්වය හෙතුවෙන් වගා කරන ලද බිම් ප්‍රමාණය අඩුවීම වර්ෂය තුළදී වගා කටයුතු සඳහා ලබාදුන් ණය ප්‍රමාණය අඩුවීමට හේතු වුවා විය හැකිය.

මුළු ණය ප්‍රමාණයෙන් සියයට 76 ක් හෙවත් රුපියල් දශ ලක්ෂ 445 ක් 1995/96 මහ කන්නය තුළදී ලබාදී ඇති අතර ඉතිරි රුපියල් දශලක්ෂ

141 ක ලබාදී ඇත්තේ යල කන්නය තුළදීය. මහ සහ යල යන කන්න දෙකෙහිදීම දුන් ණය ප්‍රමාණයන් පිළිවෙලින් සියයට 44 කින් සහ සියයට 64 කින් සැලකිය යුතු ලෙස අඩුවිය. දෙන ලද මුළු ණය ප්‍රමාණයෙන් තුනෙන් දෙකක ප්‍රමාණයක් හෙවත් රුපියල් දශ ලක්ෂ 396 ක්, පසුගිය වසරේදී මෙන්ම වී වගාව සඳහා ලබා දුන් අතර, ඉතිරිය වන රුපියල් දශ ලක්ෂ 190 ලබා දී ඇත්තේ අනෙකුත් ක්ෂේත්‍ර බෝග වගාවන් සඳහා වේ. 1996 දී ද, ලබාදී ඇති මුළු වගා ණය ප්‍රමාණයෙන් වැඩි ප්‍රමාණයක් එනම් සියයට 76 හෙවත් රුපියල් දශ ලක්ෂ 445 ක් රාජ්‍ය බැංකු දෙක විසින් ලබාදී ඇත.

ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු විසින් දුන් රුපියල් දශ ලක්ෂ 80 ක් වූ වගා ණය ප්‍රමාණය මුළු වගා ණය ප්‍රමාණයෙන් සියයට 14 ක් විය. ඉතිරි රුපියල් දශ ලක්ෂ 62 ප්‍රමාණය හැටන් නැෂනල් බැංකුව, සීමාසහිත ලංකා කොමර්ෂල් බැංකුව සහ සේලාන් බැංකුව යන දේශීය පෞද්ගලික බැංකු මගින් දෙන ලදී.

## 3.7 වන සම්පත්

වන වගා අංශය ඉඩම්වැනි භෞතික සම්පත් අතින්ද, කඩොලාන වල ඇති ජීවීන් ඇතුළු ජීව සම්පත් අතින්ද, ජල සැපයුම, පස, වන ජීවීන්, ජෛව ගෝලිය විවිධත්වය සහ වායු ගෝලිය දූෂණය සැහැල්ලු කිරීම වැනි පාරිසරික සම්පත් අතින්ද, දැව, දර, ඖෂධ වර්ග යනාදී දැව නිෂ්පාදන සැපයුම වැනි ආර්ථික සම්පත් අතින්ද වැදගත් තැනක් උසුලයි.

දැනට පවතින මුළු වනාන්තර ප්‍රමාණය හෙක්ටයාර දශලක්ෂ 2 ක් පමණ වන බවට හා 1996 වර්ෂයේදී දළ වශයෙන් හෙක්ටයාර 300 ක වනාන්තර ප්‍රමාණයක් විනාශ වී ඇති බව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඇස්තමේන්තු කර ඇත. මෙය 1995 දී විනාශ වූ වනාන්තර ප්‍රමාණය මෙන් තුන් ගුණයක් වන අතර, වන සම්පත් සඳහා වූ ඉල්ලුම වැඩිවීම මෙයට හේතු වූවා විය හැකිය. ඝන වනාන්තර යටතේ වූ බිම් ප්‍රමාණය (එනම් සියයට 70 කට වඩා වියනක් ලෙස වැසී පවතින වනාන්තර) සහ කඩොලාන යටතේ වූ බිම් ප්‍රමාණය පිළිවෙලින් හෙක්ටයාර දශලක්ෂ 1.58 ක් හා හෙක්ටයාර 8,680 ක් වශයෙන් 1995 වර්ෂයේ පැවැති මට්ටමේම නොවෙනස්ව පැවැතුණි. ප්‍රධාන වශයෙන් වන විනාශවීම් සිදුවී ඇත්තේ ලඳු කැලෑ අංශයේ වන අතර, ඒ හේතුවෙන් 1996 වර්ෂයේදී පැවැති ලඳු කැලෑ බිම් ප්‍රමාණය 1995 වර්ෂය හා සසඳන කළ හෙක්ටයාර 300 කින් පමණ අඩුවී හෙක්ටයාර 463,400 විය.

1996 දී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වන නීති උල්ලංඝනය කිරීම් 4,782 ක් වාර්තා කර ඇති අතර, එය සියයට 8 ක අඩුවීමක් පෙන්නුම් කරන ලදී. ඒ නමුත් එයට අයත් වූ දැව ඝන මීටර් 4,398 1995 දී වාර්තා වූ දැව ඝන මීටර් 2,725 ට වඩා සියයට 61 කින් ඉහළ යාමකි. ඒ අනුව වන නීති උල්ලංඝනය කිරීම් මත අල්ලා ගනු ලැබූ දැව වල වටිනාකම, 1995 දී වාර්තා වූ රුපියල් දශලක්ෂ 29 ට වඩා, සියයට 22 ක වැඩිවීමක් පෙන්නුම් කරමින්, 1996 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 36 ක් විය. මේවා ඉහළ වටිනාකම් ඇති දැව වලින් යුත් වනාන්තර විනාශ වී යන අනතුරුදායක අනුපාතනය පෙන්නුම් කරන නිල සංඛ්‍යා පමණි. සැලකිය යුතු ප්‍රමාණයක වන විනාශයක් හෙළිනොවන අයුරින් සිදුවේ.

**සංඛ්‍යා සටහන 3.10**

**වන සම්පත් අංශය පිළිබඳ සංඛ්‍යා**

| අයිතමය | ඒකකය | 1994 | 1995 | 1996 (අ) |
|---|---|---|---|---|
| 1. මුළු වනාන්තර ප්‍රමාණය (ආ) | හෙක්ටයාර දහස් | 2,047 | 2,046 | 2,046 |
| ඝන වනාන්තර | හෙක්ටයාර දහස් | 1,583 | 1,583 | 1,583 |
| ලඳු කැළෑ | හෙක්ටයාර දහස් | 464 | 464 | 463 |
| කඩොලාන | හෙක්ටයාර දහස් | 9 | 9 | 9 |
| 2. වන වනාන්තර බිම් ප්‍රමාණය (ඇ) | හෙක්ටයාර දහස් | 12 | 0.1 | 0.3 |
| 3. නැවත වන වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 7 | 10 | 13 |
| 4. වාර්තා වූ වන නීති උල්ලංඝනය කිරීම් | සංඛ්‍යාව | 4,749 | 5,200 | 4,782 |
| දැව ප්‍රමාණය | ඝන මීටර | 3,903 | 2,725 | 4,398 |
| දැව වටිනාකම | රුපියල් දශ ලක්ෂ | 35.7 | 29.3 | 35.8 |

(අ) තාවකාලික
(ආ) වන වගාකිරීම් ඇතුළත් නොවේ
(ඇ) ඇස්තමේන්තු කල

මූලය : වන සම්පත් දෙපාර්තමේන්තුව

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නැවත වන වගා කිරීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර ඇත. එමගින් වන විනාශය නිසා පරිසරයට වන අහිතකර බලපෑම් අවම කිරීමක් හා වැඩිවන ජනගහනය හා ආර්ථික කටයුතු වර්ධනය හේතුකොට ගෙන දර, දැව යනාදී දේ සඳහා ඇතිවන ඉල්ලුම් සපුරාලීමට විවිධ අවශ්‍යතාවන් සපයන ස්වභාවික වනාන්තර සහ වන වගා ඇති කිරීමක් බලාපොරොත්තු වේ. වන වගා කිරීමේ වැදගත්කම අවබෝධ කර ගැනීමෙහි ප්‍රතිඵලයක් වශයෙන්, නැවත වගා කරන ලද වනාන්තර ප්‍රමාණය 1995 වර්ෂයේදී හෙක්ටයාර 10,300 සිට 1996 වර්ෂයේදී හෙක්ටයාර 12,900 දක්වා වැඩි විය. වන වගා ව්‍යාපෘති කීපයකට විදේශ ආධාර ලබාගෙන ඇත. ප්‍රධාන ව්‍යාපෘති අතරින් එකක් වන ලෝක බැංකුවෙන් ආධාර ලබන වන ක්ෂේත්‍ර සංවර්ධන ව්‍යාපෘතියට 1996 දී රුපියල් දශලක්ෂ 136 වියදම් කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ හෙක්ටයාර 3,000 ක් නැවත වගා කරන ලද අතර, හෙක්ටයාර 17,406 ක් වන සහ වැව්ලි කළමනාකරණය යටතට ගෙන එන ලදී. තව ද තෙත් කලාපීය වනාන්තර තුනක් සඳහා ආරක්ෂිත කළමනාකරණ සැලසුම් සකසන අතර, වන සංරක්ෂණ ක්ෂේත්‍ර නිලධාරී නිල නිවාස දහයක් ද සාදන ලදී. ආසියානු සංවර්ධන බැංකුවෙන් ආධාර ලබන සහභාගිත්වය වන වගා ව්‍යාපෘතියේ මූලික අරමුණ වනුයේ, දර සහ සාමාන්‍යයෙන් පාවිච්චි කරන දැව සැපයුම් වැඩිකරවීමයි. 1996 දී මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් දශලක්ෂ 100 ක් පමණ වියදම් කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ, ගොවි පවුල් 76,789 කගේ සහභාගිත්වය ලබාගෙන හෙක්ටයාර 9,800 ක, ප්‍රධාන වශයෙන් ගෙවතු සහ වන ලැහැබ් ආශ්‍රිතව නැවත වන වගාව කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ දශලක්ෂ 7.8 කට වඩා වැඩි පැල සංඛ්‍යාවක් රෝපණය කරන ලදී. මෙම පැල විශේෂයෙන්ම ගෙවතුවල රෝපණය කිරීම සඳහා ගොවීන්ව දිරිගන්වන ලදී. රටතුළ ගොඩනැගිලි ඉදිකිරීම් හා කර්මාන්තශාලාවලට අවශ්‍ය ලී කඳන් සහ රටෙහි ජීවශක්ති පරිභෝජනයෙන් වැඩි ප්‍රමාණයක් ගෙවතු වලින් සහ අනෙකුත් කෘෂි ඉඩම්වලින් ලබාගන්නා බව ඇස්තමේන්තු කර ඇත.

වන ක්ෂේත්‍ර මහ සැලැස්ම යටතේ ඇති කරන ලද, වන වගාව ආශ්‍රිත නීති පැනවීමේ ජාතික කාර්ය බලකායට නියමව තිබූ කාර්යය 1996 වසරේදී සම්පූර්ණ කරන ලදී. ඉදිරි වසර 5 සඳහා ප්‍රමුඛස්ථානයක් ලබාදිය යුතු වැඩ පිළිවෙලවල් ජාතික වන වගා සැලසුම් යටතේ හඳුනාගෙන ඇත.